# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2018

සංවර්ධන උපායමාර්ග
හා
ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

# පටුන

පිටුව


1. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය 1

1.1 හැඳින්වීම 1
1.2 වගකීම් සහ කාර්යභාරය 1
1.3 ප්‍රධාන කාර්යයන් 1
1.4 ආයතන 2

2. ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනය 3

2.1 වෙළෙඳ ගැලපුම්කරණ වැඩසටහන 3
2.2 ජාතික අපනයන උපායමාර්ගය 4
2.3 ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව උපායමාර්ගය 2018 - 2022 5
2.4 ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය සංවර්ධනය 6

3. ආයෝජනය සඳහා පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය 8

3.1 ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය වැඩි දියුණු කිරීම සඳහා වන ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන 8
3.2 ආයෝජක පහසුකම් සැලසීම 11
3.2.1 අනාගත ආයෝජකයින් 11
➢ තනි කවුළු ආයෝජන පහසුකම් සැලසීමේ කාර්ය සාධක බලකාය (SWIFT) 11
3.2.2 දැනට සිටින ආයෝජකයින් 14
අ) ආයෝජක සංවාදය 14
▪ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජක සංවාදය 14
▪ ශ්‍රී ලංකාව, ජපාන රාජ්‍ය - පුද්ගලික සාකච්ඡා මණ්ඩපය 15
3.3 ආයෝජන ප්‍රවර්ධනය 15
➢ ප්‍රති - ආයෝජනය ප්‍රවර්ධනය සඳහා වන ක්‍රියාකාරී කණ්ඩායම 15
3.4 ආයෝජන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම 16
➢ නව කාර්මික කලාප 16
3.5 2018 තුළ ආයෝජන මණ්ඩලයේ කාර්ය සාධනය 18

4. වෙළඳ තරඟකාරිත්වය 21

4.1 ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ මූලාරම්භය 21
4.2 විස්තෘත වෙළඳ කටයුතු කෙරෙහි යොමු වීම 28
➢ ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම 30
➢ ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම 31
➢ චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 33
➢ ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම 34
➢ මැලේසියාව හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනය 35
➢ බංග්ලාදේශය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනය 35
4.3 ආර්ථික සහයෝගීතාවය 36
4.3.1 උපක්‍රමික හවුල්කරුවන් සමග ආර්ථික සහයෝගීතාවය 36
➢ චීනය සහ ශ්‍රී ලංකාව අතර ආයෝජන, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව 36
➢ හංගේරියා - ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතා ගිවිසුම 37
➢ ශ්‍රී ලංකා - දකුණු කොරියා ආර්ථික සහයෝගීතාව 37
➢ ශ්‍රී ලංකා - ඉන්දුනීසියා ආර්ථික සහයෝගීතාව 37
➢ ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර උපක්‍රමික ආර්ථික හවුල්කාරිත්වය 38
➢ ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමුව පිළිබඳ ගිවිසුම 38
➢ ආර්ථික ව්‍යාපෘති තුළින් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සහයෝගීතාව සඳහා වන අවබෝධතා ගිවිසුම 40
➢ ශ්‍රී ලංකාව සහ චෙක් ජනරජය අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව 41
➢ ජපාන - ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන කිරීමේ ඉදිරි සැලැස්ම 41
➢ යුරෝපා සංගමය සමග ආර්ථික සහයෝගීතාවය වර්ධනය 43

➢ යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය සහ අනෙකුත් වරණීය ක්‍රමයන්හි වර්ධනයන් (GSP+) 44
➢ යුරෝපා සංගම් වෙළෙඳපොළ තුළ GSP+ සහ වෙළෙඳ කාර්ය සාධනය 44
➢ ලෝක ආර්ථික සංසදය සමග සහයෝගීතාවය 45

4.4 දේශීය වෙළෙඳ ආරක්ෂණය 46
4.4.1සේවා ලිහිල්කරණය සඳහා නියාමන ක්‍රියාමාර්ග 46

5. **අපනයන ප්‍රවර්ධනය සහ අලෙවිකරණ සහය** 48

5.1 අපනයන වර්ධනය සඳහා සහය දැක්වීමට ක්‍රියාත්මක ව්‍යාපෘති 48
5.1.1බෝට්ටු නිෂ්පාදනය සඳහා වෙන් වූ කර්මාන්ත කලාප ඇති කිරීම 48
5.1.2වෙළඳපළ ප්‍රවේශය සඳහා සහාය ලබා දීමේ වැඩසටහන 49
5.1.3බහු ජාතික සහයෝගීතා වැඩසටහන 49
5.1.4තොරතුරු තාක්ෂණ මූලාරම්භය සිදු කිරීම 50
5.1.5වෙළඳ ප්‍රවර්ධන වේදිකාව (TPP) 50
5.2 අපනයන සංවර්ධන මණ්ඩලයේ නව ප්‍රවර්ධන උපායමාර්ගය 51
➢ ජාතික අපනයන උපායමාර්ගය 51
➢ නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය 51
➢ අපනයන විවිධාංගිකරණය 51
➢ ජාතික තත්ව යටිතල පහසුකම් 51
5.3 අපනයන කාර්ය සාධනය (2016 - 2018) 52

6. **සාමාන්‍ය පරිපාලනය** 55

6.1 අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 55
6.2 සංවිධාන ව්‍යුහය 56

**ඇමුණුම්** 58

ඇමුණුම් 1 අභ්‍යන්තර විගණන වාර්තාව 58
ඇමුණුම් 2 2018-01-01 සිට 2018-12-31 දක්වා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ - පත්‍රිකා 59
ඇමුණුම් 3 ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව (CCEM) වෙත ඉදිරිපත් කළ සටහන් 62

# 01. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

### දැක්ම

ශ්‍රී ලංකාව වසර 2020 වන විට කලාපයේ වඩාත් ආකර්ෂණීය ආයෝජන කේන්ද්‍රස්ථානය බවට පත්කිරීම සහ ගෝලීය වශයෙන් තරඟකාරී වෙළෙඳ රාජ්‍යයන් අතරට ප්‍රවිෂ්ඨ වීම

### මෙහෙවර

ශ්‍රී ලංකාව සතු ජාත්‍යන්තර වෙළෙඳාමෙහි ගෝලීය තරඟකාරීත්වය උපායමාර්ගිකව ප්‍රවර්ධනය කිරීම සඳහා නවෝත්පාදන හා ගුණාත්මක ආයෝජනයන් තුළින් අගය එකතු කළ භාණ්ඩ හා සේවා සැපයීම සහ වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කර ගැනීම.

### අමාත්‍යාංශය පිළිබඳ හැඳින්වීම

2018 දෙසැම්බර් 28 දිනැති අතිවිශේෂ ගැසට් දැන්වීම මගින්, රජයේ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාරව, ජාත්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ සංවර්ධන උපායමාර්ග හා කටයුතු සම්බන්ධ වගකීම මෙම අමාත්‍යාංශය වෙත පවරා ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය යටතට පත්කරන ලදී.

## 1.2 වගකීම් සහ කාර්යභාරය

සංවර්ධන උපායමාර්ගවලට සහ ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ විෂයයන් හා දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යටතට ගැනෙන එම ක්ෂේත්‍රයන්ට සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම්

- ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය
- ශ්‍රී ලංකාවේ ආර්ථික විභවය ප්‍රවර්ධනය කිරීම සහ එමගින් ඍජු විදේශ ආයෝජන සහ පුද්ගලික අංශ ආයෝජනය ප්‍රවර්ධනය කිරීම
- දේශීය නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳ අවස්ථාවන් පුළුල් කිරීම පිණිස උපායමාර්ගයන් සංවර්ධනය කිරීම
- ජාත්‍යන්තර වෙළෙඳ සම්බන්ධතා ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම
- කලාපීය ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය
- බහු පාර්ශ්වීය සහ ද්වි පාර්ශ්වීය ආර්ථික ගිවිසුම් සම්බන්ධ කරුණු
- ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය
- අපනයන විවිධාංගිකරණය, අපනයන සංවර්ධනය අංශ උපදේශන සේවාවන් දිරිගැන්වීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය මගින් සිදු කරන ප්‍රධාන කාර්යයන් පහත පරිදිය.

- ආයෝජන වාතාවරණය වැඩි දියුණු කිරීම රජයේ සංවර්ධන උපායමාර්ගයේ එක් වැදගත් සාධකයකි.
- අදාළ නියෝජිතායතන සමග සම්බන්ධීකරණය පවත්වාගනිමින් ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම් සාකච්ඡා කිරීම.
- රජයේ වෙළෙඳ ප්‍රතිසංස්කරණ මූලාරම්භයන් සමග ඊට අනුකූලව වෙළෙඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම සහ එය සම්බන්ධීකරණය කිරීම
- වෙළෙඳ සහ ආයෝජන ක්ෂේත්‍රවලට අදාළ ප්‍රතිසංස්කරණ මූලාරම්භයන් සඳහා මග පෙන්වීම
- අදාළ අමාත්‍යාංශ සහ නියෝජිතායතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව අවශ්‍ය ආයතනික ගැලපුම් සඳහා මූලිකත්වය ගැනීම

- 2022 වන විට ඇ.ඩො බිලියන 28 ක විදේශ විනිමයක් උපයාගැනීම සාක්ෂාත් කරගැනීම පිණිස ජාතික අපනයන උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම.

## අමාත්‍යාංශයට අදාළ නීති

- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය ( ආයෝජන මණ්ඩල නීතිය) (1978 අංක 4)
- 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනත
- 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන ) පනත
- අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් I සහ II තීරුව තුළ නිශ්චිතව දක්වා ඇති විෂයයන් හා වෙනත් අමාත්‍යවරයෙකුගේ කාර්ය භාරය යටතට නිශ්චිත වශයෙන් ගෙන නොමැති සියලුම වෙනත් නීතිකරණයන්.

# 1.4 ආයතන

- ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# 02. ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනය

## 2.1 වෙළඳ ගැලපුම්කරණ වැඩසටහන

2017 අගෝස්තු මස නව වෙළෙඳ ප්‍රතිපත්තිය (NTP) සම්බන්ධව ලැබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමග, ව්‍යාපාරික ආයතනවලට අපනයනය සහ දේශීය වෙළඳපොළ තුළ තරග කිරීමට හිතකර වාතාවරණයක් ඇති කරමින් ආර්ථික වර්ධනය සහ රැකියා උත්පාදනය දිරිමත් කිරීමට ශ්‍රී ලංකා රජය කැප වෙන ලදී. මෙම නව වෙළඳ ප්‍රතිපත්තියේ කොටසක් ලෙස, කලක් තිස්සේ අත්‍යාවශ්‍යව පැවති වඩා වැඩි වෙළඳ ලිහිල්කරණයකට රට පිවිස ඇත. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය දේශාන්තර බදු දැනට ආසියාව තුළ අපගේ තරඟකාරී රටවල්වල වඩා තුන් ගුණයකින් පමණ ඉහළ වන අතර, එය ආයෝජන ආකර්ෂණයට අභියෝගයක් වී ඇති අතර, ශ්‍රී ලංකා අපනයන ව්‍යාපාරයන් ගෝලීය සැපයුම් දාමයන් වෙත ප්‍රවිශ්‍ය වීම මන්දගාමී කිරීමට සහ පාරිභෝගික සුබසාධනය අඩු කිරීමටද හේතු වී ඇත. ශ්‍රී ලංකාව වෙළඳ ලිහිල්කරණය වෙත යොමු වීමේදී, අමතර බදු කපා හැරීම වැනි ඒක පාර්ශවීය ක්‍රියාමාර්ගයන් තුළින් හෝ නිදහස් වෙළඳ ගිවිසුම් ඔස්සේ ද්විපාර්ශවික බදු අඩු කිරීම මගින්, අයහපත් බලපෑම් වලට ලක්වන්නන්ගේ ප්‍රතිරෝධයන් සුපරික්ෂාකාරිව කළමනාකරණය කිරීම සහ ව්‍යාපාරික ආයතනයන්ගේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සහ සේවකයන්ගේ සුබසාධනය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා රජය විසින් "වෙළඳ ගැලපුම් වැඩසටහන" හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. "වෙළඳ ගැලපුම් වැඩසටහනේ" මූලික අරමුණ වනුයේ වෙළෙඳ ලිහිල්කරණය විසින් ඇති කරන නව වෙළඳපොළ තත්වයන් වෙත ව්‍යාපාරික ආයතන සහ සේවකයන් අනුගත වීම වඩා පහසු කරලීම වේ.

විශාල ශ්‍රමයක් අවශ්‍ය කරන අංශ ගණනාවක් ඉහළ ආරක්ෂණයකට මුහුණ දෙන අතර වෙළෙඳ ලිහිල්කරණය සමග සිදුවෙන ජාත්‍යන්තර තරඟකාරීත්වයේ වැඩි වීම එවැනි ව්‍යාපාරික ආයතන සහ රැකියා කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. සමස්තයක් ලෙස රටට ප්‍රතිලාභ අත්කර දෙනු ලබන වෙළඳ ප්‍රතිසංස්කරණ මගින් අයහපත් බලපෑමට ලක්විය හැකි ව්‍යාපාරික ආයතන හා සේවකයන් වෙළඳ ප්‍රතිසංස්කරණ උදෙසා හැඩගැසීමට වැයවන පිරිවැය අවම කරමින් බලපෑමට ලක්වන විවිධ කණ්ඩායම් වල ප්‍රතිරෝධයන් වැළැක්වීම වැනි අරමුණු සාක්ෂාත් කරගැනීමට මෙම "වෙළඳ ගැලපුම් වැඩසටහන" උපකාරී වනු ඇත.

වෙළඳ ගැලපුම් වැඩසටහන සඳහා සවිස්තරාත්මක සැලසුමක් හඳුන්වාදීමට සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මාස 6 ක් පුරා ප්‍රයත්න දරනු ලැබීය. ශ්‍රී ලංකාව සඳහා වන වෙළඳ ගැලපුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කෙටුම්පත, කර්මාන්ත සංගම් /මණ්ඩල සහ රාජ්‍ය අංශයේ අදාළ ආයතන සහිත පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම් සාකච්ඡා වට 5 ක් හරහා සිදු කරන ලදී . වෙළඳ ගැලපුම් වැඩසටහනේ කෙටුම්පත මහජන අදහස් උදෙසා අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරන ලදී. මේ සඳහා ඉදිරිපත් වන අදහස් සලකා බලා අවසන් කෙටුම්පත සංවර්ධනය කෙරෙනු ඇති

තවද, වෙළඳ ගැලපුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ රාමු කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ මගින් මතුකළ කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරමින් යෝජිත වෙළඳ ගැලපුම් වැඩසටහන සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශයට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය, වාණිජ මණ්ඩල සහ කර්මාන්ත සංවිධාන සහ වෙනත් සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ ඇතුළත් කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කෙරෙනු ඇත.

ගරු මුදල් අමාත්‍යවරයා විසින් සිදු කළ නිරීක්ෂණවලට අනුව, ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වෙළඳ සහ එලදායිතා කොමිසම (TPC) ක්‍රියාත්මක කළ හැකි කාලසීමා ඉලක්ක සහිත ක්‍රියාකාරි සැලසුමක් සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ.

වෙළඳ සහ ඵලදායිතා කොමිසම (TPC) වෙළඳ ලිහිල්කරණය සමගම වෙළඳ ගැලපුම්කරණ වැඩසටහන විශ්ලේෂණය කරන ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කරනු ඇති අතර එමගින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සාක්ෂි පරීක්ෂා කිරීම, තීරුබදු මන්දගාමී කිරීමේ කර්මාන්ත ඉල්ලීම් පරීක්ෂා කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම, බලපෑම්ලත් අංශවල ඵලදායිතා සංරෝධකයන් සඳහා විසඳුම් ලබාදීමට පිහිටුවනු ලබන කර්මාන්ත තරගකාරීත්ව කවුන්සිල (ICCS) මගින් ලබාදෙන නිර්දේශ අධීක්ෂණය කිරීම සහ අදාල ක්‍රියාමාර්ගයන් සඳහා මුදල් අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම යනාදිය සිදු කෙරෙනු ඇත. වෙළඳ සහ ඵලදායිතා කොමිසම, සුදුසුකම්ලත් වෘත්තිකයින් ඇතුළත් ලේකම් කාර්යාලයක් මගින් සහය ලබන ස්වාධීන කොමසාරිස්වරුන්ගෙන් සමන්විත වෙනු ඇත.

ඒ අනුව ආර්ථික ලිහිල්කරණ වැඩසටහන පූරණය කිරීම පිණිස වෙළඳ ගැලපුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් වෙළඳ සහ ඵලදායිතා කොමිසම (TPC) සඳහා නාම යෝජනා ගරු මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇත.

අවසන් වෙළඳ ගැලපුම් වැඩසටහන 2019 වසර මුල් කාර්තුවේදී නිම කෙරෙනු ඇත.

## 2.2 ජාතික අපනයන උපායමාර්ගය (NES)

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳාම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය සමඟ ක්‍රියාත්මක කරන ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියකි, ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව සියලුම පාර්ශ්වකරුවන් සමඟ එක්ව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මේ වනවිට වේගයෙන් වර්ධනය වන ආසියානු අපනයන රටවල් සමඟ සමගාමීව වර්ධනය වීමට එමගින් ශ්‍රී ලංකාවට අවස්ථාව ලැබී ඇත.

ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම යනු විස්තීර්ණ සහ සැලකිලිමත්ව ව්‍යුහගත කරන ලද පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් වන අතර, එමගින් අපනයන ප්‍රවර්ධනය කිරීමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුළු ශ්‍රී ලංකා අපනයනකරුවන්ට වැඩි ආදායමක් ලබා ගැනීමටත් පැහැදිලි මඟපෙන්වීමක් සිදුකරයි. මෙම ප්‍රයත්නය ක්‍රියාවට නැංවීම මගින් 2022 වසරේදී ශ්‍රී ලංකා අපනයන ආදායම ඇඩො බිලියන 28 ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

- තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරනය
- කුළුබඩු සහ සාන්ද්‍රික නිෂ්පාදන
- සුවතා සංචාරක කර්මාන්තය
- සැකසූ ආහාර සහ පාන වර්ග
- බෝට්ටු කර්මාන්තය
- විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික අංගෝපාංග

ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම ශ්‍රී ලාංකීය ව්‍යාපාරවලට අදාළ ව්‍යාපාරික පරිසරය වැඩි දියුණු කරනු ඇත. නැගී එන අංශ ශක්තිමත් කිරීම මගින් විවිධාංගිකරණය සක්‍රිය කිරීමට අවශ්‍ය තත්වයන් ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම සපයනු ලබයි. ශ්‍රී ලංකාවේ සියලුම අපනයන කර්මාන්ත, ප්‍රධාන වෙළෙඳ ආධාරක කාර්යයන් වැඩි දියුණු කිරීම මගින් ප්‍රතිලාභ ලබනු ඇත. මෙයට ඇතුළත් වන්නේ,

- කාර්ය උපාය සේවා
- ජාතික ගුණාත්මක යටිතල පහසුකම්
- නවෝත්පාදනයන් සහ ව්‍යවසායකත්වය
- වෙළෙඳ තොරතුරු සහ ප්‍රවර්ධනය




ජාතික අපනයන උපායමාර්ගය, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා සහ 2025 දැක්ම වැනි වෙනත් ජාතික මූලාරම්භයන් සමග හොඳින් ගැලපුණු අනුපූරක සහිතව ක්‍රියාත්මක වේ. ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මේ ගැලපුණු අනුපූරක ප්‍රමුඛතා අංශ තෝරාගෙන ඇත්තේ විවිධ වර්ධන ප්‍රවණතා සහිත වඩා හොඳ කර්මාන්ත මුසුවක් සපයන අනාගත දැක්මක් සහිත, නැගී එන සහ පරිණත අංශ වෙතින් තුලිත අපනයන පුළුල් කිරීමක් සහතික කරයි. ඒ අතරම ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මේ වසර 05 ක ක්‍රියාත්මක කාලසීමාව තුළ අපනයන විවිධාංගිකරණය කිරීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරයි. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු භාවිතා කරගනිමින්, ජාතික පාර්ශ්වකරුවන් පහත කර්මාන්ත අංශ අවධානයට ලක්කර ඇත.

ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම විසින් නව ව්‍යාපාර බිහිවීමට දිරිදෙනු ලබන අතරම සාම්ප්‍රදායික අපනයන කර්මාන්ත වර්ධනයට සහය දෙනු ලැබේ. ඉහළ තාක්ෂණයේ වර්ධනයට සහ පිරිවැය වෙනස්වීම්වලට අඩු වශයෙන් අවදානමක් දරන දැනුම් පදනම් කරගත් අපනයනයන් සඳහා පසුබිම් සැකසෙනු පිණිස ශ්‍රී ලංකාවේ අපනයනයන්ගේ ශීඝ්‍ර වර්ධනයට බාධා කරන ප්‍රධාන පද්ධතිමය ගැටළු නිවැරදි කෙරෙනු ඇත.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ස්ථාපිත කළ උපදේශන කමිටු දැනටමත් ක්‍රියාත්මක වන අතර සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික අපනයන උපායමාර්ගික කළමනාකරණ ඒකකය මගින් එහි සම්බන්ධීකරණය, පසු විපරම් කිරීම සහ අධීක්ෂණය කරගෙන යනු ලැබේ

ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම වෙළෙඳ පරිසරය ශක්තිමත් කරන අතර ශ්‍රී ලාංකිකයන් මිලියන ගණනකගේ ජීවනෝපායයන් වැඩි කිරීමේ අරමුණ සහිත තිරසර වර්ධනයක් සහිත යුගයක් කරා ගමන් කිරීමේ හැකියාව වැඩි කරයි. ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම ආසියාව හා ලොවට සේවය සපයන නවීන, නවෝත්පාදක සහ ගතික වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ඉන්දීය සාගරය තුළ නිසි ලෙස ස්ථානගත කරයි.






ජාතික අපනයන ක්‍රමෝපාය (NES) 2018-2020

## 2.3 ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව උපායමාර්ගය 2018- 2022 Innovation & Entreprenurship (I & E) Strategy 2018 - 2022

### දැක්ම

සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම: අපනයන තරගකාරීත්වය සහිත ප්‍රත්‍යාස්ථ සහ නවෝත්පාදක ආර්ථිකයක් සහ වඩා යහපත් රැකියාවන් සමග ව්‍යවසායක සමාජයක් ගොඩනැංවීම.

### මෙහෙවර

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තරගකාරීත්වය ඉහළ දැමීමට අවශ්‍ය සහය ලබාදෙමින් අංකුර ව්‍යවසායකයින්ගේ වර්ධනය දිරිමත් කරමින්, රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන අංශය පෞද්ගලික අංශයේ අවශ්‍යතා හා අනුකූල කිරීම.




ශ්‍රී ලංකාව සඳහා නවෝත්පාදක සහ ව්‍යවසායකත්ව උපායමාර්ගය (2018-2022) සංවර්ධනය කිරීමට 2017.07.11 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් නියෝග ප්‍රකාරව, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ පාර්ශවකරුවන් සමඟ එක්ව සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය ලෝක බැංකු කණ්ඩායමේ තාක්ෂණික සහය ඇතිව ශ්‍රී ලංකාව සඳහා ජාතික නවෝත්පාදක සහ ව්‍යවසායකත්ව උපායමාර්ගයක් සම්පාදනය කරන ලදී.

නවෝත්පාදන හා ව්‍යවසායකත්ව උපායමාර්ගය පිළිබඳ ලේඛනය පසුගිය වසර පුරාවට පුළුල් රාජ්‍ය සහ පුද්ගලික අංශයේ උපදේශනය සහිතව සංවර්ධනය කරනු ලැබූ අතර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් පත් කළ ක්‍රියාකාරී කණ්ඩායමක් වෙතින් (ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ පුද්ගලික අංශ නියමුවන්ගෙන් සමන්විත) මාර්ගෝපදේශය ලැබීය. උපායමාර්ගය සම්පාදනය කිරීමට පෙර (2015-16) නවෝත්පාදන හා ව්‍යවසායකත්ව නිශ්චයනයක් ද සිදු කරන ලදී.

### ප්‍රගතිය

- පාර්ශ්වකරුවන්ගේ අදහස් පුළුල් වශයෙන් ලබාගන්නා ලදී.
- ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව උපායමාර්ගය (2018-2022) සම්පාදනය කෙරිණි.
- 2018 සැප්තැම්බර් මාසයේදී ව්‍යාපාර නවෝත්පාදන වැඩසටහනී සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.
- බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්තිය දියත් කිරීමට සූදානම් කර ඇති අතර එය I&E උපායමාර්ගය සමග අනුකූල වේ.

### මීළඟ පියවරයන්

- වර්තමානයේ පවතින නවෝත්පාදන හා ව්‍යවසායකත්ව ක්‍රියාකාරී කණ්ඩායම ජාතික මෙහෙයුම් කමිටුවක් ලෙසට වෙනස් කෙරෙනු ඇත.
- අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සමග එක්ව විස්තරාත්මක උපායමාර්ග ක්‍රියාකාරී සැලසුමක් සංවර්ධනය කෙරෙනු ඇත.

## 2.4 ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය සංවර්ධනය

### අරමුණු

කොටස් තුනක් සහිත ක්‍රියාත්මක රාමුවට පහත අංගයන් ඇතුළත් වේ.

- ආර්ථිකයේ ප්‍රමුඛ අංග ඩිජිටල්කරණය කිරීම (ඉල්ලුම)
- ඩිජිටල් අංශවල වර්ධනය සහ සංවර්ධනය කඩිනම් කිරීම (සැපයුම)
- ශක්තිමත් ඵලදායී යටිතල පහසුකම් ගොඩනැගීම (ප්‍රධාන බලදායකයන්)

### අපේක්ෂිත ප්‍රතිඵලය

දේශීය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ/ඩිජිටල් අංශ සංවර්ධනය කිරීම සහ ශක්තිමත් ඵලදායී පරිසරයක් නිර්මාණය කිරීම තුළින් 2025 වන විට රුපියල් බිලියන 660-980 ක සමුච්චිත ආර්ථික නිමැවුමක් නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට 2-3 % ක් පමණ එක් කළ හැකි වෙනු ඇත.

**ඩිජිටල් ලෙස ඵලදායී කරන ලද නිදහස් වෙළෙඳ කලාපය සහ "කාර්ය සම්පාදන ගම්මාන"**

මෙමගින් 2025 වන විට රුපියල් බිලියන 417 ක ආර්ථික වටිනාකමක් නිර්මාණය කිරීමට සහ අපනයනයන් තුළ රුපියල් බිලියන 311 ක් උත්පාදනය කිරීමටත් රැකියා 180,000 ක් ඇති කිරීමටත් අපේක්ෂිතය.

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය පුළුල් කිරීම සහ එහි ඵල ලබාගැනීම සඳහා සෑම දෙනාම බලගැන්වීම රජයේ දැක්ම තුළ ඉදිරියෙන්ම ඇති අපේක්ෂාවකි. එමගින්, අමාත්‍ය මණ්ඩලයේ විධානයට අනුව මැකින්සි සහ සමාගමේ සහය ඇතිව විදුලි සංදේශන සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය "ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය සංවර්ධනය" සඳහා මූලාරම්භය සපයා ඇත.

ඉහත අමාත්‍යාංශ දෙකෙහි සහ වෙනත් අදාළ පාර්ශවකාර සංවිධානවල අදහස් ලබාගනිමින් මැකින්සි සහ සමාගම ඩිජිටල් ආර්ථික උපායමාර්ගික රාමුවක් කෙටුම්පත් කර ඇත. මෙම උපායමාර්ගය ප්‍රමුඛතා අංශ තුනක් (03) වෙත කේන්ද්‍ර වේ: නිෂ්පාදනය; කෘෂිකර්මය; සහ සංචාරක ව්‍යාපාරය. ඩිජිටල් ආර්ථික උපායමාර්ගය, ක්‍රියාත්මක කිරීම මත පදනම් වන එළඹුමක් වන අතර ඩිජිටල් අංශ සහ ඵලදායී යටිතල පහසුකම් ඉලක්ක කරගනිමින් වසර තුනකදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතව ඉහත එක් එක් ප්‍රමුඛතා අංශ සහ ප්‍රමුඛතා ව්‍යාපෘති 10 ක් සඳහා ප්‍රධාන වැඩසටහන් තුනක් ඇත.

ඩිජිටල් ලෙස ඵලදායී කරන ලද නිදහස් වෙළෙඳ කලාපය සහ "කාර්ය සම්පාදන ගම්මාන" නව තාක්ෂණයන්ගෙන් බලගැන්වෙන, "කාර්ය සම්පාදන ගම්මාන" වෙතින් වර්ධනය කෙරෙන රට පුරා ස්ථාපිත කළ ඩිජිටල් ලෙස ඵලදායී නිදහස් වෙළෙඳ කලාප, සෑම ප්‍රමාණයේම නිෂ්පාදකයන් ලෝක වෙළෙඳපොළ වෙත සම්බන්ධ කර සීඝ්‍ර අගයන් ලබාගනු ඇත. සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය සහ කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ හිමිකාරීත්වය ලබාගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක් සකස් කරනු ඇත. මෙම මූලාරම්භය සඳහ වන ඉහළ මට්ටමේ පිරිවැය වසර 3 ක් සඳහා වන ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 3.5 ක් ලෙසත්, වසර 7 කට නියමිත මෙහෙයුම් වියදම් රුපියල් බිලියන 1.2 ක් ලෙසත් තක්සේරු කර ඇත.

## ප්‍රගතිය

- පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම් පවත්වා ඇත.
- ඩිජිටල් ආර්ථික උපායමාර්ගය සම්පාදනය කර ඇත.
- ඩිජිටල් ලෙස එලදායී නිදහස් වෙළෙඳ කලාප සහ "කාර්ය සම්පාදන ගම්මාන" ඇතුළු ප්‍රධාන වැඩසටහන් 3ක් හඳුනාගෙන ඇති අතර මූලික සාකච්ඡා පවත්වනු ලැබිණි.
- ඩිජිටල් ආර්ථික උපායමාර්ගයේ සැලසුම් පිටපත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

## මීළඟ පියවරයන්

- ඩිජිටල් ආර්ථිකය උපායමාර්ගය දියත් කිරීම
- ඩිජිටල් ආර්ථිකය උපායමාර්ගය මෙහෙයවීම සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් ස්ථාපිත කිරීම
- රාජ්‍ය සහ පුද්ගලික අංශය විසින් සම සභාපතිත්වය දරන ප්‍රධාන ව්‍යාපෘති සඳහා මෙහෙයුම් කමිටුවක් පිහිටුවීම
- එක් එක් ප්‍රධාන ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය ව්‍යාපෘති නායකයෙක් සහ ක්‍රියාත්මක කණ්ඩායමකින් සමන්විත ව්‍යාපෘති කණ්ඩායමක් ස්ථාපිත කිරීම

# 03. ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම ප්‍රවර්ධනය

## 3.1 ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය වැඩි දියුණු කිරීම සඳහා වන ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය (MoDSIT) 2017 සිට ඉදිරියට යමින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසුකරණ දර්ශකය (EoDBI) වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ඇති කාර්ය සාධක බලකා අට සමග 2017 දී හඳුනාගත් "ඉක්මන් දිනුම්" ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන ලදී. 2017 අමාත්‍ය මණ්ඩලය විසින් නියෝගයන් අනුව, ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ඉදිකිරීම් බලපත්‍ර සමග කටයුතු කිරීම, දේපළ ලියාපදිංචි කිරීම, ණය ගැනීම, දේශ සීමා හරහා වෙළෙඳ කටයුතු සිදු කිරීම, සුළුතර ආයෝජකයින් ආරක්ෂා කිරීම, ගිවිසුම් බලාත්මක කිරීම සහ බුන්වත් බව නිරාකරණය කිරීම යන කාර්ය සාධක බලකායන් අට තම ඉලක්ක සපුරා ගැනීම සඳහා වෙහෙස විය. "ව්‍යාපාර කිරීමේ පහසු බව ශ්‍රේණිගත කිරීම - 2019" තුළ 111 වන ස්ථානයේ සිට 100 වන ස්ථානය වෙත ඉහළට ගමන් කළ මෙම වසර ශ්‍රී ලංකාව සඳහා වැදගත් වසරක් විය. ව්‍යාපාර කිරීමේ පහසු බව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය-2019 මගින් වාර්තා කරන ආකාරයට ලෝක බැංකු ඇගයීමේ කණ්ඩායම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රතිසංස්කරණ හතරක් හඳුනාගෙන ඇත.

2018 වසර තුළ මෙම කාර්ය සාධක බලකායන් විසින් වැදගත් ඉලක්ක සමහරක් සාක්ෂාත් කරගන්නා ලදී. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ කාර්ය සාධක බලකායේ සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 2018.04.02 දින සිට ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංක නිකුත් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කරන ලදී. (e-ROC ව්‍යාපෘතිය) දේපළ ලියාපදිංචි කිරීමේ කාර්ය සාධක බලකායේ කොළඹ මහනගර සභාව (CMC) විසින් 2018.03.03 සිට හිමිකාරීත්වය, නොපවරා ගැනීමේ සහතික සහ වීථි රේඛා සහතික දින 3 කින් නිකුත් කිරීම සඳහා තනි කවුළු කවුන්ටරයක් හඳුන්වා දෙන ලදී. තනි කවුලු කවුන්ටරය පුළුල් කරමින් කොළඹ මහ නගර සභාව 2018.04.27 දින සිට ඉදිකිරීම් බලපත් නිකුත් කිරීම ආවරණය කරමින් ගිනි, වාරිමාර්ග සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහතික නිකුත් කිරීමද දින 3 ක් ඇතුළත සිදු කිරීම ආරම්භ කරන ලදී. දේපළ ලියාපදිංචි කිරීමේ කාර්ය සාධක බලකායේ ඉ-ඉඩම් (e-LR) ව්‍යාපෘතියද කොළඹ දිස්ත්‍රික්කය තුළ 2018.01.17 දින සිට නියමු ව්‍යාපෘතියක් ලෙස ඉඩම් පත් ඉරු සෙවීමේ පහසුකම දියත් කරන ලදී. එමෙන්ම, වාණිජ කටයුතු දෙපාර්තමේන්තුවේ දේශ සීමාවලට ඔබ්බෙන් වෙළඳාම් කටයුතු කිරීමේ කාර්ය සාධක බලකාය, ලෝක බැංකුවේ සහය ඇතිව 2018.07.20 දින වෙළඳ තොරතුරු පෝටලය සාර්ථකව දියත් කරන ලදී. වෙළඳාම් පහසුකම් සැපයීම සඳහා වන ජාතික තනි කවුළු සැලසුම් පිටපතද ලෝක බැංකුව විසින් බඳවාගන්නා ලද තාක්ෂණික කණ්ඩායමක් විසින් 2018 ජූලි මාසයේදී සම්පූර්ණ කරන ලදී. රේගු දෙපාර්තමේන්තුවද රේගුවේ ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කරන ලදී. ගිවිසුම් බලගැන්වීමේ කාර්ය සාධක බලකායට සහය දක්වන ශ්‍රී ලංකාවේ USAID සංවිධානය 2018 ජනවාරි මසදී වාණිජ අධිකරණ සඳහා විස්තීර්ණ ඇගයීම් වාර්තාව සම්පූර්ණ කරන ලදී. බුන්වත් බව නිරාකරණය කිරීමේ කාර්ය සාධක බලකාය යටතේ, සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවද සමාගම් හමාර කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීමට නිල භාරකරුවෙකු පත් කළේය. ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ නිල භාරකරුවකු පත් කළ පළමු අවස්ථාව මෙයයි.

2018.04.30 වනදා EoDBI ඇගයීම් චක්‍රය අවසන් වූ බැවින්, ලෝක බැංකු EoDBI කණ්ඩායම විසින් පිළිගැනීමට ලක් කිරීම පිණිස සහ 2018.10.31 දින නිකුත් කෙරෙන 2019 DBI ඇගයීම් වාර්තාව තුළ සඳහන් කිරීම පිණිස කාර්ය සාධක බලකායට ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීමට සිදු විය. සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයද ලෝක බැංකු EoDBI කණ්ඩායමට නිල රාජ්‍ය ප්‍රතිචාරයක් (ප්‍රතිසංස්කරණ සංදේශය) ඉදිරිපත් කළ අතර එයට ප්‍රතිසංස්කරණ සහ කාර්ය සාධක බලකායන් විසින් සිදු කරන ලද වෙනත් දත්ත නිවැරදි කිරීම්/විස්තර කිරීම් ඇතුළත් විය.

ලෝක බැංකු EoDBI කණ්ඩායම විසින් නව සංවර්ධනයන් භාවිතා කිරීමද සලකා බැලූ නිසා, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය 2018 මාර්තු 9 වනදා දේපළ ලියාපදිංචි කිරීමේ කාර්ය සාධක බලකායේ ප්‍රධාන සංවර්ධනයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලදී. එමෙන්ම, ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ නව සංවර්ධනයන් පිළිබඳව ශ්‍රී ලංකාවේ EoDBI දත්ත ප්‍රතිචාරකයන්ට වාර්තා කිරීම සඳහා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් කාර්ය සාධක බලකායන් අටෙහි සහය සහිතව, 2018 මාර්තු 16 වනදා දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.

2018 අයවැයෙන්, ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ප්‍රධාන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට

රු. මිලියන 475 ක් වෙන් කරන ලදී. මෙම රු. මිලියන 475 න් රු මිලියන 150 ක් වෙන් කරනු ලැබුවේ e-LR ව්‍යාපෘතියටයි. e-LR ව්‍යාපෘතිය දේපළ ලියාපදිංචි කිරීමේ කාර්ය සාධක බලකායේ ප්‍රධාන ක්‍රියාකාරකමකි. ඉතිරි රු. මිලියන 325, වෙළද තොරතුරු මණ්ඩලය (TIP) සහ වෙළෙඳාම් සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සඳහා වන ජාතික තනි කවුළුව වෙත වෙන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ TIP සංවර්ධනය කළ සහ TIP හි අලෙවිකරණ කටයුතු සඳහා මූල්‍යයනය සිදු කළ ලෝක බැංකුවේ තාක්ෂණික කණ්ඩායමට සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලදී.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය, ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීමේ කාර්යය කාර්ය සාධක බලකායන් අට සමග එක්ව අඛණ්ඩව සිදු කරනු ලබයි. මේ වන විට ක්‍රියාත්මක වන සමහර කටයුතු  පහත වගුව තුළ දක්වා ඇත. බදු ගෙවීම EoDBI හි තවත් මූලිකාංගයක් වන බැවින් බදු ගෙවීම සම්බන්ධ කාර්ය සාධක බලකායක් ආරම්භ කිරීම සඳහා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් ලෝක බැංකුවේ තාක්ෂණික සහය ඉල්ලා ඇත.

## ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන තුළ ක්‍රියාත්මක කළ යුතු මූලික ක්‍රියාමාර්ග (31.12.2018 දිනට)

| ක්‍රියාකාරීත්වය | කාල රාමුව සහ වගකියන ආයතනය | අරමුණ | තත්වය |
|---|---|---|---|
| 1. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ කාර්ය සාධක බලකාය | | | |
| e-ROC පද්ධතියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව(IRD) සහ කම්කරු දෙපාර්තමේන්තුව (LD) සම්බන්ධ කිරීම | ROC, IRD සහ LD<br><br>15.03.2019 | eROC පද්ධතිය තුළින් EPF අංකය සහ TIN අංකය පැය 24 ක් ඇතුළත ලබාදීම | ROC eROC **පද්ධතිය සූදානම්ව ඇති අතර ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය පැය 24 ක් ඇතුළත නිකුත් කෙරේ. 2019.03.15** වන විට **තනි කවුළුව සම්පූර්ණ කෙරෙනු ඇත** |
| සමාගම් පනතේ (9) 1 වගන්තියට සංශෝධන සම්මත කර බලාත්මක කිරීම | කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ ROC<br><br>31.03.2019 | අයදුම්කරුවාගෙන් සමාගම් ස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම | **අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.** |
| 2. දේපළක් ලියාපදිංචි කිරීමේ කාර්ය සාධක බලකාය | | | |
| කොළඹ මහ නගර සභාවේ තනි කවුළු කවුන්ටරයක් ස්ථාපිත කිරීම | කොළඹ මහනගර සභාව (CMC)<br><br>30.04.2018 | දින 3 ක් ඇතුළත නොපැවරීමේ සහතික, හිමිකම් සහතික සහ වීථිරේඛා සහතික නිකුත් කිරීම | සම්පූර්ණ කර 2018.03.02 සිට ක්‍රියාත්මක වේ. |
| e-LR ව්‍යාපෘතිය | රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය (RGD)<br><br>04.30.2019 | මාර්ගගත සෙවුම් පහසුකම මගින් ලියාපදිංචි පරිශීලකයින්ට, නීතිඥවරුන්ට, නොතාරිස්වරුන්ට, මූල්‍ය ආයතනවලට සහ රාජ්‍ය සංවිධානවලට ඔප්පු සෙවීමට ඉඩ ලබාදෙයි | කොළඹ ඉඩම් කච්චේරිය තුළ නියමු වැඩසටහන දියත් කරන ලදී. කොළඹ ඉඩම් කච්චේරිය තුළ e-LR නිල වශයෙන් දියත් කිරීම 2019 පෙබරවාරි මසදී සිදු කෙරෙනු ඇත. 2019 අප්‍රේල් වන විට සියලුම බස්නාහිර සහ දකුණු පළාත් වල ඉඩම් කච්චේරිවල e-LR ක්‍රියාත්මක කෙරෙනු ඇත. |
| 3. ඉදිකිරීම් බලපත්‍ර සම්බන්ධව කටයුතු කිරීමේ කාර්ය සාධක බලකාය | | | |
| කොළඹ මහ නගර සභාවේ තනි කවුළු කවුන්ටරයක් ස්ථාපිත කිරීම | කොළඹ මහ නගර සභාව<br>30.04.2018 | දින 3 ක් ඇතුළත ජලාපවහන සහ මලාවපහන සහ ඝන අපද්‍රව්‍ය සහතික නිකුත් කිරීම | සම්පූර්ණ කර 2018.04.27 සිට ක්‍රියාත්මක වේ. |
| ඉදිකිරීම් බලපත්‍ර සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මාර්ගගත අයදුම්පත්‍ර පද්ධතියේ වැඩි දුර සංවර්ධනයකි. | නාගරික සංවර්ධන අධිකාරිය<br><br>15.03.2019 | ඉදිකිරීම් බලපත්‍රයක් නිකුත් කිරීමට ගතවන දින ගණන අඩු කිරීම | ගාස්තු ගණකයක් සම්පූර්ණ කර ඇති අතර පද්ධතියට එක් කෙරෙනු ඇත. SMS සන්නිවේදනය සිදුවෙමින් පවතී. ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතිය අනුකලනය කිරීම සිදුවෙමින් ඇත. |
| කොළඹ නගර සංවර්ධන සැලැස්ම යාවත් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය<br><br>31.01.2019 | ගොඩනැගිලිවල ගුණාත්මක බව සමග අනුකූල වීම සහ ගොඩනැගිලි භාවිතා කරන්නන්ගේ සහ මහජනයාගේ ආරක්ෂාව වැඩි කිරීම. | සැලසුම්කරණය සහ ගොඩනැගිලි රෙගුලාසි සූදානම් කිරීම් සිදු කෙරෙමින් ඇත. විශේෂිත ප්‍රදේශ සම්බන්ධ මාර්ගෝපදේශ සම්පූර්ණ කර ඇති අතර නීතිගත කිරීමට අපේක්ෂිතය. ලේඛනගත කිරීම සිදුවෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| **4. ණය ලබාගැනීම සම්බන්ධ විශේෂ කාර්ය බලකාය** | | | |
| නව අරක්ෂිත ගනුදෙනු (ST) පනත ක්‍රියාත්මක කිරීම | මුදල් අමාත්‍යාංශය/CRIB<br>15.04.2019 | ජාත්‍යන්තරව පිළිගත් හොඳම පරිචයන් ඇතුලත් වන බව තහවුරු කරගනිමින්<br>චංචල දේපළ බැඳුම්කරයක් ලෙස තබාගෙන<br>ආරක්ෂිත ගනුදෙනුවක් කිරීම සඳහා. | නව අරක්ෂිත ගනුදෙනු (ST) පනත, උකස් පනතේ 5 සහ 6 කොටස සමග ගලපා ගැනීම සම්බන්ධව රාජ්‍යව් යාපාර සංවර්ධන අමාත්‍යාංශය මත් ක්ළ ගැටළු නිරාකරණය කිරීමේ ලා ගරු නීතිපතිතුමා, මහ බැංකුව සහ CRIB සමග එක්ව කටයුතු කරමින් සිටී. |
| පහත දේ සැපයීම සඳහා ණය කාර්යාංශ තොරතුරු තාක්ෂණ පද්ධතියක් හඳුන්වා දීම -<br>• මූලික ණය ලකුණු<br>• මූල්‍ය නොවන ආයතනික දත්ත<br>• විපරම්<br>• වෙනත් අගය එකතු කළ සේවාවන් | CRIB<br>31.03.2020 | ණය පිළිබඳ තීරණ ගැනීම වැඩි දියුණු කිරීමට<br>සහ ණය වෙළෙඳපොළ පුළුල් කිරීම ආදියට<br>ණය ලබාදීමේ<br>පිරිවැය අඩු කිරීම | වෙළෙඳුන් තේරීම සම්පූර්ණ කර ඇත. කෙටි කලකින් ගිවිසුම අත්සන් කෙරෙනු ඇත. |
| **5. දේශසීමාවලට ඔබ්බෙන් වෙළෙඳ කටයුතු කිරීමේ කාර්ය සාධක බලකාය** | | | |
| **ක්‍රියාකාරීත්වය** | **කාල රාමුව සහ වගකියන ආයතනය** | **අරමුණ** | **තත්වය** |
| වෙළෙඳ තොරතුරු බිහිදොර ස්ථාපිත කිරීම (TIP) | වාණිජ දෙපාර්තමේන්තුව (DoC)<br>31.07.2018 | ආනයන, අපනයන සහ නැවෙන් නැවට මාරු කිරීම සම්බන්ධ නියාමන වෙළෙඳ තොරතුරු අඩංගුවන වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම සඳහා | **සම්පූර්ණ කර 2018.07.20 දින දියත් කෙරිණි.** |
| රේගුවේ පූර්ව පැමිණීම් සැකසුම් ක්‍රියාත්මක කිරීම | රේගු දෙපා./<br>මුදල් අමාත්‍යාංශය<br>31.03.2019 | පූර්ව පැමිණීම් සැකසුම් සඳහා පහසුකම් සැපයීම | 2018 මැයි 17 වන දින පූර්ව පැමිණීම් සැකසුම් සඳහා නෛතික විධිවිධාන ඇති කිරීම පිණිස රේගු ආඥා පනතේ 47 සහ 57 වගන්ති (235 අධිකාරිය) සංශෝධනය කිරීමේ යෝජනා සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලදී. 2018 මැයි 30 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලබාදෙන ලදී. කෙටුම්පත් කිරීම සම්පූර්ණ කර සමාලෝචනය සහ අනුමැතිය සඳහා යවා ඇත. |
| රේගුව තුළ විද්යුත් ගෙවුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම | රේගු දෙපා.<br>31.12.2017 | ඉලෙක්ට්‍රොනික් ගෙවීම් පහසුකමක් සැපයීම | සම්පූර්ණයි |
| **6. සුළුතර ආයෝජකයින් ආරක්ෂා කිරීම** | | | |
| සමාගම් පනත සංශෝධනය කිරීම | මුදල් අමාත්‍යාංශය/<br>SEC / සමාගම් නීති උපදේශන කොමිෂන් සභාව | පනත සංශෝධනය කර, සුළුතර ආයෝජකයින්ට, පූර්වක්‍ර අයිතීන්ට සහ ජ්‍යොෂ්ඨ කළමනාකරණ පිළිබැඳියා ගැටුම්වලට බලපාන ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධව ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ සමාගම් දෙවර්ගය සඳහාම කොටස් වෙළෙඳපොළ රෙගුලාසි හඳුන්වා දීම. | SEC සහ සමාගම් නීති උපදේශන කොමිෂන් සභාව සමග සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. |
| **7. ගිවිසුම් බලාත්මක කිරීම** | | | |
| කාර්ය සාධක බලකාය නැවත සංස්ථාපනය කිරීම සහ ඉදිරි සැලසුම ප්‍රතිව්‍යුහගත කිරීම | USAID CORE J ව්‍යාපෘතිය/ අධිකරණ අමාත්‍යාංශය<br>31.03.2019 | අධිකරණයේ නියෝජිතයින් සහ ඇගයීමේ සොයාගැනීම් ඇතුළත්කරන්න | කාර්ය සාධක බලකාය ප්‍රතිව්‍යුහගත කිරීම 2018 මාර්තු මසදී සම්පූර්ණ කෙරිණි. නව ඉදිරි සැලසුම් ක්‍රියාමාර්ගයන් සංවර්ධනය කර ඇති අතර අවසානාත්මක කිරීමට අපේක්ෂිතය. |
| **8. බුන්වත් බව නිරාකරණය කිරීම** | | | |
| 2007 අංක 7 දරන සමාගම් පනතේ 281 වන වගන්තිය යටතේ නිල භාරකරුවාගේ තනතුරට සුදුසුකම් ලැබූ අයගෙන් එක් අයෙක් හෝ කිහිප දෙනෙක් පත් කිරීම | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය /<br>ROC<br>31.10.2018 | සමාගම් හමාර කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට පහසුකම් සැපයීම | 2018.10.05 දින සම්පූර්ණ කර ඇත. |

 

ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය වැඩි දියුණු කිරීම සඳහා වන ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩමුළුවේ අවස්ථාවන්

## 3.2 ආයෝජක පහසුකම් සැපයීම

### 3.2.1 අනාගත ආයෝජකයින්

අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා වැය වන කාලය අඩු කිරීමට සහ ආයෝජක ගැටළු කාර්යක්ෂමව නිරාකරණය කිරීමට පහත කමිටු පිහිටුවීමෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සුවිශේෂී ආරම්භයන් සනිටුහන් කරන ලදී.

- ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති පරීක්ෂා කිරීමේ කමිටුව (PSC) විසින් සහෝදර දෙපාර්තමේන්තු සමඟ ඒකාබද්ධව කාර්යක්ෂම අනුමැතියක් ලබාදීම සඳහා සියලුම ආයෝජන අයදුම්පත්‍ර ඉක්මනින් පරීක්ෂා කරනු ලබයි.

- මෙහෙයුම් ගැටළු සම්බන්ධ වැඩි දුර නිශ්කාශණයන් අවශ්‍ය ඕනෑම ව්‍යාපෘතියක් ඉක්මණින් අනුමත කිරීම් සඳහා, භාණ්ඩාගාර ලේකම් සහ ගරු අගමැතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක සභාපතීත්වය දරන ආයෝජන අනුමැතිය සඳහා පහසුකම් සැපයීමේ කමිටුව (IAFC) විසින් හොබවන තනි කවුළු ආයෝජන අනුමත කිරීමේ කමිටුව (SWIAC) වැනි ඉහළ මට්ටමේ කමිටුවකට යොමු කරනු ලැබේ.

- 2018 මාර්තු මාසයේදී ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව (CCEM) අතිගරු ජනාධිපතිතුමා සභාපතිත්වය දරන ජාතික ආර්ථික සභාව මගින් ප්‍රතිස්ථාපිත කරන ලදී.

- කලාපීය ඉඩම්වල පරිහරණ අනුපාතය ඉහළ නංවමින් මනා ඉඩම් පරිහරණය තහවුරු කිරීමේ අරමුණින්, ආයෝජන මණ්ඩලයේ ඉඩම් අවශ්‍ය කරන සියලු යෝජනා, තාක්ෂණික සහ මූල්‍ය නිර්ණායක අනුව ඉඩම් වෙන් කිරීමේ කමිටුව මගින් ඇගයීමට ලක් කෙරේ.

### ➢ තනි කවුළු ආයෝජන පහසුකම් සැලසීමේ කාර්ය සාධක බලකාය (SWIFT) අරමුණු

තනි කවුළු ආයෝජන පහසුකම් සැලසීමේ කාර්ය සාධක බලකාය හඳුන්වාදීමෙන් 2018 අවසාන වන විට ආයෝජන අනුමැතීන් සඳහා වැයවන කාලය 20% කින් අඩු කරගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම මූලාරම්භය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් SWIFT හට අඛණ්ඩව සේවාව ලබාදීමේ කාලය වැඩිදියුණු කිරීමට හැකිවෙන අතර එමගින් වාර්ෂික ලෝක බැංකු සමීක්ෂණය තුළ රටේ ව්‍යාපාර කිරීමේ තරාතිරම ඉහළ නැංවිය හැකිය.

## අපේක්ෂිත ප්‍රතිඵල

SWIFT මගින් සමස්තයක් ලෙස අපේක්ෂා කෙරෙන්නේ ආයෝජන ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා ගතවන කාලය අඩු කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ පහසුවෙන් ආයෝජනය කළ හැකි බව තහවුරු කිරීම වන අතර එමගින් පහත ප්‍රතිඵල තුන සාක්ෂාත් කරගැනීමට අදහස් කෙරේ.

- ආයෝජක සේවාවන් සඳහා ක්‍රියාකාරීත්ව පදනම් (Virtual) SWIFT ක්‍රමයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- SWIFT හි කොටසක් ලෙස ආයතනවල ක්‍රියාවලීන් සරල කිරීම
- අනුමත කිරීමේ ක්‍රියාවලිය තුළ පාරදෘශ්‍යභාවය වැඩි කිරීමට උපකාර වීම






SWIFT දියත් කිරීම

මූලිකවම එක වහලක් යටින් සියලු සේවාවන් සැපයීමේ ඒකකයක් ආයෝජන මණ්ඩල පරිශ්‍රය තුළ භෞතිකව පිහිටුවන ලද අතර එහි ප්‍රධාන නියාමක ආයතනවල නියෝජිතයින් සේවයේ යෙදේ. අනුමැතිය සඳහා පහසුකම් සැපයීම සහ අන්තර් ආයතන සම්බන්ධීකරණය ඔවුන්ගෙන් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, නියෝජිතායතන අතර විධිමත් හවුල්කාරීත්වයක් නොමැති වීම සහ කාර්ය සාධන අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතියක් නොපැවතීම හේතුවෙන් භෞතිකව එක් වහලක් යටින් සියලුම සේවා සැපයීම් ඒකකය (OSS) අඩුපාඩු කිහිපයකට මුහුණ දෙන ලදී.

එකී ඌණතාවන් අඩු කිරීමේ අරමුණ ඇතිව නියමිත කාලය තුළ රේඛීය ආයතනවල අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය හඳුනාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ 2018.05.09 දිනැති අනුමැතිය අනුව තනි කවුළු ආයෝජන පහසුකම් සැලසීමේ කාර්ය සාධක බලකාය (SWIFT අන්තර්ජාල බිහිදොර) නම් අතථ්‍ය වෙබ් වේදිකාවක් ආයෝජන මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලදී.

අවබෝධතා ගිවිසුමට අමුණා ඇති සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් (SOPs) තුළ දක්වා ඇති නියමිත කාලයක් තුළදී රේඛීය ආයතන මගින් අනුමැතිය/බලපත්‍ර ලබාදීම සඳහා නෛතික රාමුවක් සැපයීම පිණිස ආයෝජන මණ්ඩලය සහ රේඛීය ආයතනය අතර අවබෝධතා ගිවිසුම් 12 ක් අත්සන් තබා ඇත. අනෙකුත් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධව අදාළ රේඛීය ආයතන සමග අඛණ්ඩ සාකච්ඡා සිදු කෙරෙමින් පවතින අතර හැකි ඉක්මණින් මෙම සියලුම රේඛීය ආයතන සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ.

ආයෝජන මණ්ඩලය අන්තර්ජාල බිහිදොර (SWIFT) 2018.05.30 වන දින දියත් කළ අතර පහත සඳහන් ප්‍රධාන රේඛීය ආයතන සමග අවබෝධතා ගිවිසුම් දොළහක් අත්සන් කර ඇත.

1. සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
2. නාගරික සංවර්ධන අධිකාරිය
3. ශ්‍රී ලංකා රේගුව
4. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
5. කොළඹ මහනගර සභාව (CMC)

6. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය (GSMB)
7. ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව
8. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC)
9. මධ්‍යම පරිසර අධිකාරිය
10. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
11. අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
12. ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව

තවත් රේඛීය ආයතන 12 ක් සමග සාකච්ඡා කර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට SWIFT අපේක්ෂා කරයි.

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. වෙරළාරක්ෂණ දෙපාර්තමේන්තුව
3. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
4. කෘෂිකර්ම අමාත්‍යාංශය
5. ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය
6. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
7. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
8. ලංකා විදුලිබල මණ්ඩලය
9. ජාතික ජල සැපයුම් සහ ජලාපවහන මණ්ඩලය
10. මුදල් අමාත්‍යාංශය/භාණ්ඩාගාරය
11. ආරක්ෂක අමාත්‍යාංශය
12. නීතිපති දෙපාර්තමේන්තුව




## ආයෝජක අනුමැතිය සඳහා පහසුකම් සැපයීමේ කමිටුවේ (IAFC) ප්‍රගතිය - 2017 සිට මේ දක්වා

| රැස්වීම් ගණන | සාකච්ඡා කළ ගැටළු ගණන | නිරාකරණය කළ ගැටළු | ප්‍රතික්ෂේප කළ ගැටළු |
|---|---|---|---|
| 69 | 201 | 194 | 7 |

## පහසුකම් සැපයීමේ ක්‍රියාවලිය

ආයෝජන මණ්ඩලය 2018.05.30 වන දින අන්තර්ජාල බිහිදොර දියත් කළ අතර රේඛීය ආයතනවල අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වේ.

ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සඳහා මූලික අවසරය ලබාදීමෙන් පසු, එහි පහසුකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අතථ්‍ය වේදිකාව තුළින් අදාළ රේඛීය ආයතන සම්බන්ධ කරගැනීමෙන් SWIFT වෙත යොමු කරනු ලැබේ. SWIFT විසින් ව්‍යාපෘතිය ලියාපදිංචි කරගනු ලබන අතර නිසි මග පෙන්වීම ලබාදෙමින් අතරමැදියෙකු ලෙස පහසුකම් සපයයි. එමෙන්ම, SWIFT විසින් රේඛීය ආයතනවල අනුමත කිරීමේ ක්‍රියාවලිය තුළ කිසියම් ගැටළුවක්/ප්‍රමාදයක් සිදුවන්නේ නම්, එවැනි ගැටළු හෝ ප්‍රමාදයන් ජයගැනීමට ඉහළ මට්ටමේ කමිටුවකට යොමු කෙරේ.

## 3.2.2 දැනට සිටින ආයෝජකයින්

### ➢ ආයෝජක සංවාදය

#### ■ යුරෝපා සංගම් හා ශ්‍රී ලංකා ආයෝජක සංවාදය

2017 දී යුරෝපා සංගමය - ශ්‍රී ලංකා ආයෝජක ද්විපාර්ශවික සාකච්ඡාව යළි ස්ථාපනය කරන ලදී. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකා ආයෝජක සංවාදයේ වට තුනක් 2017 සහ 2018 වසරවල පැවැත්වුණු අතර 2018 දී තවත් යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකා ආයෝජක සංවාදයේ වට දෙකක් පවත්වන ලදී (2018 පෙබරවාරි 22, 2018 ජූලි 04). අවසන් යුරෝපා සංගම් හා ශ්‍රී ලංකා ආයෝජක සංවාදය, 2018 ඔක්තෝබර් 17 දින පවත්වා ඇත. මෙම සංවාදය තුළ යුරෝපා සාමාජික රටවල් විසින් ගැටළු 43 ක් පමණ මතු කරන ලද අතර, එම 43 අතුරින් 27 ක්ම ප්‍රතිපත්ති සම්බන්ධ කරුණු විය. 16 ක් සමාගම් හා සම්බන්ධ ඒවා විය.

### ආයෝජන මණ්ඩල සමාගම් තුළ යුරෝපා සංගම් ආයෝජනයන්ගේ වර්ධනය

- 2016 වසරේදී ශ්‍රී ලංකාව තුළ යු.සං ආයෝජනය ඇඩො මිලියන 204.65 (ලැබුණු සමස්ත ආයෝජනයෙන් 26%)
- 2017 වසරේදී ශ්‍රී ලංකාව තුළ යු.සං ආයෝජනය ඇඩො මිලියන 211.10 (ලැබුණු සමස්ත ආයෝජනයෙන් 12%)

### යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ආයෝජක සංවාදය තුළ මතුවූ ප්‍රධාන ගැටළු

- ආයෝජකයන් සඳහා විසා නිකුත් කිරීම
- රාජ්‍ය ප්‍රසම්පාදනය තුළ පාරදෘශ්‍ය ටෙන්ඩර් පටිපාටියක් ස්ථාපනය කිරීම
- ව්‍යාපාර කිරීමේ පහසුව සඳහා තනි අන්තර්ජාල බිහිදොරක් සඳහා වන අවශ්‍යතාවය
- විදේශ සමාගම්වලට දීර්ඝකාලීනව ඉඩම් බදුගැනීමට පහසුකම් සැලසීම
- වෙළෙඳ පහසුකම් සැපයීම සම්බන්ධ ගැටළු
- ඩිජිටල් අත්සන් පිළිගැනීමේ අවශ්‍යතාවය සහ කඩදාසි භාවිත නොකිරීමේ සංකල්පය ප්‍රවර්ධනය
- වියළි (ගොඩබිම්) තොටක අවශ්‍යතාවය
- ආහාර පාන ලේබල මත "ශක්තිය" යන වචනය භාවිතා කිරීම
- සමහර යුරෝපා සංගම් සමාගම් සඳහා VAT ප්‍රතිපූර්ණය කිරීම





■ **ශ්‍රී ලංකාව, ජපාන රාජ්‍ය- පුද්ගලික සාකච්ඡා මණ්ඩපය**

ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලය සහ ජපාන වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය (JCCI), විවිධ ගැටළු භාරව සිටින ශ්‍රී ලාංකීය ඇමතිවරුන් සමග වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ සාකච්ඡා මණ්ඩපය සහ ආයෝජන මණ්ඩලය සහ වෙනත් ශ්‍රී ලංකා බලධාරීන් සමග පවත්වන කාර්තුමය පසුවිපරම් රැස්වීම් පවත්වනු ලබයි.

ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය, ජපාන වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා කර්මාන්ත (JCCISL) සමග එක්ව, වාර්ෂික ජපන් ශ්‍රී ලංකා රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ සාකච්ඡා මණ්ඩපය, 2018 අගෝස්තු 24 වන සිකුරාදා දක්වා 08 වන මහලේ ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේදී පැවැත්වූයේ අදාළ පාර්ශ්වකාර අමාත්‍යාංශ/නියෝජිතායතනවල නිලධාරීන් සමග ඔවුන්ට මුහුණ දීමට සිදුවූ ගැටළු සාකච්ඡා කිරීමේ වේදිකාවක් වශයෙනි.

මෙය එක දිගට පැවැත්වූ 10 වන සාකච්ඡා මණ්ඩපය වූ අතර ආයෝජන මණ්ඩල සභාපතිවරයා මුලසුන හොබවන ලදී. JCCISL හි සාමාජිකයින් 30 දෙනෙකු මෙම අවස්ථාවට සහභාගී වූ අතර ගැටළු 14 ක් සාකච්ඡා කරන ලදී. මුදල් අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ගුවන් තොටුපොල සහ ගුවන්සේවා සමාගම, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම සාකච්ඡා මණ්ඩපයට සහභාගි වූ අතර JCCISL සාමාජිකයින් මුහුණ පෑ ගැටළු විසඳීමට කටයුතු කරන ලදී. මෙහි පසු විපරම් කටයුතු කරන්නේ ආයෝජන මණ්ඩලයයි.

## 3.3 ආයෝජන ප්‍රවර්ධනය

➢ **ප්‍රති-ආයෝජනය ප්‍රවර්ධනය සඳහා වන ක්‍රියාකාරී කණ්ඩායම**

ප්‍රති-ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවන ලද අතර ඔවුන්ගේ කාර්යයන් වූයේ දැනට සිටින ආයෝජකයින්ගේ දුෂ්කරතාවයන් විසඳා ඔවුන්ට ප්‍රති ආයෝජනය කිරීම සඳහා, තම ව්‍යාපාර පුළුල් කිරීම් හෝ උත්ශ්‍රේණිගත කිරීම සඳහා දිරිදීමයි.

එමෙන්ම, මෙම කණ්ඩායමට පවතින ආයෝජක මාර්ගයන් තුළින් නව විභව්‍ය ආයෝජකයින් හඳුනාගැනීමේ වගකීමද පවරනු ලැබ ඇත.මෙම කණ්ඩායමේ අරමුණු වන්නේ පහත ආකාරයන් තුළින් ප්‍රති -ආයෝජනය කිරීම සහ නව ආයෝජන ආකර්ෂණය කරගැනීමයි.

- ප්‍රධාන ව්‍යාපාරික ප්‍රජාව සහ දැනට සිටින ආයෝජකයින් ප්‍රයෝජනයට ගැනීම.
- ව්‍යාපෘති චක්‍රය පුරාම සහය ලබාදීම සහ මගපෙන්වීම
- ආයෝජක විශ්වාසය ඇති කිරීම

2018 වසර තුළදී ප්‍රති-ආයෝජනය මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 24.75 ක සෘජු විදේශ ආයෝජනයක් ලබාගත හැකි විය.

### ලබාගත් ආයෝජන - ප්‍රති-ආයෝජන පසු රැකවරණ කාර්ය සාධක බලකාය - 2018

| අංකය | ව්‍යාපෘතියේ නම | ආයෝජන ආකාරය | ලබාගත් ආයෝජනය (ඇ.ඩො. මිලියන) |
|---|---|---|---|
| 1 | කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) | පුළුල් කිරීම | 20.00 |
| 2 | ඩ්‍රැවීමා ලංකා | නව | 01.00 |
| 3 | ඇම්සේෆ් බ්‍රිඩ් පෝර්ට් | පුළුල් කිරීම | 02.50 |
| 4 | ඩිකැත්ලොන් | නව | 01.00 |
| 5 | අයිඩියල් මෝටර්ස් | නව | 00.25 |
| එකතුව | | | 24.75 |

## 3.4 ආයෝජන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

### ➢ නව කාර්මික කලාප

2016, 2017 සහ 2018 වසරවල අයවැය යෝජනාවල පූර්ණ ලෙස විස්තර කෙරුණු රජයේ අරමුණු අනුව රටේ විවිධ පළාත්වල නව කාර්මික කලාප ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබා දී තිබේ. ආයෝජන මණ්ඩලයේ තාක්ෂණික සේවා දෙපාර්තමේන්තුව මෙහි මූලික කටයුතු ආරම්භ කර ඇත. සපුගස්කන්ද ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්ස් පුද්ගලික සමාගම මෙන්ම MAS සමූහය විසින් තුල්හිරියේ ක්‍රියාත්මක කරන ලද MAS රෙදිපිළි උද්‍යානය වඩාත් වැදගත් වන්නේ රාජ්‍ය-පුද්ගලික හවුල්කාරීත්වයයි.

2017 අයවැය යෝජනා අතර ඉලක්ක කළ එක් දෙයක් වූයේ "ආර්ථික කොරිඩෝවන්" ලෙස නම් කෙරෙන අධිවේගී මාර්ග දෙපස සිදුවන කාර්මීකරණය තුළින් අධිවේගී මාර්ග යොදාගැනීම වැඩි කිරීමයි. අධිවේගී මාර්ග කොරිඩෝවන් තුළ නව කාර්මික කලාප සංවර්ධනය සඳහා වැඩි දුර අධ්‍යයන කටයුතු සිදු කිරීමට සුදුසු ස්ථාන හඳුනාගැනේ.

ආයෝජන කලාප සංවර්ධනය කිරීම සඳහා සුදුසු බවට හඳුනාගත් ඉඩම් අතුරින්, ස්ථාන පහක එනම් බිංගිරිය, මීල්ලනිය, මාවතගම, වගවත්ත සහ වාලි මවුන්ට් වත්ත -මාතර, සංවර්ධන කටයුතු දැනටමත් ආරම්භ වී ඇති අතර ඒවා වෙනත් රේඛීය ආයතන සමග සහයෝගයෙන් සංවර්ධන ක්‍රියාවලියේ විවිධ අදියරයන් තුළ පවතී.

වර්තමානයේ ආයෝජන මණ්ඩලය යටතේ කාර්මික කලාප 12ක් ක්‍රියාත්මක වන අතර ඉන් අවසන් කලාපය 2000 වසරේදී සංවර්ධනය කෙරිණි. එබැවින්, වසර 18කට පසුව මෙම වැඩසටහන යටතේ නව කලාප සංවර්ධනය කරන පළමු අවස්ථාව මෙය වනු ඇත.

ඉඩම් හඳුනාගැනීමේදී සහ ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩ ලබාගැනීමට නව කලාප සංවර්ධනය කරන විට, විශේෂයෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අවශ්‍යතා සම්බන්ධව සහ කලාප තුළ ඇති සියලුම ව්‍යාපෘති කාර්යයන් ජාතික පාරිසරික රෙගුලාසි අනුව සිදුවන්නේදැයි තහවුරු කරගැනීම වෙත ආයෝජන මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කරයි.

### නව කාර්මික කලාපවල ප්‍රගතිය

| | ව්‍යාපෘතියේ නම | අනුගමනය කළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | ව්‍යාපෘතියේ වර්තමාන තත්වය |
|---|---|---|---|
| 1. | මීල්ලනිය අපනයන සැකසුම් කලාපය සඳහා යටිතල පහසුකම් සැපයීම | 2018 අයවැයෙන්, බිංගිරිය, වාලි මවුන්ට් වත්ත මාතර සහ මීල්ලනිය වැනි යෝජිත කලාප 3 ක් සංවර්ධනය කිරීම සඳහා රු බිලියන 2.5 ක් වෙන් කරන ලද අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන් ලැබෙනුයේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව අංශයෙනි. | මීල්ලනිය අපනයන සැකසුම් කලාපය<br>- මීල්ලනිය අපනයන සැකසුම් කලාපයේ අදියර 1 සඳහා ඉඩම් අත්පත් කරගැනීම සිදුවෙමින් පවතී. සැලසුම් සම්පූර්ණ කර ඇත.<br>- දක්ෂිණ අධිවේගී මාර්ගයේ නව අතුරු හුවමාරුව සහ යෝජිත මීල්ලනිය අපනයන සැකසුම් කලාපය වෙතින් එන පිවිසුම් මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදි කරනු ඇත.<br>- අපනයන සැකසුම් කලාපය සඳහා වන පාරිසරික බලපෑම් ඇගයීම කාර්මික තාක්ෂණ ආයතනය මගින් ආරම්භ කර ඇත.<br>- කළුතර ජාල උප පොළ වෙතින් මෙවො 10 ක මූලික විදුලි සැපයුමක් ලබාදෙනු ඇත. ලංවිම විසින් 33KVA විදුලි රැහැන් සැලසුමක් සකසමින් ඇත. අමතර මෙවො 25 ක විදුලි සැපයුමක් සඳහා හොරණ වගවත්ත ප්‍රදේශයේ ජාල උපපොළක් ඉදි කෙරෙනු ඇත. වගවත්ත සිට මීල්ලනිය දක්වා 33 KVA සම්බන්ධතා රැහැනක් සැලසුම් කෙරෙමින් ඇත.<br>- දිනකට 500 $m^3$ ක ජල සැපයුමක් ඉදිකෙරෙමින් ඇත. දිනකට 8000 $m^3$ ක ජල සැපයුමක් ලබාදීමේ සැලසුම සම්පූර්ණ කර ඇත. |
| 2. | බිංගිරියේ නව කාර්මික කලාපය ස්ථාපනය කිරීම | | බිංගිරිය කාර්මික කලාප<br>- ඉඩම් තක්සේරුව - සංවර්ධන පිරිවැය මත පදනම්ව තක්සේරුව ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.<br>- පස් පරීක්ෂාව - අදියර 1 සහ 11 ට අදාළ අවසන් වාර්තා ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් භාර දී ඇත.<br>- ජලය - ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය විසින් නල සැපයුම, නල එළීම සහ බිම්ගත ජල ටැංකියක් ඉදිකිරීම සඳහා ලංසු ලේඛන සකසා ඇත. |

| | ව්‍යාපෘතියේ නම | අනුගමනය කළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | ව්‍යාපෘතියේ වර්තමාන තත්වය |
|---|---|---|---|
| | | | - විදුලිය - විදුලිය සැපයීමේ රැහැන් සඳහා මග හෙළි කිරීම පිණිස ආයෝජන මණ්ඩලය කටයුතු සිදු කරමින් සිටී.<br>-මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ) වෙතින් මූලිකව පිවිසුම් මාර්ග සංවර්ධනය කිරීමේ තක්සේරුව ලබාගන්නා ලද අතර මූලික වැඩ කටයුතු සඳහා වන ගෙවීම් පියවීමට අමාත්‍යාංශය වෙත භාර දී ඇත.<br>- කට්ටි කිරීමේ සැලසුම - අදියර 1 සහ 11 සඳහා සංකල්පමය පිරිසැලසුම ආයෝජන මණ්ඩලය විසින් සූදානම් කර ඇත.<br>- පාරිසරික බලපෑම් ඇගයීම - කාර්මික තාක්ෂණ ආයතනයට භාරදී ඇති අතර ඔවුන් මූලික වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| 3. | මාවතගම | | ඉඩම ලබාගැනීම සඳහා ඉඩම් කොමසාරිස්වරයා සමග සාකච්ඡා පවත්වනු ලැබේ. |

## ➢ මිල්ලනිය නව කාර්මික කලාපය

- ව්‍යාපෘතිය සඳහා තක්සේරු කර ඇති පිරිවැය රු බිලියන 8.3 ක් වන අතර බිලියන 1 (සචලිකරණ අත්තිකාරම) ක් කලාපයේ යටිතල පහසුකම් සැපයීම පිණිස වැයකර ඇත. දිනකට 500 m3 ක ජල සැපයුමක් සඳහා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත (අදියර 1) දිනකට 10,000 m3 ක සැපයුමක් සඳහා 500 mm ක විෂ්කම්භය සහිත සම්බන්ධතාවයක් - අදියර 11, සැලසුම සහ ලංසු ලේඛන සැකසීම සිදු කෙරෙමින් ඇත.

- කලාපයට මූලික විදුලි බල අවශ්‍යතාවය සැපයීමට (මෙවො 10 පමණ) ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර වගවත්ත යෝජිත ජාල උපපොළ වෙතින් මිල්ලනිය කාර්මික කලාපයට මෙවො 20 ක සැපයුමක් ලබාදීමට විශේෂිත සම්බන්ධතාවයක් සැපයෙනු ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය වන රු මිලියන 1100 න් සචලීකරණ අත්තිකාරම ලෙස රු මිලියන 336 ක් දැනට නිදහස් කර ඇත.

## ➢ බිංගිරිය කාර්මික කලාපය

ව්‍යාපෘතිය සඳහා තක්සේරු කර ඇති පිරිවැය රු බිලියන 2.2 ක් වන අතර මිලියන 116 (සචලිකරණ අත්තිකාරම) ක් කලාපයේ යටිතල පහසුකම් සැපයීම පිණිස වැයකර ඇත.හලාවත ජල සැපයුම් යෝජනා ක්‍රමයෙන් දිනකට 1000 cum/Day (මූලික ඉල්ලුම) සඳහා ඉදිකිරීම් කටයුතු ආරම්භ වී ඇත (අදියර 1) විදුලිය සැපයීම සඳහා මාර්ග අධ්‍යයනය සිදු කෙරෙමින් එහි විදුලිය සැපයීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කෙරෙමින් ඇත. බිංගිරියට 2MVA ක සැපයුමක් ලබාදීමට මූලික වැඩකටයුතු ආරම්භ කෙරිණි. 1 අදියර තුළ බිංගිරිය - තුන්තොට (දුම්මලසූරිය) සඳහා මංතීරු දෙකක් සහිත මාර්ගයක් ඉදිකිරීම සඳහ අවශ්‍ය සැලසුම සකසා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කර ඇත. යෝජිත ඉඩමේ තක්සේරුව ලැබුණු අතර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවීම් කළයුතු ව ඇත.





## 3.5 2018 තුළ ආයෝජන මණ්ඩලයේ කාර්ය සාධනය

### අ) ව්‍යාපෘතිවල තත්වය

| දර්ශකය | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති ගණන | මුළු ආයෝජනය (රු. මිලියන) | ව්‍යාපෘති ගණන | මුළු ආයෝජනය (රු. මිලියන) | ව්‍යාපෘති ගණන | මුළු ආයෝජනය (රු. මිලියන) | ව්‍යාපෘති ගණන | මුළු ආයෝජනය (රු. මිලියන) |
| අනුමත කළ | 227 | 593,433 | 205 | 906,243 | 150 | 627,959 | 128 | 389,387 |
| ගිවිසුම් අත්සන් කළ | 157 | 289,992 | 186 | 758,068 | 104 | 429,816 | 94 | 221,404 |
| ක්‍රියාත්මක කළ | 100 | 112,314 | 111 | 154,986 | 91 | 458,349 | 71 | 131,149 |
| ආරම්භ කළ වාණිජ මෙහෙයුම් | 103 | 65,126 | 82 | 97,656 | 82 | 82,701 | 52 | 53,151 |

සටහන: පුළුල් කිරීම් ඇතුළුව

2018 වසර තුළදී, ව්‍යාපෘති 128 ක් අනුමත වූ ඇති අතර ඒවායේ තක්සේරු කළ ආයෝජනය රු. බි 389 ක් විය.

### ආ) සෘජු විදේශ ආයෝජන (FDI) - 2018

2018 වසර තුළ ලැබුණු සෘජු විදේශ ආයෝජන ඇමෙරිකානු ඩොලර් මිලියන 2367 ක් විය. මෙය, 2017 වසරේ සෘජු විදේශ ආයෝජනය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1710 සමඟ සැසඳීමේදී 38%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

#### ආංශික දායකත්වය - FDI (2018)

| අංශය | FDI (ඇඩො මි.) |
|---|---|
| **නිෂ්පාදන** | **291.48** |
| **කෘෂිකර්මය** | **0.46** |
| **සේවාවන්** | |
| හෝටල් සහ අවන්හල් | 223.37 |
| IT සහ BPO | 58.74 |
| වෙනත් සේවා | 19.15 |
| **යටිතල පහසුකම්** | |
| නිවාස දේපළ සංවර්ධනය | 397.76 |
| දුරකථන සහ විදුලි සංදේශ ජාල | 522.18 |
| බලශක්ති උත්පාදනය | 0.01 |
| ඉන්ධන, ගෑස්, ඛනිජ තෙල් සහ වෙනත් | 3.74 |
| වරාය බහාලුම් පර්යන්ත | 849.98 |
| එකතුව | **2366.86** |

#### ආංශික දායකත්වය - FDI (2018)



## සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවණතා (1978-2018)




## ඇ) ආයෝජන මණ්ඩල සමාගම්වලින් අපනයනය

2018 වසරේ ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම් වල අපනයන ඇ.ඩො. මි. 8495 ක් වූ අතර එය 2017 වසර සමඟ සැසඳීමේදී 10%ක වර්ධනයක් පෙන්නුම් කරයි.



## ඇ) 2018 වසර තුළ ක්‍රියාත්මක කළ/ ආරම්භ කළ ප්‍රධාන ව්‍යාපෘති

| අංකය | සමාගමේ නම | ව්‍යාපාර ක්‍රියාකාරීත්වය | අංශය |
|---|---|---|---|
| 1 | ලංවා සංස්ථා සිමෙන්ති සංස්ථා (පුද්) සමාගම. | සිමෙන්ති ඇඹරීමේ සහ මිශ්‍රකිරීමේ අංගනය | නිෂ්පාදන |
| 2 | හාබර් විලේජ් (පුද්) සමාගම | මිශ්‍ර සංවර්ධන සංකීර්ණය | යටිතල පහසුකම් |
| 3 | වෙස්ට් පැසිෆික් ටෙක්ස්ටයිල් (ලංකා) (පුද් ) සමාගම | සින්තටික් රෙදි සැකසුම | ඇඟළුම් |
| 4 | වෙස්ටන් පවර් (පුද්) සමාගම | අපද්‍රව්‍ය බලශක්තිය බවට හරවන බලශක්ති අංගනය මෙවො 10 | උපයෝගිතා |
| 5 | සමර් සීසන්(පුද්) සමාගම | වැලිගම කාමර 212 ක් සහිත හෝටලය | සංචාරක කර්මාන්තය සහ විවේකය |
| 6 | සිලෝන් හොලිඩේ රිසෝර්ට් (පුද්) සමාගම | හෝටලයකි | සංචාරක කර්මාන්තය සහ විවේකය |
| 7 | ඉන්කියුබ් ග්ලෝබල් (පුද්) සමාගම | අපනයන වෙළෙඳ සමාගමකි. | ඇඟළුම් |
| 8 | මරීනා බීච් (පුද්) සමාගම | කාමර 350 කින් යුත් තරු තුනේ හෝටලය | සංචාරක කර්මාන්තය සහ විවේකය |
| 9 | වෝකර්ස් සී.එම්.එල්. ප්‍රොපර්ටීස් සංවර්ධන සමාගම | ස්ථාන 03 ක ඉදිකෙරෙන තට්ටු නිවාස සංකීර්ණ | යටිතල පහසුකම් |
| 10 | ගෝල්ෆේස් ප්‍රොපර්ටීස් (පුද්) සමාගම | කොළඹ 03 මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය- රේනුකා හෝල්ඩිංස් සමාගම | යටිතල පහසුකම් |

# 04. වෙළඳ තරඟකාරිත්වය

## 4.1 ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ මූලාරම්භය

2004 අගෝස්තු 01 වන දින පැවැත්වුණු ලෝක වෙළඳ සංවිධානයේ මහ සභාව තුළ ලෝක වෙළඳ සංවිධාන සාමාජික රටවල් එම වෙළෙඳ සංවිධානයේ වෙළෙඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (TFA) සම්බන්ධව සාකච්ඡා ආරම්භ කිරීමට ඒකමතිකව එකඟ විය. එහි අරමුණ වූයේ වෙළඳාම සහ තීරුබදු පිළිබඳ පොදු එකඟතාවේ (1994) වෙළඳ පහසුකම් දියුණු කරගැනීම මෙන්ම සංක්‍රමණිකව ඇති භාණ්ඩ ද ඇතුළුව භාණ්ඩ සංචලනය, නිකුත් කිරීම සහ නිෂ්කාෂණය වේගවත් කිරීමත්ය. මීට අමතරව, වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම තුළින් වෙළඳ පහසුකම් සැපයීම සහ රේගු අනුකූලතා ගැටළු සම්බන්ධව රේගුව සහ වෙනත් නිසි බලධාරීන් අතර ඵලදායී සහයෝගීතාවක් සඳහා ක්‍රියාමාර්ගයන් සඳහන් වේ. එමෙන්ම මෙම ප්‍රදේශය තුළ පවතින තාක්ෂණික සහ ධාරිතා වර්ධනය පිළිබඳ විධි විධානද ඇතුළත් වේ.

වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම, පාරදෘශ්‍යභාව වැඩි කරන අතර, ලෝක අගය දාමයන්ට සහභාගි වීමේ හැකියාවන් වැඩි කර ප්‍රමාද වීම් සහ මඟ හැරීම් අඩු කිරීමට කටයුතු කරනු ලබයි. වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම දේශ සීමා අතර භාණ්ඩ සංචලනය, නිකුත් කිරීම සහ නිෂ්කාෂණය වේගවත් කිරීමට අපේක්ෂා කරයි.

2018 වසරේදී CCEM සහ අමාත්‍ය මණ්ඩල තීරණ තුළින් සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ පරිශ්‍රයේ ජාතික වෙළඳ පහසුකම් කමිටුවේ (NTFC) ලේකම් කාර්යාලයක් නිල වශයෙන් ස්ථාපනය කරන ලදී. 2018 අයවැයෙන්, වෙළඳ තොරතුරු බිහිදොර (TIP) සහ ජාතික තනි කවුළු (NSW) ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 325 ක් වෙන් කරන ලදී. වෙළෙඳ පහසුකම් සැපයීමේ ගිවිසුමේ 1.2 වගන්තිය අනුව වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව 2018.07.20 වන දින වෙළෙඳ තොරතුරු බිහිදොර දියත් කරන ලදී. ලෝක බැංකුව මගින් උපදේශනය ලබාගත් තාක්ෂණික කණ්ඩායම වෙළඳ තොරතුරු බිහිදොර සංවර්ධනය කිරීමේ තාක්ෂණික සහය ලබාදෙන ලදී. එමෙන්ම, ලෝක බැංකුව විසින් සේවයේ යොදවන ලද තවත් තාක්ෂණික කණ්ඩායමක්, රේගු දෙපාර්තමේන්තුව සමග එක්ව ජාතික තනි කවුළුව සඳහා සැලසුම් පිටපතක් සකස් කළ අතර එය මේ වන විට ලෝක බැංකුව විසින් සමාලෝචනය කරමින් ඇත. මෙම තාක්ෂණික කණ්ඩායම් සඳහා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය කාර්යාල පරිශ්‍ර සැපයූ අතර කාර්යාල ඉඩ ඇතුළුව NTFC ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම් ද ලබාදී වෙළඳ තොරතුරු බිහිදොරෙහි අලෙවිකරණ කටයුතු සඳහාද ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් මුදල් වෙන් කෙරිණි.

## වෙළෙඳ පහසුකම් සැපයීමේ ගිවිසුම ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය - සම්පූර්ණ කළ කටයුතු

| නියෝජිතායතනය | ක්‍රියාකාරීත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රේගුව | 1.1 ප්‍රකාශන | | 31/12/2019 | |
| | ප්‍රකාශන සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම/නියම කිරීම (තොරතුරු නිලධාරීන්, භාෂා පරිවර්තකයින්). | සම්පූර්ණයි | | |
| | **1.2 අන්තර්ජාලය තුළින් ලද හැකි තොරතුරු** | | 31/12/2019 | |
| | **වෙළෙඳ තොරතුරු බිහිදොර සමග සම්බන්ධතා ඇති කර තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම.** | සම්පූර්ණයි | | www.customs.gov.lk වෙබ් අඩවිය තුළ ශ්‍රී ලංකා වෙළෙඳ තොරතුරු බිහිදොර වෙත සබැඳියක් ඇතුළත් කෙරිණි |
| | **තොරතුරු යාවත්කාලීන කිරීම සහ වෙබ් අඩවිය නඩත්තු කිරීම සඳහා නියම කළ කාර්ය මණ්ඩලය (තොරතුරු නිලධාරීන්) පත් කිරීම.** | සම්පූර්ණයි | | |
| | **7.1 පූර්ව පැමිණීම් සැකසුම** | | 31/12/2018 | |
| | රේගු ආඥාපනතේ විධිවිධාන අනුව, ගාස්තු ඉලෙක්ට්‍රොනිකව ගෙවීමට හැකියාව ඇති කිරීම | සම්පූර්ණයි | | |
| | 7.6 සාමාන්‍ය නිකුත් කිරීමේ වේලාවන් | | 31/12/2019 | |
| | කාල නිකුතු අධ්‍යයනය (TRS) කිරීම සඳහා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයෙන් ප්‍රමාණවත් ගණනක් වෙන් කිරීම. | සම්පූර්ණයි | | |
| | කාල නිකුතු අධ්‍යයනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ විශ්ලේෂණයට වෙන් කළ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. | සම්පූර්ණයි | | ලෝක රේගු සංවිධානයේ (WCO) විශේෂඥ පුහුණුකරුවන් විසින් 2018 සැප්තැම්බර් 25 සිට 28 දක්වා කාල නිකුතු අධ්‍යයන (TRS) වැඩමුළුවක් පවත්වන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා රේගුව සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) විසිනි. |

| නියෝජිතායතනය | ක්‍රියාකාරීත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | | | | නොවැම්බර් 26 වනදා සිට දෙසැම්බර් 20 වනදා දක්වා TRS පැවැත්වෙනු ඇත. |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) | **1.2 අන්තර්ජාලය තුළින් ලද හැකි තොරතුරු** | | 31/12/2019 | |
| | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන වෙබ් අඩවිය තුළ දක්වා ඇති 1.2 වගන්තියේ තොරතුරු අයිතම පල කිරීම සහ **යාවත්කාලීන කිරීම.** | සම්පූර්ණයි | | |
| ශ්‍රී ලංකන් කාර්ගෝ ආයතනය (Sri Lankan Cargo) | 1.1 ප්‍රකාශන | | 31/12/2019 | |
| | අපගේ සම්මත මෙහෙයුම් පටිපාටීන් සහ අත්පොත් වෙතින් අවශ්‍ය තොරතුරු රැගෙන අපනයන, ආනයන, භාරදීම් පිළිබඳ තොරතුරු ගුවන් සේවා තාක්ෂණික වචන ඉවත් කර සරල කිරීම | සම්පූර්ණයි | | මීට අමතරව මෙම ලේඛනයට අවම තත්ව සම්මත (MQS), ගාස්තු සහ සීමා වේලාවන් ද ඇතුළත් කර ඇත. |
| | අභ්‍යන්තර කමිටුවක් පත් කිරීම | සම්පූර්ණයි | | |
| | **2.1 බලාත්මක කිරීමට පෙර අදහස් දැක්වීමට සහ තොරතුරු ලබාගැනීමට අවස්ථාව** | | 30/03/2020 | |
| | බලාත්මක කිරීමට පෙර අදහස් දැක්වීමට සහ තොරතුරු ලබාගැනීමට අවස්ථාව<br><br>(නීතිමය සහ පරිපාලන රෙගුලාසි) | සම්පූර්ණයි | | |
| | **6.1 ආනයනය සහ අපනයනය මත හෝ ඒවාට අදාළව පැනවූ ගාස්තු සම්බන්ධ පොදු විනය** | | 31/12/2022 | |
| | ගාස්තු ක්‍රියාත්මක කිරීම සහ වරින් වර ඒවා සංශෝධනය කිරීම (සාමාන්‍යයෙන් මාස 24 කට එක් වරක්) - පාරිභෝගිකයින් මසකට පෙර දැනුවත් කළ යුතුයි. | සම්පූර්ණයි | | |
| | ගාස්තු ස්වයංක්‍රීයව ජනනය වේ | සම්පූර්ණයි | | |
| | 7.2 ඉලෙක්ට්‍රොනික ගෙවීම | | 31/12/2019 | |
| | ඉලෙක්ට්‍රොනික ගෙවීම | සම්පූර්ණයි | | Lankapay ආයතනයේ අනුග්‍රහයෙනි. |

| නියෝජිතායතනය | ක්‍රියාකාරීත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | | | | |
| වෙළෙඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | <u>1.1 ප්‍රකාශන</u> | | 31/12/2019 | |
| | ප්‍රකාශනයන් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීම/ බඳවාගැනීම (තොරතුරු නිලධාරීන්, භාෂා පරිවර්තකයින්) සහ භාෂා පරිවර්තකයින්ගේ සේවාව පිටතින් ලබාගැනීමට කටයුතු යෙදීම/ මුදල් අමාත්‍යාංශයේ භාෂා පරිවර්තක සංචිතයේ භාෂා පරිවර්තකයින්ගේ සේවය ලබාගැනීම | සම්පූර්ණයි | | |
| | සියලුම ප්‍රකාශන දේශීය භාෂාවන්ට පරිවර්තනය කිරීම (දෙමළ සහ සිංහල) | සම්පූර්ණයි | | |
| | **<u>1.2 අන්තර්ජාලය තුළින් ලද හැකි තොරතුරු</u>** | | 31/12/2019 | |
| | තොරතුරු **යාවත්**කාලීන කිරීම සහ වෙබ් අඩවිය නඩත්තු කිරීම සඳහා නියම කළ කාර්ය මණ්ඩලය (තොරතුරු නිලධාරීන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන්) පත් කිරීම. | සම්පූර්ණයි | | |
| | **<u>2.1 බලාත්මක කිරීමට පෙර අදහස් දැක්වීමට සහ තොරතුරු ලබාගැනීමට</u>** <u>අවස්ථාව</u> | | 30/03/2020 | |
| | 2.1 වගන්තියේ විධි විධාන අනුව වෙළෙඳාම හා සම්බන්ධ නීති සහ පරිපාලන රෙගුලාසි බලාත්මක කිරීමට පෙර සාධාරණ කාලසීමාවක් තුළ පලකිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වාදීම | සම්පූර්ණයි | | සමහර කරුණු සම්බන්ධව වෙළෙඳාම ආශ්‍රිත නීති/රෙගුලාසි ඒවා බලාත්මක කිරීමට පෙර මාධ්‍ය සාකච්ඡාවක් මගින් දැනුම් දෙනු ඇත (උදා: වාහන විමෝචන ප්‍රමිතීන් මත මෝටර් වාහන ආනයනය කිරීම පිළිබඳ නීති හා රෙගුලාසි සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග<br>(2018 අයවැය කථාවේ අංක 15 සහ 16 දරන තාක්ෂණික |

| නියෝජිතායතනය | ක්‍රියාකාරීත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | | | | සටහන් සමග අයාවැය යෝජනා අංක 19) |
| | නව/සංශෝධිත නීති හා රෙගුලාසි බලාත්මක කිරීමට පෙර ප්‍රකාශයට පත් කිරීම. | සම්පූර්ණයි | | මාධ්‍ය නිවේදනයක් මගින් වෙළෙඳාම ආශ්‍රිත සමහර කරුණු පිළිබඳ නිති/රෙගුලාසි දැනුම් දෙනු ලැබේ. |
| | දැනුම්දීම සහ යෝජිත නීති හා රෙගුලාසි මත මහජන අදහස් කළමනාකරණය කිරීමේ වගකීම සමග කාර්ය මණ්ඩලය පත්කිරීම. | සම්පූර්ණයි | | |
| ආනයන සහ අපනයන පාලන දෙපාර්ත මේන්තුව | 1.1 ප්‍රකාශන | | 31/12/2019 | |
| | ආනයන සහ අපනයන පාලන පනතේ විධිවිධාන සහ මාර්ගෝපදේශ යටතේ රෙගුලාසි පළ කිරීම සහ නිල වෙබ් අඩවිය තුළ වෙනත් ක්‍රියා පටිපාටීන් පළ කිරීම. | සම්පූර්ණයි | | |
| | පවතින ක්‍රමයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට වෙනස්කම් කිහිපයක් සිදු කිරීම. නව පද්ධතිය සහ නව වෙබ් අඩවිය සඳහා තොරතුරු ගබඩා කිරීම සහ ලබා ගැනීමේ පද්ධතිය (SOR) සංවර්ධනය කිරීම | සම්පූර්ණයි | | |
| | ප්‍රකාශන සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම/නියම කිරීම (තොරතුරු නිලධාරීන්, භාෂා පරිවර්තකයින්). | සම්පූර්ණයි | | |
| | **1.2 අන්තර්ජාලය තුළින් ලද හැකි තොරතුරු** | | 31/12/2019 | |
| | ක්‍රියා පටිපාටීන් සංවර්ධනය කිරීම සහ අන්තර්ජාලය තුළින් පළ කිරීම. | සම්පූර්ණයි | | |
| | නව නිල වෙබ් අඩවිය දියත් කිරීම | සම්පූර්ණයි | | www.imexport.gov.lk |
| | තොරතුරු පළ කිරීම සහ **යාවත්**කාලීන කිරීම | සම්පූර්ණයි | | දෛනිකව **යාවත්**කාලීන කෙරේ |
| | 7.2 ඉලෙක්ට්‍රොනික ගෙවීම | | 31/12/2019 | |
| | මාර්ගගත බලපත්‍ර අයදුම්පත්‍රය දියත් කිරීම | සම්පූර්ණයි | | |
| | 1.1 ප්‍රකාශන | | 31/12/2019 | |

| නියෝජිතායතනය | ක්‍රියාකාරීත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
| --- | --- | --- | --- | --- |
| වාණිජ දෙපාර්තමේන්තුව (DoC) | ප්‍රභව ස්ථාන සහතික නිකුත් කිරීම සඳහා ක්‍රියාපටිපාටීන් සැලසුම් කිරීම | සම්පූර්ණයි | | |
| | පැහැදිලිව අර්ථ නිරූපිත තොරතුරු ලබාදීමේ යාන්ත්‍රණයක් සමග නිල වශයෙන් තොරතුරු පල කිරීමට පරිපාලන ක්‍රියාපටිපාටීන් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම (තොරතුරු ආකාරය, පල කිරීමේ ආකාරය, එක් රැස් කිරීම, සම්පාදනය, සමාලෝචනය සහ තොරතුරු යාවත් කිරීම යනාදිය සඳහා වන ක්‍රියාවලීන්). | සම්පූර්ණයි | | |
| | ප්‍රකාශන සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම/නියම කිරීම (තොරතුරු නිලධාරීන්, භාෂා පරිවර්තකයින්). | සම්පූර්ණයි | | |
| | සියලුම ප්‍රකාශන දේශීය භාෂාවන්ට පරිවර්තනය කිරීම | සම්පූර්ණයි | | වාණිජ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය භාෂා 3 න්ම ඇති අතර ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු බිහිදොර (SLTIP) අඛණ්ඩව පරිවර්තනය කළ යුතුව ඇත. www.doc.gov.lk |
| | ප්‍රභව ස්ථාන සහතික පත්‍ර, ප්‍රභව ස්ථාන රීති, ගාස්තු, වෙළඳ ගිවිසුම්, තීරු බදු කොටස් සඳහා වන ක්‍රියාපටිපාටි 1.1 වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම අදාළ තොරතුරු පල කිරීම. | සම්පූර්ණයි | | |
| | <u>1.2 අන්තර්ජාලය තුළින් ලද හැකි තොරතුරු</u> | | 31/12/2019 | |
| | වෙළඳ තොරතුරු බිහිදොර (TIP) ස්ථාපනය කිරීම (ආනයන, අපනයන සහ නැවෙන් නැවට මාරු කිරීම සම්බන්ධ නියාමන වෙළෙඳ තොරතුරු අඩංගු වන වෙබ් අඩවියක්) | සම්පූර්ණයි | | 2018 ජූලි 20 වනදා ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු බිහිදොර (SLTIP) **දියත් කරන ලදී.** |
| | අන්තර්ජාලය (වෙබ් අඩවි) තුළින් පල කිරීම සඳහා ක්‍රියා පටිපාටීන් සංවර්ධනය කිරීම. | සම්පූර්ණයි | | |

| නියෝජිතායතනය | ක්‍රියාකාරිත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | වෙළඳ තොරතුරු බිහිදොර සමග සම්බන්ධතා ඇති කර වෙබ් අඩවිය නඩත්තු කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. | සම්පූර්ණයි | | |
| | දෙපාර්තමේන්තු වෙබ් අඩවි නවීකරණය කිරීම (පරිශීලක හිතෛෂී භාවය වැඩි කිරීම, තොරතුරු යාවත් කිරීම) | සම්පූර්ණයි | | |
| | වාණිජ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන සිංහල සහ දෙමළ භාෂා විකල්ප එක් කිරීම.http://www.doc.gov.lk | සම්පූර්ණයි | | |
| | තොරතුරු යාවත්කාලීන කිරීම සහ වෙබ් අඩවිය නඩත්තු කිරීම සඳහා නියම කළ කාර්ය මණ්ඩලය (තොරතුරු නිලධාරීන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන්) පත් කිරීම. | සම්පූර්ණයි | | |
| | ප්‍රභව ස්ථාන සහතික සඳහා සම්පූර්ණ යාවත්කාලීන ක්‍රියාපටිපාටීන්; ආකෘති පත්‍ර සහ ලේඛන; අභියාචනා හෝ සමාලෝචනය සඳහා ක්‍රියාපටිපාටීන් සහ වෙබ් අඩවියේ 1.2 වගන්තිය යටතේ දක්වා ඇති අනෙකුත් තොරතුරු පල කිරීම. | සම්පූර්ණයි | | |
| | <u>1.3 විමසුම් ස්ථාන</u> | | 31/12/2019 | |
| | විමසුම් ස්ථාන කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා ක්‍රියාපටිපාටීන්, මාර්ගෝපදේශ සහ තොරතුරු සංවර්ධනය කිරීම. | සම්පූර්ණයි | | |
| | <u>6.1 ආනයනය සහ අපනයනය මත හෝ ඒවාට අදාළව පැනවූ ගාස්තු සම්බන්ධ පොදු විනය</u> | | | |
| | නව හෝ සංශෝධිත ගාස්තු බලාත්මක කිරීමට පෙර පල කිරීම සඳහා ක්‍රියාවලීන් ස්ථාපිත කිරීම. | සම්පූර්ණයි | 31/12/2022 | |
| | ගාස්තු ගණනය කිරීම සහ අදාළ කරගැනීම ස්වයංක්‍රීය කිරීම | සම්පූර්ණයි | | |
| | <u>7.2 ඉලෙක්ට්‍රොනික ගෙවීම</u> | | 31/12/2019 | |

| නියෝජිතායතනය | ක්‍රියාකාරීත්වය | තත්වය | ඉලක්ක දිනය | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | ඉලෙක්ට්‍රොනික ගෙවීමේ ක්‍රමය සඳහා භාවිතා කිරීම පිණිස ක්‍රියාපටිපාටීන් සංවර්ධනය කිරීම සහ පල කිරීම. | සම්පූර්ණයි | | |
| | ඉලෙක්ට්‍රොනික ගෙවීම් වේදිකාව ස්ථාපනය කිරීම. | සම්පූර්ණයි | | |
| | **10.2 පිටපත් භාරගැනීම** | | 31/12/2019 | |
| | සහය ලේඛනවල කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික පිටපත් පිළිගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටීන් සංවර්ධනය කිරීම. | සම්පූර්ණයි | | |
| | සහය ලේඛනවල කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික පිටපත් පිළිගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ඇති කිරීම. | සම්පූර්ණයි | | |
| | **10.4 තනි කවුළුව** | | 31/12/2022 | |
| | ජාතික තනි කවුළුව සඳහා සැලසුම් පිටපතක් සකස් කිරීම. | සම්පූර්ණයි | | 2018 ජුලි 31 වනදා ජාතික තනි කවුළුවේ සැලසුම් පිටපතක් අග්‍රාමාත්‍ය කාර්යාල කණ්ඩායම විසින් සම්පූර්ණ කරන ලද අතර දැන් එය ලෝක බැංකුවේ සමාලෝචනයට බඳුන් වෙමින් තිබේ. |

## 4.2 විස්තෘත වෙළඳ කටයුතු කෙරෙහි යොමු වීම

රජයේ නව වෙළඳ ප්‍රතිපත්තිය මගින් වඩාත් අපනයනය මත පදනම් වූ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරන, වෙළඳ කාර්ය සම්පාදනය වැඩි දියුණු කරන සහ ගෝලීය වෙළඳපළ තුළ තරඟ කිරීමට හැකි වන පරිදි වෙළඳ සමාගම්හි හැකියාවන් වර්ධනය කරන වඩාත් නිදහස්, සරළ, විනිවිදභාවයෙන් යුතු හා පුරෝකථනය කළ හැකි වෙළඳ ක්‍රමයක් අපේක්ෂා කෙරේ. තවද එමගින් ද්වි පාර්ශවීය, කලාපීය හා බහු පාර්ශවීය මට්ටමින් උපායමාර්ගික හවුල්කරුවන් සමග විස්තෘත සබඳතා ඇති කර ගැනීමට සහාය ලබා දෙනු ලැබේ. එවැනි විස්තෘත සබඳතා මගින් ශ්‍රී ලංකාව ගෝලීය අගය දාමයන් තුළට රැගෙන යාම, අපනයන තරඟකාරීත්වය ඉහළ නැංවීම හා ව්‍යාප්ත කිරීම සහ සාධනීය ගිවිසගත් නියමයන් හරහා මෙරට ආයෝජනය කිරීමට තරඟකාරී විදේශ ආයෝජකයන් දිරිමත් කිරීම සිදු කෙරෙනු ඇත.

මෙම පසුබිම යටතේ ශ්‍රී ලංකාව දැනට ඉන්දියාව, චීනය හා තායිලන්තය සමග විස්තෘත හා විස්තීර්ණ වෙළඳ සාකච්ඡා පවත්වයි.




මාස 18ක සාකච්ඡාවලින් පසුව 2018.01.23 දින ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) අත්සන් තබන ලද අතර එය 2018.05.01 දින සිට බලාත්මක විය. ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවේ පළමු විස්තීර්ණ වෙළඳ ගිවිසුම සහ උප මහද්වීපික නොවන වෙළඳ හවුල්කරුවකු සමග වන පළමු ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුම වේ. එසේම එය වසර 16ට පසුව ශ්‍රී ලංකාව අත්සන් තබන ලද පළමු නිදහස් වෙළඳ ගිවිසුම ද වේ.

| රට | 2016 – 2018 දක්වා වූ වෙළඳ සාකච්ඡා | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිංගප්පූරුව | 2016 අගෝස්තු 15 – 16 (පළමු වටය) | 2016 ඔක්තෝම්බර් 21 (දෙවන වටය) | 2016 දෙසැම්බර් 13 – 15 (තෙවන වටය) | 2017 පෙබරවාරි 16 - 17 (සිව්වන වටය) | 2017 අප්‍රේල් 06 - 07 (පස්වන වටය) | 2017 ජූලි 24 – 25 (හය වන වටය) | 2017 ඔක්තෝම්බර් 16-18 (හත්වන වටය) | 2017 නොවැම්බර් 13-14 (අටවන වටය) | 2018 ජනවාරි 23 (ශ්‍රී ලංකාවේ දී නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කිරීම) | | |
| චීනය | 2016 අගෝස්තු 2 – 4 (තෙවන වටය) | 2016 නොවැම්බර් 21 - 23 (සිව්වන වටය) | 2017 ජනවාරි 17 -19 (පස්වන වටය) | 2017 මාර්තු 20 - 22 (හය වන වටය) | | | | | | | |
| ඉන්දියාව | 2016 අගෝස්තු 9 - 10 (පළමු වටය) | 2016 සැප්තැම්බර් 29 - 30 (දෙවන වටය) | 2017 ජනවාරි 04 - 05 (තෙවන වටය) | 2017 අප්‍රේල් 24 - 26 (සිව්වන වටය) | 2017 අගෝස්තු 16 - 18 (පස්වන වටය) | 2017 ඔක්තෝම්බර් 4 – 6 (හය වන වටය) | 2017 දෙසැම්බර් 18 - 20 (හත්වන වටය) | 2018 පෙබරවාරි 21 - 23 (අටවන වටය) | 2018 මැයි 23 - 25 (නවවන වටය) | 2018 අගෝස්තු 2 - 4 (දසවන වටය) | 2018 ඔක්තෝම්බර් 3 – 5 (11 වන වටය |
| තායිලන්තය | 2018 ජූලි 13 (පළමු වටය) | 2018 සැප්තැම්බර් 19 - 21 (දෙවන වටය) | | | | | | | | | |

## ➢ ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)



### අරමුණ

ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, වෙළඳාමෙහි සම්මත ජාත්‍යන්තර භාවිතාවන් හඳුන්වා දීම හා ආර්ථික සංවර්ධනය පවත්වා ගැනීම සඳහා උසස් ගුණාත්මකභාවයකින් සහ සාධාරණ පිරිවැයකින් යුතු ආනයනයන් සැපයීම.

### ප්‍රතිඵලය

2022 වන විට මෙරටට ලැබෙන ඍජු විදේශ ආයෝජන, සිංගප්පූරුව වෙත සිදු කෙරෙන භාණ්ඩ හා සේවා අපනයනය දෙගුණ වීම.

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම පරිච්ඡේද 17න් සමන්විත වන අතර ඒවා මගින් මූලික වශයෙන් භාණ්ඩ වෙළඳාම, සේවා, ආයෝජන ප්‍රවර්ධනය, සෞඛ්‍ය ආරක්ෂාව හා ශාක සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ක්‍රියාමාර්ග සහ වෙළඳාම කෙරෙහි වන තාක්ෂණික බාධක, වෙළඳ ප්‍රතිකර්ම හා ආරවුල් නිරාකරණය, රේගු සහයෝගීතාව හා වෙළඳ පහසුකරණය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව, රාජ්‍ය ප්‍රසම්පාදනය, විද්‍යුත් වාණිජ්‍යය සහ බුද්ධිමය දේපළ හිමිකම් යන ක්ෂේත්‍ර ආවරණය කෙරේ.

භාණ්ඩ වෙළඳාම් ක්ෂේත්‍රය තුළ වසර 15ක කාල සීමාවක් පුරා අදියර 4දී එහි තීරු බදුවලින් 80%ක් ලිහිල්කරණය කිරීමට ශ්‍රී ලංකාව ප්‍රතිඥා දී ඇත (තීරුබදු ලිහිල්කරණ වැඩසටහන). පළමු අදියර ලෙස ශ්‍රී ලංකාවේ තීරු බදු වලින් 50%ක් ලිහිල්කරණ කරන ලදී. කෙසේ වුවද, මේ 3719 අතරින් කිහිපයක් හැර අනෙක් ඒවා දැනටමත් තීරුබදු රහිත වේ. එහි ප්‍රතිඵලයක් ලෙස එමගින් ආදායමට හෝ දේශීය කර්මාන්ත කෙරෙහි කිසිඳු බලපෑමක් එල්ල නොවනු ඇත. ඉතිරි තීරුබදු අඩු කිරීම හා ඉවත් කිරීම ක්‍රමානුකූල ක්‍රියාවලියක් අනුව සිදුවනු ඇත. උදා■ සමාන වාරිකවලින් 1 වන වසරේ සිට 6 වන වසර දක්වා වූ තීරුබදු වලින් 15%ක් (අයිතම 1116), සමාන වාරිකවලින් 7 වන වසරේ සිට 12 වන වසර දක්වා වූ තීරුබදු වලින් 14.3%ක් (අයිතම 1064) හා සමාන වාරිකවලින් 11වන වසරේ සිට 15 වන වසර දක්වා වූ තීරුබදු වලින් 0.7%ක් (අයිතම 51). ව්‍යුත්පත්ති රීතීන් පිළිබඳ නිර්ණායකය යටතේ සිංගප්පූරුවේ 35% අගය එක් කිරීම හෝ තීරුබදු ශීර්ෂය අංක හතරේ මට්ටමට වෙනස් නොවුණහොත් මිස සාමාන්‍යයෙන් සිංගප්පූරුවෙන් ආනයනය කරන නිෂ්පාදන සඳහා තීරුබදු සහන හිමි නොවේ. අවම අගය එක් කිරීම හෝ සකස් කිරීම අනිවාර්යයෙන් ම සිංගප්පූරුවේ දී සිදු කළ යුතු බැවින් ගිවිසුමෙහි ව්‍යුත්පත්ති රීතීන් මගින් හුදෙක් සිංගප්පූරුව හෝ භාණ්ඩ වෙළඳාම හරහා අපනයනය කිරීමට ඉඩ නොදෙනු ඇත. එසේම ප්‍රමිතීන්, සෞඛ්‍ය ආරක්ෂක හා ශාක සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග, පීඩාකාරී ක්‍රියාපරිපාටීන් වැනි භාණ්ඩ වෙළඳාමේ දී තීරු බදු නොවන බාධක සඳහා ඵලදායී ලෙස පිළියම් ලබා දීමට මෙම ගිවිසුමෙහි සෞඛ්‍ය ආරක්ෂක හා ශාක සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග, වෙළඳ හා රේගු ක්‍රියාපරිපාටීන් සහ වෙළඳ පහසුකරණය කෙරෙහි වන තාක්ෂණික බාධක පිළිබඳ විස්තීර්ණ පරිච්ඡේද ඇතුළත් වේ. තවද වෙළඳ ප්‍රතිකර්ම පිළිබඳ පරිච්ඡේදය හරහා ලිහිල්කරණ මගින් දේශීය කර්මාන්ත කෙරෙහි ඇති විය හැකි දැඩි හානිවලින් ඵලදායී ලෙස ආරක්ෂා කරනු ඇත.

සේවා වෙළඳාම් ක්ෂේත්‍රයට අදාළ පරිච්ඡේදය ධනාත්මක ලැයිස්තු පදනමක් (Positive List Basis) මත ගිවිස ගෙන ඇති අතර එහි දී ශ්‍රී ලංකාව නිදහස්කරණයේ ප්‍රමාණය, සීමාවන්ගේ මට්ටම හා ශ්‍රී ලංකාව බැඳීම් ඇති කර ගැනීමට තෝරා ගන්නා අංශවල සිංගප්පූරු සේවාවන් සැපයීම සඳහා වන වෙනත් කොන්දේසි නිශ්චිතව දක්වයි. සේවාවන් පිළිබඳ පරිච්ඡේදයේ දක්වා ඇති ශ්‍රී ලංකාව විසින් සිංගප්පූරුව වෙත සිදු කෙරෙන පිරිනැමීම් පිළිබඳ සැලකීමේ දී විනිමය පාලන රෙගුලාසි, ආයෝජන රෙගුලාසි, ආගමන රෙගුලාසි ආදියෙහි දක්වා ඇති ආකාරයට දැනට පවතින ඒක පාර්ශවික ක්‍රමය

හරහා ලබා දෙනු ලබන ප්‍රමාණයෙන් ඔබ්බට ගිය නව ලිහිල්කරණයක් නොමැත. මෙම පරිච්ඡේදයේ මූලික අරමුණ වන්නේ ලැයිස්තුගත අංශයන්හි ලිහිල්කරණයේ මට්ටමට බැඳීම්, විනිවිදභාවය හා ස්ථිරභාවය ඇති කිරීමයි. සිංගප්පූරුව විසින් ශ්‍රී ලංකාව වෙත සිදු කෙරෙන පිරිනැමීම් පිළිබඳ සැලකීමේ දී ශ්‍රී ලංකාව පිරිනමන අංශයන්ට වඩා වැඩි සේවා අංශ පෙළක් සිංගප්පූරුවේ බැඳීම් මගින් ආවරණය කෙරෙන අතර සේවා වෙළඳාමෙහි දී සිංගප්පූරුව විසින් ශ්‍රී ලංකාව වෙත සිදු කෙරෙන පිරිනැමීම් ශ්‍රී ලංකාව විසින් සිංගප්පූරුව වෙත සිදු කෙරෙන පිරිනැමීම්වලට වඩා කැපී පෙනෙන ආවරණයක් සහිත වේ.

ආයෝජන පිළිබඳ පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාව වෙත ආයෝජකයන් ආකර්ෂණය කිරීම සඳහා සිංගප්පූරු ආයෝජකයන් හා ඔවුන්ගේ ආයෝජන සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයනු ලැබේ. ඒවා අතර සැලකීම පිළිබඳ අවම ප්‍රමිතිය (Minimum Standard of Treatment), ජාතික සැලකීම (National Treatment), වඩාත්ම වරණිය දේශය (Most Favours Nation - MFN) පාඩු සඳහා වන්දි, කාර්යසාධන අවශ්‍යතා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය, තොරතුරු පිළිබඳ සැලකීම, බුක්තිය පැහැර ගැනීම, පැවරීම් හා පුද්ගලාදේශය වේ මෙම පරිච්ඡේදය මගින් සිංගප්පූරුව වෙත ලබා නොදෙන දේශීය ආයෝජකයන්/ ආයෝජන සඳහා ලබා දෙන සහනාධාර හා ප්‍රදානයන් වැනි ජාතික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජයට අවශ්‍ය නම්‍යශීලීභාවය ලබා දෙනු ලබන අතර වක්‍ර ලෙස අයිතිය පවරා ගැනීමක දී හැර බඳු පැනවීමේ ක්‍රියාමාර්ග ඉවත් කෙරේ. බේරුම්කරණය සඳහා වන වියදම අවම කිරීම හා මූලික අපනයනකරුවන් කෙරෙහි අනවශ්‍ය පක්ෂපාතීත්වයක් ඇති වීම වැළැක්වීමේ අරමුණින් නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වන ආයෝජක - රාජ්‍ය ආරවුල් නිරාකරණ ක්‍රියාවලිය දැනට ශ්‍රී ලංකාවේ පවතින ද්වි පාර්ශවික ආයෝජන ගිවිසුම් සමග සන්සන්දනය කිරීමේ දී නෛතික ලේඛනයට ඇතුළත් කරන ලද වෙනස්කම් කිහිපයක් ඇතුළත් කර ඇත.

තවද රජයේ ප්‍රසම්පාදනය පිළිබඳ පරිච්ඡේදය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වන අතර එමගින් බොහෝ විට විනිවිදභාවය හා ක්‍රියාපරිපාටිමය සාධාරණත්වයට අදාළ විධිවිධාන ආවරණය කෙරේ. මීට අමතරව, විද්‍යුත් වාණිජ්‍යය පිළිබඳ පරිච්ඡේදය මගින් ඉලෙක්ට්‍රොනික මාධ්‍යය මගින් සිදු කෙරෙන වෙළඳාම කෙරෙහි බලපාන දෙරට විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ආවරණය කෙරෙන අතර එමගින් ආර්ථික වර්ධනය සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය මගින් සැපයෙන අවස්ථා තහවුරු කෙරෙන අතර ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය පිළිබඳ පාරිභෝගික විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සහ විද්‍යුත් වාණිජ්‍යය කෙරෙහි ඇති බාධක ඉවත් කිරීම ද සිදු කෙරේ. විදුලි සංදේශ විධිවිධාන පිළිබඳ පරිච්ඡේදය විදුලි සංදේශ සේවාවලට අදාළ වෙළඳාම කෙරෙහි බලපාන ක්‍රියාමාර්ගවලට අදාළ වන අතර එමගින් ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර භාවිතාවන් යොදා ගැනීම තහවුරු කෙරේ. එසේ ම බුද්ධිමය දේපළ පිළිබඳ පරිච්ඡේදය මගින් ජාත්‍යන්තරව පිළිගත් හොඳම භාවිතාවන් යොදා ගන්නා බවට වග බලා ගනිමින් බුද්ධිමය දේපළ ක්ෂේත්‍රය තුළ ඔවුන් පාර්ශවයන් වන TRIPS ගිවිසුමේ හා වෙනත් ජාත්‍යන්තර සම්මුතීන් විධිවිධානවලට ඌණ පූර්ණයක් සපයනු ලැබේ.

එසේ ම ආයතනික, පොදු හා මූල්‍ය ප්‍රතිපාදන පරිච්ඡේදය මගින් ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා විස්තීර්ණ නෛතික රාමුවක් සැපයේ. මෙම පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ගිවිසුමේ නිසි ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා හවුල් කමිටුවක් ස්ථාපිත කෙරේ. එසේ ම මෙම ගිවිසුම නිදහස් වෙළඳ ගිවිසුමට අදාළ ආරවුල් නිරාකරණය කිරීම සඳහා වන විස්තීර්ණ යාන්ත්‍රණයක් ද ඇතුළත් වේ.

## ➢ ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ECTA)

### අරමුණ

සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ආර්ථික සංවර්ධනය පවත්වා ගැනීම සඳහා අඩුම පිරිවැයකින් යුතු ආනයනයන් සැපයීම.

### ප්‍රතිඵලය

2022 වන විට භාණ්ඩ හා සේවා අපනයනයන්, ඉන්දියාව වෙතින් ලැබෙන සෘජු විදේශ ආයෝජන සහ පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය දෙගුණ වීම.

ඉන්දියාව ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම අපනයන වෙළඳපළ හා විශාලතම ආනයන මූලාශ්‍රය ද වේ. 2017 දී ශ්‍රී ලංකාවේ ආනයනයන් අතරින් සියයට 21කට වැඩි ප්‍රමාණයක් සඳහා ඉන්දියාව දායකත්වය දරා ඇති අතර ශ්‍රී ලංකාවේ අපනයනයන් අතරින් සියයට 7කට ආසන්න ප්‍රමාණයක් සිදු කර ඇත්තේ ඉන්දියාව වෙතය. 2000 වර්ෂයට සාපේක්ෂව ඉන්දියාව වෙත ශ්‍රී ලංකාවේ අපනයනයන් දස ගුණයකින් ඉහළ ගොස් ඇති අතර එම කාල සීමාව තුළදී ම මුළු අපනයනයන් ප්‍රමාණය ඉහළ ගොස් ඇත්තේ දෙගුණයකින් පමණි. මෙම ජයග්‍රහණවලට ප්‍රධාන හේතුව වන්නේ මේ වන විට වසර 15කට අධික කාලයක් පුරා ක්‍රියාත්මකව පවතින ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමයි. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි සහන මගින් ඉන්දියාව වෙත වන ශ්‍රී ලංකාවේ අපනයනයන්ගෙන් 80%ට අධික ප්‍රමාණයක් හා ඉන්දියාව වෙතින් ශ්‍රී ලංකාව වෙත සිදු කරන ආනයනයන් අතරින් 65% පමණ ආවරණය කෙරේ. මීට අමතරව, ඉන්දියාව විසින් අත්සන් තබන ලද අනෙකුත් සියළු ද්වි පාර්ශවික නිදහස් වෙළඳ ගිවිසුම්වලට සාපේක්ෂව ඉන්දියාව විසින් ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම හරහා ශ්‍රී ලංකාව වෙත ඉහළ මට්ටමේ තීරු බදු ලිහිල්කරණයක් පිරිනමා ඇත.

තවද ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් දෙරටට ම අනපේක්ෂිත ප්‍රතිඵල ඇති වී තිබේ. පළමුව, පසුගිය දශකය තුළ දෙරට අතර සිදු වන ආයෝජන සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් ඇති ශ්‍රී ලංකාව තුළ ඉන්දියාවේ සමුච්චිත ආයෝජනය ඇ.ඩො.මි. 1කට ආසන්න වන අතර ඉන්දියාව තුළ ශ්‍රී ලංකාවේ සමුච්චිත ආයෝජනය ඇ.ඩො.මි. 300කට ආසන්න වේ. දෙවනුව, පසුගිය දශකය තුළ දෙරට අතර සේවා වෙළඳාම වර්ධනය වෙමින් පවතියි. උදාහරණ ලෙස, ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් සපයන විශාලත ම සැපයුම්කරු වන්නේ ඉන්දියාව වන අතර ඉන්දියාවට සංචාරකයන් සපයන හය වන විශාලතම සැපයුම්කරු ශ්‍රී ලංකාව වේ.

2015 රජයන් දෙක විසින් ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම යෝජනා කරන ලද්දේ මෙම සාධනීය ජයග්‍රහණ ලබා ගැනීම සඳහාය. ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මගින් පහත සාකච්ඡා කෙරෙන අන්දමට පැතිකඩ රැසකින් ආර්ථික ප්‍රතිලාභ ලබා දීම අපේක්ෂා කෙරේ. එසේම ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මගින් දෙරට අතර ආර්ථික "අසමමිතිය" හඳුනා ගනු ඇති අතර යෝග්‍ය නම්‍යශීලීභාවයන් පිළිබඳ විධිවිධාන හරහා ඒවා සඳහා පිළියම් ලබා දීමට නියමිතය.

යෝජිත ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මගින් මූලික වශයෙන් භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධනය, සෞඛ්‍ය ආරක්ෂාව හා ශාක සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ක්‍රියාමාර්ග සහ වෙළඳාම කෙරෙහි වන තාක්ෂණික බාධක, වෙළඳ ප්‍රතිකර්ම හා ආරවුල් නිරාකරණය, රේගු සහයෝගීතාව හා වෙළඳ පහසුකරණය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා යන ක්ෂේත්‍ර ආවරණය කෙරේ. දැනට ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුමෙහි සාකච්ඡා වට 11ක් සාර්ථකව පවත්වා නිම කර ඇත.

ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි (ETCA ප්‍රධාන අරමුණක් වන්නේ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ ගැටළු නිරාකරණය කිරීමයි. ඒ අනුව ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි සෑම සාකච්ඡා වටයක් ම ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට වෙන් වුණු සැසිවාරයක් වේ. සමාගමට නිශ්චිත වූ ගැටළු, ඇඟලුම් කෙරෙහි වන කෝටා හා ක්‍රියාපරිපාටිමය සීමාවන්, ගම්මිරිස් හා වනස්පති, කාලීනව අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු නිරාකරණය කිරීම සඳහා ව්‍යුහාත්මක දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ සාකච්ඡා මෙම සැසිවාරයට ඇතුළත් වේ.

භාණ්ඩ වෙළඳාම පිළිබඳ පරිච්ඡේදයෙහි දී ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වන බැඳීම් (හිමිකම් හා බැඳීම්) ඉවත් කර ගැනීම හෝ ගිවිස ගැනීම සිදු නොකිරීම කෙරෙහි වන අපේක්ෂාව ශ්‍රී ලංකාව විසින් ප්‍රකාශ කර ඇති අතර ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ අත්වන හිමිකම් හා බැඳීම්වලට අදාළ සංක්‍රාන්තිමය විධිවිධාන ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි ඇතුළත් කිරීමේ අවශ්‍යතාවද එමගින් අවධාරණය කර ඇති තීරු බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ඇත්තේ (ETCA ගිවිසුමෙහි ඍණාත්මක ලැයිස්තු සමාලෝචනය කිරීම මගින් වන අතර මෙම ක්‍රියාවලියේ දී ආර්ථික අසමමිති මූලධර්මය පිළිබඳ සලකා බලනු ලැබේ. තවද, ETCA හි දී දැනට ද්වි පාර්ශවික වෙළඳාම කෙරෙහි ප්‍රධාන බාධවක් ලෙස හඳුනාගෙන ඇති ප්‍රමිතීන්, සෞඛ්‍ය ආරක්ෂක හා ශාක සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග ඇතුළු තීරු බදු නොවන බාධක (NTBs) පිළිබඳ ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. ඒ අනුව ද්වි පාර්ශවික වෙළඳාම වැඩි දියුණු කිරීම සඳහා ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි සෞඛ්‍ය ආරක්ෂක හා ශාක සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග, වෙළඳ හා රේගු ක්‍රියාපරිපාටීන් සහ වෙළඳ පහසුකරණය කෙරෙහි වන තාක්ෂණික බාධක පිළිබඳ පරිච්ඡේද මගින් ඵලදායක ලෙස තීරු බදු නොවන බාධක ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ඇත. ස්ථිර ක්‍රියාමාර්ගයක් ලෙස අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමෙහි අංගවලට විශේෂිත මාර්ගෝපදේශ රාමුවක් පිළිබඳ වගන්තියක් ඇතුළත් කිරීමට දෙපාර්ශවය ම එකඟ වූ අතර එමගින් ඔවුන් කැමති අපනයන අංශ පිළිබඳ අනාගතයේ දී අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇති අතර ප්‍රතිඵල දෙපාර්හවයටම අදාළ කරගත හැකි වනු ඇත.

ඉන්දියාව ඉදිරි වර්ෂවල දී විශේෂයෙන් සේවා වෙළඳාම ව්‍යාප්ත කිරීම මගින් ලොව වේගයෙන්ම වර්ධනය වන විශාල ආර්ථිකයක් බවට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ ආර්ථිකයන් දෙක අතර අසමමිතිය පිළිබඳ සලකා බලමින් ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම හරහා අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ අංශවලට අදාළව සේවා වෙළඳාම ලිහිල්කරණය සිදු කෙරෙනු ඇත. දැනට දෙපාර්ශවය ම විසින් වෙනස් කිරීම, සංශෝධනය හෝ සම්පූර්ණයෙන් ම ඉවත් කර ගැනීම සඳහා වන හිමිකම තබා ගනිමින් සිය මූලික කොන්දේසි සහිත පිරිනැමීම් හුවමාරු කර ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ මූලික පිරිනැමීම් පිළිබඳ සලකා බලන කල එමගින් Mode 04 යටතේ ස්වභාවික පුද්ගලයන්ගේ නිදහස් සංචරණය සඳහා ඉඩ නොදෙනු ඇති බවට වන රජයේ ස්ථාවර ප්‍රතිපත්තිය පිළිබිඹු කෙරෙන අතර සහ ඒ අනුව කිසිඳු වෘත්තීය කාණ්ඩයක් විවෘත කිරීමට ශ්‍රී ලංකාව කිසිඳු අයුරකින් බැඳී නොසිටියි.

2017 මාර්තු මස දී ඉන්දියාව විසින් ශ්‍රී ලංකාව ඇතුළු ව එහි දැනට පවතින ද්වි පාර්ශවීය ආයෝජන ගිවිසුම් අවසන් කිරීමට හා යළි සාකච්ඡා කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. ඒ අනුව දෙරට අතර ආයෝජන ප්‍රවාහ ප්‍රවර්ධනය කිරීමෙන් ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි ආයෝජන පිළිබඳ පරිච්ඡේදය මගින් මෙම රික්තකය පුරවනු ඇත.

තවද කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය, සංචාරක කර්මාන්තය, ප්‍රවාහන හා ගුවන් සේවා, වරාය අංශය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු, බලශක්තිය, විද්‍යාව, තාක්ෂණ හා පර්යේෂණ, අභ්‍යවකාශ, කාලගුණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය හා ඒවායේ තරඟකාරීත්වය ඉහළ නැංවීම පිළිබඳ පරිච්ඡේදයක් ද ඇතුළත් වනු ඇත.

එසේ ම වෙළඳ ප්‍රතිකර්ම පිළිබඳ පරිච්ඡේදය මගින් ලිහිල්කරණයෙන් පසුව සිදු විය හැකි බරපතල හානිවලින් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා එලදායී පිළියම් හඳුන්වා දෙනු ඇත. තවද ආරවුල් නිරාකරණය කිරීම පිළිබඳ පරිච්ඡේදය මගින් නිදහස් වෙළඳ ගිවිසුමට අදාළ ආරවුල් නිරාකරණය කිරීම සඳහා ඒකාබද්ධ නෛතික රාමුවක් සපයනු ඇති අතර ගිවිසුම ක්‍රියාත්මක කිරීම දෙරටේ නිලධාරීන්ගෙන් සමන්විත හවුල් කමිටුවක් හරහා අධීක්ෂණය කරනු ඇත.

## ➢ චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSLFTA)

### අරමුණ

ඇ.ඩො.බි. 2,000ට අධික භාණ්ඩ හා සේවා වෙළඳපළ වෙත එලදායී ලෙස ප්‍රවේශ වීම, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, වෙළඳාමෙහි සම්මත ජාත්‍යන්තර භාවිතාවන් හඳුන්වා දීම හා ආර්ථික සංවර්ධනය පවත්වා ගැනීම සඳහා උසස් ගුණාත්මකභාවයකින් සහ සාධාරණ පිරිවැයකින් යුතු ආනයනයන් සැපයීම.

ගිවිසුම මගින් ඇ.ඩො. මිලියන 700කට ආසන්න අමතර වෙළඳාමක් උත්පාදනය කරනු ඇතැයි ද නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ඇඟලුම් ක්ෂේත්‍රය ඇ.ඩො.මි. 400කින් ඉහළ යනු ඇතැයි සහ නිෂ්පාදන 244ක් සඳහා නව චීන වෙළඳපළ විවෘත කිරීමේ අවස්ථාව මගින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තරඟකාරී වාසි සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ.

යෝජිත ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම මගින් මූලික වශයෙන් භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධනය, සෞඛ්‍ය ආරක්ෂාව හා ශාක සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ක්‍රියාමාර්ග සහ වෙළඳාම කෙරෙහි වන තාක්ෂණික බාධක, වෙළඳ ප්‍රතිකර්ම හා ආරවුල් නිරාකරණය, රේගු සහයෝගීතාව හා වෙළඳ පහසුකරණය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව යන ක්ෂේත්‍ර ආවරණය කෙරේ.

භාණ්ඩ වෙළඳ ක්ෂේත්‍රයේ දී චීනය දැනටමත් තමන්ගේ තීරු බදුවලින් බිංදුවේ අනුපාතයේ සිට 75%ක් දක්වා අදාළ කර ගන්නා නමුත් සෙස් බද්ද අදාළ කර ගැනීමට යටත් වූ තීරු බදු ගණනාවක් වේ. ශ්‍රී ලංකාව විසින් චීනය වෙත ඉදිරිපත් කරන ලද අපේක්ෂිත කරුණු ලැයිස්තුව (Wish List) තීරු බදු 462කින් සමන්විත වන අතර එයට චීනය වෙත සිදු කරන සියළු ම ප්‍රධාන අපනයනයන් ඇතුළත් වේ. එයට ශ්‍රී ලංකාව විසින් චීනය වෙත සිදු කෙරෙන අපනයනයන්ගෙන් 65%ට අධික ප්‍රමාණයක් ඇතුළත් වේ. චීනයේ තත්වය වන්නේ 6888ක තීරු බදු හා දෙපාර්ශවයේ ම වෙළඳ ධාරිතාව යන දෙකටම අදාළව 90%ක් වන අතර තීරු බදුවලින් 10% ක් පමණක් තීරු බදු අඩු කිරීමට යටත් නොවනු ඇත.

කෙසේ වුවද, වසර 10 පුරා 70%ක ලිහිල්කරණයක් ශ්‍රී ලංකාව විසින් යෝජනා කරන ලද අතර 20 වන වසර වන විට 90%ට ළඟා වීමට එකඟ වී ඇත. මේ සඳහා චීන පාර්ශවයේ එකඟතාව ලබා ගැනීමට නියමිතය.

සේවා වෙළඳාම් ක්ෂේත්‍රයට අදාළව පාඨ පිළිබඳ සාකච්ඡා බොහෝමයක් අවසන් කරන ලද අතර දෙපාර්ශවයම විසින් මූලික පිරිනැමීම් ලැයිස්තුව හුවමාරු කර ගන්නා ලද අතර ඒවා තවදුරටත් සාකච්ඡා සඳහා විවෘතව පවතියි. චීනය විසින් කරන ලද ඉල්ලීම මත පදනම්ව ශ්‍රී ලංකාව විසින් සේවා ලිහිල්කරණය සඳහා වන සිය මූලික පිරිනැමීම් ඉදිරිපත් කරන ලදී. මෙමගින් අදාළ අංශවලට සම්බන්ධ විවිධ නීති හා රෙගුලාසිවලට යටත්ව පරිගණක දෘඩාංග සවි කිරීමට අදාළ පරිගණක සේවාවන්, මූල්‍ය සේවාවන්, ක්‍රියාකරු සමග මුහුදේ ගමන් කරන යාත්‍රාවල කුලී සේවාවන්, වෙනත් ප්‍රවාහන උපකරණවල අලුත්වැඩියා සේවාවන්, නැව් ආශ්‍රිත සේවාවන්ට අදාළ නැව් බඩු පිළිබඳ කටයුතු කිරීම, ගබඩා සේවාවන්, ඉදිකිරීම්වලට අදාළ සේවාවන්, ප්‍රචාරණ සේවාවන්, කාර්මික පරීක්ෂාවන් හා විශ්ලේෂණ සේවාවන්, ක්‍රීඩා ඉසව් ප්‍රවර්ධනය හා විනෝද කටයුතු සහා උද්‍යාන වෙරළ සේවාවන් ආවරණය කෙරේ. වෘත්තීය සේවාවන් පිළිබඳ සලකා බලන කල වෘත්තීය සේවාවන් හා ඉඩකඩම් වලට අදාළ සේවාවන් පිළිබඳ අංශ සඳහා චීනය විසින් ඉල්ලා ඇති බැඳීම් ඇති කර ගැනීමේ දුෂ්කරතාවන් ශ්‍රී ලංකාව විසින් පෙන්වා දී ඇත.

ගිවිසුමෙහි ආයෝජන පිළිබඳ පරිච්ඡේදය මගින් වඩාත් ලිහිල් වූ තත්වයක් හා චීන ආයෝජකයන් හා අනාවැකි පළ කළ හැකි පරිසරය කෙරෙහි ආරක්ෂාව සපයනු ලබන අතර ශ්‍රී ලංකාව විසින් චීන ආයෝජකයන්හට ලිහිල් තත්වයක් සපයනු ලබන අතර නැවත මිළදී ගැනීමේ කටයුතු (buy -back arrangements) සමග වන හවුල් ව්‍යාපාර දිරිමත් කෙරේ. අතරමැදි යෙදවුම්වල පිරිවැය අවම කිරීමෙන් මෙම ආයෝජනවල තරඟකාරීත්වය තීව්‍ර කරනු ඇති යෝජිත ගිවිසුමෙහි ප්‍රතිලාභ මෙම ආයෝජනවලට ලැබිය හැකිය. ද්වී පාර්ශවික ආයෝජන සඳහා විස්තීර්ණ ආවරණයක් සැපයෙනු අතර දැනට පවතින ද්වී පාර්ශවික ආයෝජන ගිවිසුම මගින් ලබා දෙන ආවරණය තවදුරටත් ශක්තිමත් කරනු ඇති එසේ ම චීන ආයෝජන සඳහා ශ්‍රී ලංකාව විසින් දැනටමත් හම්බන්තොට විශේෂ අපනයන පිරිසැකසුම් කලාපයක් ඇති කිරීමට පියවර ගෙන ඇති අතර එමගින් ද වැඩි චීන සමාගම් සංඛ්‍යාවකට මෙම කලාපය තුළ ආයෝජනය කිරීමට පහසුකම් සැලසෙනු ඇත.

## ➢ ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)

### අරමුණු

භාණ්ඩ, සේවා, ආයෝජන හා අන්‍යෝන්‍ය එකඟතාවයකට පැමිණීමට නියමිත වෙනත් ක්ෂේත්‍ර වෙත වන වරාය වෙළඳපළ ප්‍රවේශය හරහා ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර වෙළඳ හා ආර්ථික සබඳතා වැඩි දියුණු කිරීම. තවද තායිලන්තය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ හා ආයෝජන ප්‍රවාහ ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

වර්තමාන ද්වී පාර්ශවික වෙළඳ අගය 2020 වන විට ඇ. ඩො. බි. 1. 5 දක්වා තෙගුණ කිරීම

යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළඳ හා ආර්ථික සබඳතා වැඩි දියුණු කිරීමට එකඟ වන පරිදි භාණ්ඩ, සේවා, ආයෝජන සහ වෙනත් ක්ෂේත්‍ර සඳහා භාණ්ඩ සඳහා වරාය වෙළෙඳපොළ ප්‍රවේශය තුළින් ඉහළ නංවනු ඇත. මෙයින් තායිලන්තය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ හා ආයෝජන ප්‍රවාහයන් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම සිදු වේ. තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම හරහා වර්තමාන තක්සේරු වෙළඳ වටිනාකම ඇ. ඩොලර් බිලියන 1.5 දක්වා 2020 වන විට වර්ධනය කර ගැනීමට, ආර්ථික හැකියාවන් සහ අනුපූරක ආර්ථික ව්‍යුහයන් හඳුනා ගැනීම තුළින් ක්ෂේත්‍ර ගණනාවක දියුණු ආර්ථික සහයෝගීතාවයෙන් දෙපාර්ශවයටම හැකි වේ.

තායිලන්ත අගමැතිවරයාගේ සංචාරය අතර තුර, 2018 ජූලි 12 වන දින දෙරටේ රාජ්‍ය නායකයන් අතර නිදහස් වෙළෙඳ ගිවිසුම දියත් කිරීම පිළිබඳව පැවති සාකච්ඡාවෙන් පසුව, SLTFTA හි පළමු සාකච්ඡා වටය 2018 ජූලි 13 වනදා කොළඹ දී පැවතිණි. සාකච්ඡාවේ 1 වන වටය තුළ දෙපාර්ශ්වයම SLTFTA හි ව්‍යුහය, ක්‍රියාකාරී කණ්ඩායම් නවයක් පිහිටුවීම සහ ක්‍රියාකාරී කණ්ඩායම්වල විෂය පථයන් සහ SLTFTA රැස්වීම් සඳහා වන වැඩ සැලසුම් සම්බන්ධව එකඟතාවයකට එළඹිණි. SLTFTA හි දෙවන සාකච්ඡා වටය 2018 සැප්තැම්බර් 19-21 දක්වා තායිලන්තයේ බැංකොක් නුවරදී පැවැත්විණි.

2 වන වාරයේදී සියලුම ක්‍රියාකාරී කණ්ඩායම් (භාණ්ඩ වෙළෙඳාම, සම්භව රීති, සනීපාරක්ෂක සහ ශාක ආරක්ෂක(SPS) ක්‍රියාමාර්ග, වෙළෙඳ ප්‍රතිකර්ම, සේවා වෙළෙඳාම, ආයෝජන, නෛතික සහ ආයතනික ගැටළු) සාකච්ඡා පවත්වන ලදී.

සාකච්ඡා ආරම්භ කිරීමට පෙර වාණිජ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශයේ වෙළෙඳ සහ ආයෝජන දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය සහ වෙනත් ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ උපදේශක කමිටු, වෙළෙඳ මණ්ඩල, නිෂ්පාදන සංවිධාන යනාදිය සමග සාකච්ඡා සහ අදහස් විමසීම් පවත්වන ලදී. සමස්ථ සාකච්ඡා ක්‍රියාවලිය තුළ මෙම අදහස් විමසීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

2017 සැප්තැම්බර් මසදී කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශය විසින් තායිලන්තය සමග ඇති කරගැනීමට අපේක්ෂා කළ නිදහස් වෙළෙඳ ගිවිසුම සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට භාරගන්නා ලදී. එමෙන්ම, SLTFTA සම්බන්ධ සාකච්ඡා පැවැත්වීමට අනුමැතිය දෙන අතර අතිගරු ජනාධිපතිතුමාගේ සහ මුදල් හා ජනමාධ්‍ය ඇමතිවරයාගේ නිරීක්ෂණ අනුව වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව සහ විශේෂඥයින් හරහා මෙම ගිවිසුම හරහා ශ්‍රී ලංකාවට ලැබිය හැකි ප්‍රතිලාභ සම්බන්ධව අධ්‍යයනයක් කිරීමටද අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව, සාකච්ඡාවලට සමාන්තරව, මෙම නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ අධ්‍යයනය කිරීමට සහ රටට ලැබෙන ප්‍රතිලාභ උපරිම කරගැනීමට භාවිතා කළ හැකි පරිදි විවිධ අවස්ථාවන් සඳහා වන නිර්දේශ ලබාගැනීමට වැඩි දුර අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී. අධ්‍යයන කණ්ඩායම්වල නිර්දේශ 2019 මුල් භාගයේදී භාරදීමට අපේක්ෂා කෙරෙන අතර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.





## ➢ මැලේසියාව හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනය (MSLFTA)

2015 වන විට ශ්‍රී ලංකාව හා මැලේසියාව අතර ද්වි පාර්ශවික වෙළඳාම ඇ.ඩො.මි. 549.2 ඉක්මවා තිබුණ ද එසේම එය අඛණ්ඩව ඉහළ යමින් පැවතිය ද වෙළඳ ප්‍රවාහයන් නිතැතින් අසමමිතික වූ අතර ශ්‍රී ලංකාව වෙත වෙළඳ හිඟයක් පවතියි ද්වි පාර්ශවික වෙළඳ සබඳතා ඇරඹීමේ සිට ශ්‍රී ලංකාව සැලකිය යුතු වෙළඳ හිඟයක් අත් දකිමින් සිටියි. 2015 දී වෙළඳ හිඟය ආසන්න වශයෙන් ඇ.ඩො. 472.79 විය. තවද 2015 වන විට මැලේසියාව ශ්‍රී ලංකාවේ 6 වන විශාලතම ආනයන මූලාශ්‍රය වූ අතර ශ්‍රී ලංකාව වෙත වන මුළු ප්‍රවාහයන්ගෙන් 2.70%ක් එමගින් සැපයිනි.

ශ්‍රී ලංකාව වෙතින් මැලේසියාව වෙත සිදු කෙරෙන අපනයනයන්ගෙන් සැලකිය යුතු කොටසක් ඇඟලුම්, රබර් හා වතු අංශයන්ගෙන් වන අතර 2015 දත්ත අනුව ද්වි පාර්ශවික වෙළඳාමේ මුළු ප්‍රමාණයෙන් පිළිවෙලින් 25%, 21% හා 10% ක් සඳහා දායකත්වය සපයනු ලැබියි මීට අමතරව, මැලේසියාවෙන් සිදු කෙරෙන අපනයනයන් පුළුල් පරාසයක විහිදුණු අංශවල නිෂ්පාදනවලින් සමන්විත වේ ඇ.ඩො.මි. 7.7ක අගයක් ගන්නා පාම් තෙල් හා එහි කොටස් මුළු ද්වි පාර්ශවික ආනයනයන්ගෙන් 15%ක් වූ අතර මෙය දේශීය ඉල්ලුමෙන් 70%ක් විය. නිවර්තන කලාපීය දැව, පෝට්ලන්ඩ් සිමෙන්ති, සත්ව/එළවළු මේද 2015 වන විට වැදගත් වූ පාරිභෝගික භාණ්ඩ වේ.

කෙසේ වුවද, සැබැවින්ම ද්වි පාර්ශවික වෙළඳ සබඳතාව උපරිම මට්ටමකට ගෙන ඒම සඳහා ශ්‍රී ලාංකික නිෂ්පාදකයන් විසින් මැලේසියාව වෙත අපනයනය කෙරෙන භාණ්ඩවල ප්‍රමාණය හා ගුණාත්මකභාවය සැලකිය යුතු මට්ටමකට ඉහළ නැංවිය යුතුය. ප්‍රගතිය කරා යාම සඳහා ප්‍රමාණවත් අවස්ථා මෙන් ම බාධක තවමත් පවතියි.

එබැවින් යම් නිදහස් වෙළඳ ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා කිරීමට නම් මෙම රටවල් දෙක අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමෙහි ශක්‍යතාව මැන බැලීම මෙන්ම සහයෝගීතාව ඇති කරගත හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා හවුල් ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීම අවශ්‍ය වේ.

ද්වි පාර්ශවික වෙළඳාම හා ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සඳහා ආර්ථික හවුල්කාරීත්වය පිළිබඳ විමර්ශන පත්‍රිකාව 2016 නොවැම්බර් 17 දින මැලේසියාවෙන් එවන ලදී. නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා ඇරඹීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම සඳහා හවුල් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා එකඟතාව පළ කරමින් 2018.01.29 දින ශ්‍රී ලංකාව විසින් මැලේසියා රජය දැනුවත් කරන ලදී.

අධ්‍යයනය ඇරඹීම සඳහා ශ්‍රී ලංකාව විසින් හවුල් ශක්‍යතා අධ්‍යයන කණ්ඩායමක් පත් කිරීමට අවශ්‍ය විය.

## ➢ බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (BSLFTA)

2016 වන විට ශ්‍රී ලංකාව හා බංග්ලාදේශය අතර ද්වි පාර්ශවික වෙළඳාම ඇ.ඩො.මි. 141 ඉක්මවූ අතර මේවන විටත් එය අඛණ්ඩව ඉහළ යමින් පවතියි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට වාසි සහගත වන අයුරින් වෙළඳ අතිරික්තයක් පවතියි. වෙළඳාමෙහි වේගවත් වර්ධනය සමගම අපනයන පාරිභෝගික භාණ්ඩ සංයුතියෙහි ද වෙනසක් සිදු වී ඇත.

මීට අමතරව, ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) හා දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම SAFTA වැනි දැනට පවතින වෙනත් ගිවිසුම් මගින් කැපී පෙනෙන තීරු බදු අඩු කිරීමක් සිදු කර ඇති නමුත් හවුල්කාර රටවල් දෙක විසින්ම ඒවා ඌණ උපයෝජනය කෙරේ. එබැවින් නිදහස් වෙළඳ ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා කිරීමට අවශ්‍ය නම් දෙරට අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමෙහි ශක්‍යතාව ඇගයීම මෙන් ම සහයෝගීතාව ඇති කරගත හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා හවුල් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම අවශ්‍ය වේ.

ද්වි පාර්ශවික වෙළඳාම හා ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා 2017 ජූලි 14 දින බංග්ලාදේශයේ ඩකාහි දී ශ්‍රී ලංකාව හා බංග්ලාදේශය අතර ආර්ථික හවුල්කාරීත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

- එකඟ වූ අන්තර්ගත වගුව මත පදනම්ව ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනයක් (JFS) දෙපාර්ශ්වය මගින්ම ආරම්භ කරන ලදී.
- දත්ත විශ්ලේෂණ මාදිලිය මිලදී ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කළ අතර එම මෘදුකාංගය මිලදී ගනු ලැබිණි.
- 2019 පෙබරවාරි මස JFS සම්පූර්ණ කෙරෙනු ඇත.
- 2019 මාර්තු මුලදී JFS වාර්තාව ඉදිරිපත් කෙරෙනු ඇත.

## 4.3 ආර්ථික සහයෝගීතාව

### 4.3.1 උපායමාර්ගික හවුල්කරුවන් සමග වන ආර්ථික සහයෝගීතාව

රජය විසින් නියම කර ඇති ආයෝජන හා අපනයන ඉලක්ක ළඟා කර ගැනීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, අපගේ අපනයන හා වෙළඳපළ ගමනාන්ත විවිධාංගීකරණය, අපනයන ධාරිතාව ඉහළ නැංවීම සහ අපගේ පද්ධතිය තුළට සංවර්ධිත රටවල නවීන නිෂ්පාදන තාක්ෂණයන් ඇතුළත් කිරීම ශ්‍රී ලංකාව විසින් සිදු කළ යුතුවේ. ලොව විවිධ රටවල් සමග ආර්ථික සහයෝගීතාව ශක්තිමත් කිරීම මගින් වෙළඳ හා ආයෝජන ක්ෂේත්‍රයන්ගේ වඩාත් නිදහස් සහයෝගීතාවයකට හා තාක්ෂණය හුවමාරු කර ගැනීමට මග සලසනු ඇත. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් ජපානය, යුරෝපා සංගමය, දකුණු කොරියාව, තායිලන්තය, ඕස්ට්‍රේලියාව, හංගේරියාව හා ඉන්දියාව ආදී රටවල් සමග උපායමාර්ගික හා කේන්ද්‍රීය ආර්ථික කටයුතු සිදු කිරීමෙන් නව්‍ය ද්වි පාර්ශවික සහයෝගීතා උපායමාර්ගයක් භාවිතා කරන ලදී.

### ➢ චීනය සහ ශ්‍රී ලංකාව අතර ආයෝජන, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය

2016 වසරේදී ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් බිලියන 4.2 ක් වටිනා භාණ්ඩ ප්‍රමාණයක් චීනයෙන් ආනයනය කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ සම්පූර්ණ ආනයනයෙන් 22% කි. 2016 වසරේදී චීනයට සිදු කළ අපනයනයන්ගේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 199.15 කි. 2016 අප්‍රේල් 7 වන දින චීනය හා ශ්‍රී ලංකාව විස්තීරණ ආයෝජන, ආර්ථික හා තාක්ෂණික ගිවිසුමට අදාල අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. එම ගිවිසුමට එලඹෙනු ලැබුයේ ආයෝජන,ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය සඳහා වන රාමු ගිවිසුම හා මධ්‍යකාලීන හා දිගුකාලීන සංවර්ධන සැලැස්මට 2017 මැයි මාසයේ දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන සමූහාණ්ඩුව විසින් අත්සන් කරනු ලැබීමෙන් පසුවයි. මෙම සැලසුම් සංක්ෂිප්තයෙහි අරමුණු වන්නේ ද්විපාර්ශ්වික ආයෝජන, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව සංවර්ධනය, සහයෝගීතාවය පවතින ක්ෂේත්‍රයන් පුළුල් කිරීම, ද්විපාර්ශ්වික සහයෝගිතා යාන්ත්‍රණය නවීකරණය කිරීම, ද්විපාර්ශිවික ආයෝජනයන්ගේ මට්ටම් සහ ගුණාත්මක බව වැඩි කිරීම, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව, අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහ සම දිනුම් තත්ව ලබාගැනීම, දෙරට අතර සමාජ, ආර්ථික සහ මිත්‍රශීලී සහයෝගිතාවය වර්ධනය කිරීම සහ චීනය සහ ශ්‍රී ලංකාව අතර උපක්‍රමික හවුල්කාරීත්වය වැඩි දියුණු කරගැනීම සඳහා ශක්තිමත් පදනමක් දැමීම යනාදියයි.

- රාමු ගිවිසුම යටතේ එන සහයෝගිතා ක්ෂේත්‍රයන් වනුයේ කෘෂිකර්මය, නිෂ්පාදනය, ප්‍රවාහන යටිතල පහසුකම්, පොදු වැඩ, බලශක්තිය සහ විදුලි බලය, තොරතුරු සහ සන්නිවේදනය හා සංචාරක කර්මාන්තයයි.
- මෙම සහයෝගීතාවය සඳහා වූ විෂය පථයන්ට අදාල ව්‍යාපෘතීන් සහ කාර්යයන් එම රාමු ගිවිසුම යටතේ වඩාත් පුළුල්ව ක්‍රියාත්මක කෙරෙනු ඇති සැලසුම් සංක්ෂිප්තය 2017-2021 දක්වා වූ වසර 5ක කාලය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මකට ඇතුළත් වේ.
- මේ වන විට විවිධ රජයේ අමාත්‍යාංශ යටතේ ව්‍යාපෘති 25 ක් ක්‍රියාත්මක වෙන අතර ඉන් සමහරක් දැනටමත් සම්පූර්ණ කර ඇත.

## ➢ හංගේරියා - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගීතා ගිවිසුම

### මැදිහත් වන ක්ෂේත්‍ර

- ජල කළමනාකරණය
- යටිතල පහසුකම් සංවර්ධනය
- ප්‍රවාහනය හා ඊට අදාළ යටිතල පහසුකම්, කාර්ය සම්පාදනය
- ස්වභාවික සම්පත් හා පරිසරය ආරක්ෂා කිරීම
- බලශක්තිය
- කෘෂිකර්මාන්තය, ආහාර කර්මාන්තය හා ආහාර සුරක්ෂිතතාව
- සෞඛ්‍යාරක්ෂණය හා සෞඛ්‍ය කර්මාන්තය
- තොරතුරු තාක්ෂණය හා විදුලි සංදේශ
- විද්‍යාව හා තාක්ෂණය
- පර්යේෂණ හා සංවර්ධන
- අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය
- සංචාරක කර්මාන්තය
- බැංකුකරණය, ආයෝජන හා මූල්‍ය
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්

ශ්‍රී ලංකාව හා හංගේරියාව දෙරට අතර වෙළඳාම, ආයෝජනය හා ආර්ථික සහයෝගීතාවට අදාළව නව සබඳතා ඇති කර ගනිමින් සිටියි. 2017 දෙසැම්බර් 22 දින හංගේරියා - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගීතා ගිවිසුමට අත්සන් තබන ලදී. ගිවිසුමෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව හා හංගේරියාව අතර හවුල් කොමිෂන් සභාවක් ස්ථාපිත කරනු ඇත. හවුල් කොමිෂන් සභාවේ පළමු රැස්වීම 2019 අප්‍රේල් මස පවත්වනු ඇත.

## ➢ ශ්‍රී ලංකා - දකුණු කොරියා ආර්ථික සහයෝගීතාව

### මෙහිදී ප්‍රධාන අරමුණු වන්නේ

- ද්වි පාර්ශවික වෙළඳාම හා ආර්ථික සබඳතා වැඩි දියුණු කිරීම
- දෙරට අතර වෙළඳාම, ආයෝජන හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා නව මාර්ග සෙවීම
- සමීප කාර්මික සහයෝගීතාව ප්‍රවර්ධනය හා දෙරට ව්‍යවසායකයන් අතර ජාලකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම

### එමඟින් පහත දැක්වෙන ප්‍රතිඵල අත්කර ගැනීමට අපේක්ෂිතය

- ප්‍රවර්ධනය කරන ලද ද්වි පාර්ශවික ආයෝජන
- වැඩි දියුණු කරන ලද ද්වි පාර්ශවික වෙළඳාම
- හුවමාරු කර ගන්නා ලද සංවර්ධන අත්දැකීම්
- සංවර්ධිත නව කර්මාන්ත
- ව්‍යාපාර සබඳතා වැඩි දියුණු කිරීම
- තාක්ෂණය හුවමාරු කර ගැනීම
- ආර්ථික අංශ සංවර්ධනය කිරීම තුළින් රැකියා අවස්ථා නිර්මාණය කිරීම

ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර දිගු කලක් පුරා පැවතෙන මිත්‍ර සබඳතා හා සියවස් ගණනාවක් පුරා පැවතෙන සංස්කෘතික සබඳතා මත පදනම් වූ ඓතිහාසික බැඳීම් පවතියි.

අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා ආර්ථික ක්ෂේත්‍රයේ සහයෝගීතාව ශක්තිමත් කිරීමට 2017 නොවැම්බර් මස දෙරට අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමට අත්සන් තබන ලද අතර එය ආයෝජන හවුල්කාරීත්වයන්, වෙළඳ සබඳතා, සංචාරක ප්‍රවර්ධනය හා කාර්මික සහයෝගීතාව යන ක්ෂේත්‍රවලින් සමන්විත විය. ශ්‍රී ලංකා - දකුණු කොරියා ආර්ථික සහයෝගීතා ගිවිසුම යටතේ වූ පළමු හවුල් කොමිෂන් සභාව 2018 ජූනි 28 දින කොළඹ දී පැවැත්විණි.

## ➢ ශ්‍රී ලංකා - ඉන්දුනීසියා ආර්ථික සහයෝගීතාව

2018 ජනවාරි 24 - 25 තුළ ඉන්දුනීසියානු ජනාධිපතිතුමා හා ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා අතර ද්වි පාර්ශවික සාකච්ඡා පවත්වන ලදී. වසර 65ට පෙර නිල රාජතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම පිළිබඳ මතක් කරමින් නායකයන් දෙපළ විසින් දෙරට අතර පවතින ශක්තිමත් මිත්‍ර සබඳතා පිළිබඳ තෘප්තිමත්භාවය පළ කරන ලද අතර එම සබඳතා තවදුරටත් ඒකාබද්ධ කිරීමට හා ව්‍යාප්ත කිරීමට එකඟතාව පළ කරන ලදී.

නායකයන් දෙපළ විසින් මෑතදී ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියාව අතර සිදු කෙරුණු උසස් මට්ටමේ සංචාරයන් පිළිබඳ සතුට පළ කරන ලද අතර මෙම සංචාර මගින් ගම්‍යතාව තහවුරු කිරීමට තීරණය කරන ලදී.

ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියාව අතර වන කැපී පෙනෙන සමුද්‍ර සබඳතාව හඳුනා ගනිමින් නායකයන් දෙපළ විසින් වෙළඳාම හා ආයෝජනයට අදාළ අන්‍යෝන්‍ය සබැඳියාවන් පිළිබඳ පුළුල් පරාසයක විහිදුණු ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර ආර්ථික සහයෝගීතාව පුළුල් හා ශක්තිමත් කිරීම සඳහා ඔවුන්ගේ බැඳීම යළි තහවුරු කරන ලදී. ද්වි පාර්ශවික ආර්ථික ක්ෂේත්‍රය තුළ පවතින භාවිතා නොකරන ලද හැකියාවන් ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාව ඔවුන් විසින් පිළිගන්නා ලද අතර වෙළඳාම හා ආයෝජනය පිළිබඳ හවුල් ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

වෙළඳාම හා ආයෝජනය පිළිබඳ හවුල් ක්‍රියාකාරී කණ්ඩායම පහත අරමුණු යටතේ ක්‍රියාත්මක වීම අපේක්ෂිතය.

- වඩා සමීප වෙළඳ හා ආයෝජන සබඳතා ඇති කර ගැනීම
- වෙළඳාම හා ආයෝජනයට අදාළ ගැටළු සඳහා පිළියම් ලබාදීම
- වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය
- ඉන්දුනීසියාව හා ශ්‍රී ලංකාව අතර වෙළඳ හා ආයෝජන ප්‍රවාහ වේගවත් කිරීම සඳහා අන්‍යෝන්‍ය සබැඳියාවන් සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම්ව හැකියාවැති අංශවල හා/ හෝ ක්ෂේත්‍රවල සහයෝගීතාව දිරිගැන්වීම

## ➤ ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර උපායමාර්ගික ආර්ථික හවුල්කාරීත්වය

### මේ යටතේ ප්‍රධාන අරමුණු වන්නේ,

- වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය හා පහසුකම් සැලසීම
- පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ තාක්ෂණික සහයෝගීතාව ශක්තිමත් කිරීම
- ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය හා වැඩි දියුණු කිරීම
- තොරතුරු හුවමාරු කර ගැනීම, අත්දැකීම් හුවමාරු කර ගැනීම හා දැනුමට අදාළව සහායෝගීතාව දිරිගැන්වීම
- හවුල්කාරීත්වය ඉහළ නැංවීම හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගේ ධාරිතා ශක්තිමත් කිරීම මගින් ආර්ථිකයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

### එමගින් පහත දැක්වෙන ප්‍රතිඵල අත්පත්කරගැනීමට අපේක්ෂිතය

- බඳු නොවන බාධක ඉවත් කිරීම
- වෙළඳ අංශයන්හි කාර්යක්ෂමතාව හා තරගකාරීත්වය ඉහළ නැංවීම
- ආයෝජන සඳහා නව අවස්ථා ඇති කිරීම
- තාක්ෂණය හා සංවර්ධන අත්දැකීම් හුවමාරු කර ගැනීම
- නව දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීම
- ව්‍යාපාර සබඳතා වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර උපායමාර්ගික ආර්ථික හවුල්කාරීත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම තායිලන්තයේ ගරු අග්‍රාමාත්‍යවරයාගේ සංචාරය අතරතුර 2018 ජූලි 12 දින අත්සන් තබන ලදී.

අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම මගින් 1955 සිට ස්ථාවර ලෙස ශක්තිමත් ද්වි පාර්ශවික සබඳතා පවත්වාගෙන යන ලද ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර වූ දිගුකාලීන රාජ්‍යතාන්ත්‍රික හා ආර්ථික සබඳතාව තවදුරටත් ශක්තිමත් කරනු ඇත. 1997 සිට ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර ද්වි පාර්ශවික වෙළඳාමෙහි නොවෙනස් ඉහළ යාමක් සිදුවිය.

ආයෝජනය, කෘෂිකර්මාන්තයේ සංවර්ධනය, ධීවර කටයුතු ප්‍රවර්ධනය හා පහසුකම් සැලසීම, සංචාරක ප්‍රවර්ධනය සහ තොරතුරු තාක්ෂණ අංශය ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධනය ආදී ක්ෂේත්‍ර අවබෝධතා ගිවිසුමට ඇතුළත් වේ. මෙම හවුල් සහයෝගීතාවය මගින් ග්‍රාමීය ප්‍රජාවන්ට හිතකර සාමාජීය හා ආර්ථික තත්වයන් තවදුරටත් වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට කැපී පෙනෙන අයුරින් උපකාරී වනු ඇත.



## ➢ ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමුව පිළිබඳ ගිවිසුම

### මේ සඳහා පදනම ඇති වුයේ පහත සඳහන් සංචාරයන් ගෙනි

- 2017 පෙබරවාරි මස ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍යවරයාගේ ඕස්ට්‍රේලියානු සංචාරය
- 2017 මැයි මස ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයාගේ ඕස්ට්‍රේලියානු සංචාරය
- 2017 නොවැම්බර් මස ඕස්ට්‍රේලියාවේ අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය

### යෝජිත ක්‍රියාකාරකම්

- සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය හා ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් සමග වෙළඳාම හා ආයෝජනය පිළිබඳ කමිටුවක් ස්ථාපිත කිරීම
- දෙරට අතර වෙළඳාම හා ආයෝජනය ශක්තිමත් කිරීම සඳහා ද්වි පාර්ශවික වෙළඳ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම

මැදිහත්වීම සඳහා වන ක්ෂේත්‍ර■ කාෂි ව්‍යාපාර, ආහාර පාන, සංචාරක ව්‍යාපාරය හා ආගන්තුක සත්කාරය, අධ්‍යාපන සේවා, බලශක්තිය හා ඛණිජ, ස්මාර්ට් යටිතල පහසුකම් (ස්මර්ට් ඉන්ෆ්‍රස්ටෲජටුරේ, නිෂ්පාදනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන්, රෙදිපිළි හා ඇඟලුම්, රබර් හා ධීවර කටයුතු.

ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමුව යටතේ පළමු හවුල් කොමිෂන් සභාව 2018 අප්‍රේල් 19 දින කැන්බරාහි දී පවත්වන ලදී. මෙම රැස්වීමෙන් පසුව පහත දැක්වෙන ප්‍රධාන කටයුතු හඳුනා ගැණිනි.

- වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය සඳහා ඉහළ මට්ටමේ සංචාර දිරිමත් කිරීම
- නිරෝධායන පද්ධති අතර වැඩි අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ගිවිසුම් හා වෙනත් සහතික පිළිබඳ සලකා බැලීම
- ශ්‍රී ලංකාවේ පළතුරු හා එළවළු අපනයනය සහ ඖෂධීය නිෂ්පාදන අපනයනය සඳහා හඳුනා ගත් ප්‍රමුඛතා අයිතම සඳහා නිරෝධායන නිෂ්කාෂණය පිණිස වේගවත් යෙදුම් පිරිසැකසීම සඳහා ඇතුළත් කිරීම
- විශේෂයෙන් සංචාරක කර්මාන්තය සඳහා යෙදවුම් වන තීරු බදුවලට අදාළ ප්‍රගාමී අඩු කිරීම් පිළිබඳ සලකා බැලීම
- අපනයන සඳහා තීරු බදු වෙනස්වීම (විශේෂයෙන් කෘෂිකාර්මික තීරු බදු) සඳහා පිළියම් ලබා දීම හා එම තත්වය අවම කිරීම සඳහා වන ක්‍රම පිළිබඳ සලකා බැලීම
- සියළු දෙනා එකම රීති මාලාවකට යටත්වන බවට (ලෙවෙල් ප්ලයින්ග් ෆීල්ඩ්) වග බලා ගැනීම සඳහා විශාල ප්‍රසම්පාදන සඳහා තරඟකාරී ටෙන්ඩර් ක්‍රියාවලීන් තහවුරු කිරීම
- තොරතුරු හා සන්නිවේදන අංශය තුළ වාණිජ සබඳතා ඇති කිරීම
- කෘෂිකර්මාන්තය හා ජලජීවී වගාවට අදාළව වැඩි සහයෝගීතාවක් ඇති කිරීම
- තාක්ෂණික රෙදිපිළි නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණය හා මුතු වගාව ආදී ක්ෂේත්‍රවලට අදාළව ඕස්ට්‍රේලියානු ආයෝජන හා හවුල් ව්‍යාපාර දිරිමත් කිරීම
- නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා දේශීය උපදේශනය ඇතුළුව ආර්ථික ප්‍රතිසංස්කරණ හා වෙළඳ ලිහිල්කරණය පිළිබඳ ඕස්ට්‍රේලියාවේ අත්දැකීම් හුවමාරු කර ගැනීම හා ඵලදායීතා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම





## ➢ ආර්ථික ව්‍යාපෘති තුළින් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සහයෝගීතාව සඳහා වන අවබෝධතා ගිවිසුම

### අරමුණු

සමානාත්මතාව හා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත පදනම්ව දෙරටේ ජනතාවගේ යහපත උදෙසා හවුල් ව්‍යාපාර හා වෙනත් සහයෝගී ක්‍රියාකාරකම් හරහා ප්‍රගාමී අයුරින් වැඩි ආර්ථික, ආයෝජන හා සංවර්ධන සහයෝගීතාවක් ළඟා කර ගැනීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

කලාපය තුළ ආර්ථික සෞභාග්‍යය ප්‍රවර්ධනය සඳහා සංවර්ධන සහයෝගීතාව හා ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම. ආර්ථික ව්‍යාපෘති සම්බන්ධයෙන් වන සහයෝගීතාව සඳහා ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය අතර 2017 අප්‍රේල් මස අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙමගින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල් වන පහත දැක්වෙන ආර්ථික ව්‍යාපෘතිවලට අදාළ සහයෝගීතාව සඳහා රාමුවක් සපයනු ලැබේ.

අවබෝධතා ගිවිසුම මගින් සාම්ප්‍රදායිකව දෙරට අතර පවතින සමීප මිත්‍ර සබඳතා සහ සිය ජනතාවගේ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා වැඩි දියුණු වූ ආර්ථික, ආයෝජන හා සංවර්ධන සහයෝගීතාව හරහා ද්වී පාර්ශවික සබඳතා වැඩි දියුණු කිරීම සඳහා වන ඔවුන්ගේ අඛණ්ඩ ප්‍රයත්නයන්□ යළි තහවුරු කරනු ලැබේ.

ඉන්දියාවේ සහයෝගය සහිතව ශ්‍රී ලංකාව තුළ යටිතළ පහසුකම්, දුම්රිය, ඛණිජ තෙල්, ජල සම්පාදනය, සෞඛ්‍යය, නිවාස හා ප්‍රවාහන යන ක්ෂේත්‍රවල ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. වැඩි සහයෝගීතාවක් හරහා ශ්‍රී ලංකාවේ සම්බන්ධතාව හා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම මගින් ශක්තිමත් ආර්ථික කටයුතු කරා මග පාදමින් දෙරට අතර වෙළඳාම හා ආයෝජනයට අදාළව ශක්තිමත් හවුල්කාරීත්වයක් ඇති කිරීමට පහසුකම් සලසනු ඇත.

### ප්‍රගතිය හා මීළඟ පියවර

- 500 MW ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු පර්යන්ත (LNG) විදුලි බලාගාරය ඉදිකිරීමට අදාළ කටයුතු කෙරෙමින් පවතියි.

  (අදාළ ස්ථානය ලෙස කෙරවලපිටිය හඳුනා ගන්නා ලදී. ශ්‍රී ලාංකික හා ඉන්දියානු පාර්ශවයන්ගෙන් සමන්විත හවුල් ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් සාකච්ඡා පවත්වනු ලැබේ.)

- ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු පර්යන්තය (LNG) සහ පාවෙන ස්වාභාවික වායු පර්යන්තය - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි. (කොළඹ වරායේ බටහිර දියකඩනය මේ සඳහා තෝරාගෙන ඇති ශ්‍රී ලංකාව, ඉන්දියාව හා ජපාන ආයතන අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇත)

- සාම්පූර්හි මෙගා වොට් 50ක ධාරිතාවයෙන් යුතු සූර්ය විදුලි බලාගාරය - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි (ශ්‍රී ලාංකික හා ඉන්දියානු පාර්ශවයන්ගෙන් සමන්විත හවුල් ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් සාකච්ඡා පවත්වනු ලැබේ)

- ත්‍රිකුණාමලේ තෙල් ටැංකි සංකීර්ණය එක්ව සංවර්ධනය කිරීම - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවති. (හවුල් කාර්යයක් ලෙස මෙම සංවර්ධනය සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී)

- ත්‍රිකුණාමලයේ වරායක්, ඛණිජතෙල් පිරිපහදුවක් හා වෙනත් කර්මාන්ත සංවර්ධනය කිරීම - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි

- මාර්ග සංවර්ධන ව්‍යාපෘති - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි

- දුම්රිය අංශයේ සංවර්ධනය - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි

- තාක්ෂණය ඇතුළුව කෘෂිකර්මාන්තය හා පශු සම්පත් අංශය - ආර්ථික සහයෝගීතාව හා ජල කළමනාකරණය - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි (ශ්‍රී ලාංකික පර්ශවකරුවන් විසින් ඉන්දියානු පාර්ශවකරුවන් වෙත සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී)

- කෘෂි පාදක කර්මාන්ත ප්‍රවර්ධනය - අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතියි





## ➢ ශ්‍රී ලංකා - චෙක් ජනරජය අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව

අරමුණ

- ද්වි පාර්ශවික හා ආර්ථික සබඳතා වැඩි දියුණු කිරීම
- අදාළ රටවල්වල ද්වි පාර්ශවික ආයෝජන වර්ධනය සඳහා පහසුකම් සැලසීම හා ආර්ථික සහ ආයෝජන අවස්ථා හඳුනා ගැනීම
- දෙරටෙහි සමීප වෙළඳ සහ කර්මාන්ත සහයෝගීතාව ප්‍රවර්ධනය හා ව්‍යාවසාකයන් අතර ජාලකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම
- අදාළ වෙළඳ හා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ දෙරටෙහි පුද්ගලික අංශයන් අතර අවබෝධතාව ප්‍රවර්ධනය කිරීම
- අන්‍යෝන්‍ය පිළිබැඳියාවන්ට අදාළ ක්ෂේත්‍රයන්හි සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම

අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා ආර්ථික අංශයේ සහයෝගීතාව ශක්තිමත් කිරීමට 2018 පෙබරවාරි 07 දින දෙරට අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව පිළිබඳ ගිවිසුමක් අත්සන් තබන ලද අතර එමගින් ද්වි පාර්ශවික වෙළඳාම, ආයෝජනය හා ආර්ථික සබඳතා ප්‍රවර්ධනය සඳහා හවුල් කමිටුවක් ස්ථාපිත කෙරිණි.

ද්වි පාර්ශවික වෙළඳාම හා ආර්ථික සබඳතා ඉහළ නැංවීම, ද්වි පාර්ශවික ආයෝජන වර්ධනය සඳහා පහසුකම් සැලසීම සහ දෙරටේ ම ආර්ථික හා ආයෝජන අවස්ථා හඳුනා ගැනීම, සමීප වෙළඳ හා කාර්මික සහයෝගීතාව ප්‍රවර්ධනය හා දෙරටේ ම ව්‍යවසායකයන් අතර ජාලකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම වැනි ක්ෂේත්‍ර මෙම ගිවිසුමට ඇතුළත් වේ.

දෙරට අතර අන්‍යෝන්‍ය සහයෝගය මගින් ද්වි පාර්ශවික වෙළඳ හා ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු වනු ඇති අතර විදේශ අයෝජන පාලනය කෙරෙන නීති හා රෙගුලාසි පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම හරහා ආයෝජන ප්‍රවාහ සඳහා අවස්ථා නිර්මාණය වීම ද සිදු වනු ඇත.

නව ආකාරයේ ගතිකත්වයන් කෙරෙන් නව ප්‍රතිලාභ ලබා ගැනීමට දෙරටට ම අවස්ථාව සැලසෙන වේදිකාවක් මත ආයෝජනයේ සිට විස්තෘත ද්වි පාර්ශවික හුවමාරු හා සහයෝගීතාව දක්වා විහිදුණු මිත්‍ර සබඳතා ව්‍යාප්ත කිරීම සඳහා දෙරට ම එකඟතාව පළ කරන ලදී.

## ➢ ජපන් - ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ ඉදිරි සැලැස්ම

### අරමුණු

ජපන් සමාගම් වෙතින් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා විනිවිදභාවය හා යහ පාලනය තහවුරු කරමින් වඩාත් හිතකර ආයෝජන වාතාවරණයක් නිර්මාණය කිරීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

අනාගතයේ දී වියහැකි දේ හා වඩා යහපත් තත්වයන් පිළිබඳ සලකා ඍජු ජපන් ආයෝජන ප්‍රවර්ධනය කිරීම් එසේ ම කේන්ද්‍රීය යටිතළ පහසුකම් සංවර්ධනය, ඇඩි සීමාහරණය හා ආකර්ෂණය දිරි දීමනා වැනි මූලාරම්භයන් මගින් ශ්‍රී ලංකාව තුළ හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම් ශ්‍රී ලංකාව තුළ වැඩි දියුණු වන ව්‍යාපාර පරිසරයක් කෙරෙහි සහාය හා සහයෝගය ලබාදීම හා වර්තමාන හා භව්‍ය ජපන් ආයෝජකයන් සඳහා පහසුකම් සැලසීම.

ජපානය විසින් ශ්‍රී ලංකාවේ තවදුරටත් සිදු කෙරෙන ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ ඉදිරි සැලැස්ම ශ්‍රී ලංකා - ජපන් ආර්ථික ප්‍රතිපත්ති සංවාදයේ ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකා - ජපන් ආර්ථික ප්‍රතිපත්ති සංවාදය යෝජනා කෙරුණේ ශ්‍රී ලංකාව හා ජපානය අතර විස්තීර්ණ හවුල්කාරීත්වය සඳහා වන ස්ථාවර ආර්ථික ප්‍රයත්නය ක්‍රියාවට නැංවීම අරමුණු කොටගෙන 2015 ඔක්තෝම්බර් මස ගරු අග්‍රාමාත්‍යවරයාගේ ජපන් සංචාරය අතරතුර නිකුත් කෙරුණු දෙරට අතර විස්තීර්ණ හවුල්කාරීත්වයක් පිළිබඳ හවුල් ප්‍රකාශය මගිනි.

ඒ අනුව ශ්‍රී ලංකාව සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් ජපන් ආර්ථික ප්‍රතිපත්ති සංවාදය ඇති කරන ලද්දේ භව්‍ය ආයෝජන හා ආයෝජන හවුල්කාරීත්වයන් උපායමාර්ගික ලෙස හඳුනා ගැනීමට වන අතර එහි අරමුණ වූයේ ජපානයේ උසස් මට්ටමේ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමයි. මේ වන විට ක්‍රියාකාරී කණ්ඩායම රැස් වී එමගින් 2017 අප්‍රේල් මස ජපන් - ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන ඉදිරි සැලැස්ම සකස් කරන ලදී.

### ප්‍රගතිය හා මීළඟ පියවර

- තරඟකාරී ආයෝජන හා ව්‍යාපාර පරිසරය ළඟා කර ගැනීම
- ජපන් කාර්මික නගර හෝ ජපන් ආයෝජන මිත්‍ර කාර්මික ප්‍රදේශවල හැකියාවන් ගවේෂණය කිරීම (සම්පූර්ණ කර ඇත)
- බෙදාහැරීමේ හා වෙළඳ භාණ්ඩ කර්මාන්තය සංවර්ධනය සහ ජපන් සිල්ලර භාණ්ඩ හඳුන්වා දීම සඳහා ජපන් ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රම සොයා බැලීම. (සාකච්ඡා කෙරෙමින් පවතියි)

- ජපන් කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මගින් සිදු කෙරෙන ආයෝජන ශක්තිමත් කිරීම හා සහාය ලබා දීම (සිදු කෙරෙමින් පවතියි)

- ආයෝජන බාධක අවම කිරීම හා ඉවත් කිරීම (සිදු කෙරෙමින් පවතියි)

- ආයෝජන දිරි දීමනා ව්‍යාප්ත කිරීම (සම්පූර්ණ කර ඇත)

- සහාය ලබා දෙන කර්මාන්ත ආරක්ෂා කිරීම හා ව්‍යාපාර සබඳතා වර්ධනය කිරීම (සිදු කෙරෙමින් පවතියි)

**කාර්ය සම්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා රේගු හා කාර්ය සම්පාදන මෙහෙයුම් වැඩි දියුණු කිරීම**

- ජපන් සමාගම් සඳහා රේගුවට අදාළ වේගවත් හඳුනා ගැනීම (Customs Fast Track) හඳුන්වා දීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම (සාකච්ඡා කෙරෙමින් පවතියි)

- රේගු හා කාර්ය සම්පාදන මෙහෙයුම් වැඩි දියුණු කිරීම (සිදු කෙරෙමින් පවතියි)



**ශ්‍රී ලංකාව හා ජපානය අතර ඵලදායී සංවාදයක් හා ගැටළු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම**

- වාර්ෂිකව රාජ්‍ය - පෞද්ගලික සංසදය පැවැත්වීම (සිදු කෙරෙමින් පවතියි)

- JICA මගින් සිදු කරන ලද ආයෝජන වාතාවරණය පිළිබඳ දත්ත රැස් කිරීමේ සමීක්ෂණය (අවසන් කර ඇත)

- තොරතුරු හුවමාරු කිරීමේ ද්වී පාර්ශවික යාන්ත්‍රණය ස්ථාපිත කිරීම (සිදු කෙරෙමින් පවතියි)
- බදු හා තීරු බදු සඳහා ව්‍යවස්ථාපිත නියමිත දිනය නියම කිරීම (සාකච්ඡා කෙරෙමින් පවතියි)



## ➢ යුරෝපා සංගමය සමග ආර්ථික සහයෝගීතාවය වර්ධනය

**අරමුණු**

- ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය අතර සබඳතා ශක්තිමත් කිරීම
- යුරෝපා සංගමය වෙත සිදු කෙරෙන අපනයනයන්ගේ අගය ඉහළ නැංවීම
- ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කිරීම හා පවතින ආයෝජන ආරක්ෂා කර ගැනීම, තවත් ආයෝජන ආකර්ෂණය කර ගැනීම

ශ්‍රී ලංකාවේ මුළු අපනයනයන්ගෙන් 29%ක් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම 2017 යුරෝපා සංගමය වෙත යොමු කෙරුණු අතර වාර්තාගත අගය ඇ.ඩො.බි. 3.3කි. 2017 දී යුරෝපා සංගමය වෙත සිදු කෙරුණු ප්‍රධාන අපනයනයන් ඇඟලුම් (60%), රබර් නිමි භාණ්ඩ (9%), ඉංජිනේරුමය නිෂ්පාදන (4.6%), ආහාර පාන සහ දුම්කොළ (3.3%), පොල් කටු නිෂ්පාදන (3.1%), තේ පැකට්ටු (2.6%), ආහාරයට ගත හැකි මත්ස්‍ය නිෂ්පාදන (2%) යනාදියෙන් සමන්විත වේ.

ආර්ථික සබඳතාව ශක්තිමත් කිරීම සඳහා යුරෝපා සංගමය සමග ප්‍රධාන සංසද දෙකක් පවත්වන ලදී. වෙළඳාම පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා හවුල් ක්‍රියාකාරී කණ්ඩායම සහ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජක සංවාදය.

**වෙළඳාම හා ආර්ථික සබඳතා පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා හවුල් ක්‍රියාකාරී කණ්ඩායම**

ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමයේ රටවල් අතර ආයෝජන, වෙළඳාම හා GSP+ අදාළ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමේ ප්‍රධාන වේදිකාව යුරෝපා සංගම් - ශ්‍රී ලංකා හවුල් ක්‍රියාකාරී කණ්ඩායම වේ. ක්‍රියාකාරී කණ්ඩායම 2018 ජූලි 05 දින කොළඹ දී රැස් විය.



**යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජක සංවාදය**

මෙහි අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ යුරෝපා ආයෝජකයන්ගේ ආයෝජන හා වෙළඳාමට අදාළ ගැටළු නිරාකරණය කර ගැනීම

## ➢ යුරෝපා සංගමයේ වරාය පොදු ක්‍රමය සහ අනෙකුත් වරාය ක්‍රමයන් හි වර්ධනයන් (GSP+)

### ▪ යුරෝපා සංගම් වෙළඳපළ තුළ GSP සහ වෙළඳ කාර්යසාධනය

2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට GSP ලැබුන අතර, 2016 වසරට සාපේක්ෂව, ශ්‍රී ලංකාව යුරෝපා සංගමය තුළ තම අපනයනයන් වැඩි කරගෙන ඇත්තේ 7% ක් පමණි. 2017 සිට 2018 දක්වා, යුරෝපා සංගම් වෙළෙඳපොළ තුළ අපනයන වර්ධනය 5% ක් පමණක් වෙයි. ප්‍රධාන නිෂ්පාදන වර්ගයන් සලකන විට පෙනී යන පරිදි 2017 සිට 2018 දක්වා යුරෝපා වෙළෙඳ සංගමයට කළ අපනයනයන් ඇඟලුම් ක්ෂේත්‍රය තුළ 4% කින්ද, ආහාරයට ගත හැකි මත්ස්‍ය නිෂ්පාදන 41% කින්ද, විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන 4% කින්ද, වෙනත් නිෂ්පාදන 8% කින්ද, වැඩි වී ඇති 2017 සිට 2018 දක්වා, ජර්මනිය තුළ 13% කින්ද, ඉතාලිය තුළ 9% කින්ද, නෙදර්ලන්තය තුළ 16% කින්ද, යනාදී ලෙස අපනයනයන් වැඩි වී තිබුණද යුරෝපා සංගමය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන රට වන එක්සත් රාජධානියට කළ අපනයනයන් 5% කින් පහළ බැස ඇත.







## GSP+ සහනයට අදාළ බැඳීම් සපුරාලීම

යුරෝපා සංගමයේ GSP සහනය ශ්‍රී ලංකාව වෙත පිරිනමන ලද්දේ තිරසර සංවර්ධනයක් හා යහ පාලන අරමුණු ළඟා කර ගැනීම සඳහාය. ප්‍රතිග්‍රාහක රටවල තිරසර සංවර්ධනයට හා යහ පාලනයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් 27ක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ යුරෝපා සංගමයේ අවධානය යොමු කෙරේ. මෙම සම්මුතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් අදාළ රාජ්‍ය ආයතනවල සහභාගීත්වයෙන් යුතු ප්‍රධාන අංග හතරක් සහිත යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලදී.

- මානව හිමිකම්
- ශ්‍රමය
- පාලනය
- පරිසරය

## ➢ ලෝක ආර්ථික සංසදය සමග සහයෝගිතාවය

ලෝක ආර්ථික සංසදය යනු ලෝක තත්වය වැඩි දියුණු කිරීම සඳහා කැපවුණු රාජ්‍ය - පුද්ගලික සහයෝගීතාව සඳහා වන ජාත්‍යන්තර සංවිධානයක් වන අතර එය ගෝලීය මූලාරම්භයන් ගැඹුරින් සලකා බලා ඒවා ක්‍රියාවට නංවන ගෝලීය වේදිකාවක් ද වේ. මෙය ශ්‍රී ලංකාව වැනි රටකට සහභාගි වීමට, දායක වීමට හා ඉගෙන ගත හැකි වැදගත් කටයුත්තක් ලෙස ද ජාත්‍යන්තර වශයෙන් රට ස්ථානගත කළ හැකි ඵලදායී වේදිකාවක් ලෙස ද සැලකේ.

### අරමුණු

පහත දැක්වෙන සංකල්ප හරහා ගෝලීය චින්තනයට බලපෑම් කිරීම

- බහු පාර්ශවකරුවන්ගේ සම්බන්ධ වීම
- නවෝත්පාදනය හා තරඟකාරීත්වය
- ගෝලීය පුරවැසියන්ගේ එක්සත් බව
- සිව්වන කාර්මික විප්ලවය හෝ කර්මාන්ත

### අපේක්ෂිත ප්‍රතිඵල

- ලෝක ආර්ථික සංසදය හා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා පරිවර්තන සැලැස්ම උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි භාවිතා කිරීම
- ශ්‍රී ලංකාවේ කර්මාන්තයන්හි තාක්ෂණය ඉහළ නැංවීම සඳහා වන තාක්ෂණික යෙදවුම්
- නවෝත්පාදන හා ව්‍යවසායකත්ව උපායමාර්ගය සකස් කිරීම

2016 ජනවාරි මස ගරු අග්‍රාමාත්‍යවරයා ඩේවොස් සමුළුවට සහභාගී වීමත් සමග ශ්‍රී ලංකාව ලෝක ආර්ථික සංසදයට ප්‍රගාමී ලෙස සම්බන්ධ වීම ඇරඹිණි. ගරු අග්‍රාමාත්‍යවරයා හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා ඇතුළු අමාත්‍යාංශ නියෝජිත මණ්ඩලයට ද ආරාධනා කර තිබූ අතර ඔවුහු 2017 ඩේවොස් සමුළුවට මෙන්ම ඊට පෙර වෙනත් අවස්ථා කිහිපයකට ද සහභාගී වූහ. උදා■ ටියැන්ජින්හි නව ජයග්‍රාහකයන්ගේ වාර්ෂික රැස්වීම (Annual Meeting of New Chamions in Tianjin), චීන, ඉන්දියා ආර්ථික සමුළුව ආදිය.

මෙම කාර්යයේ පුළුල් හා බහු ආංශික ස්වභාවය සැලකිල්ලට ගෙන 2017.05.24 දින පැවැත්වුණු ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් මෙම අමාත්‍යාංශය යටතේ ජාතික කේන්ද්‍රීය කණ්ඩායමක් ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ක්‍රමානුකූල ආකාරයට ලෝක ආර්ථික සංසදයේ කාර්යයන් ප්‍රගාමීව ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ජාතික කේන්ද්‍රීය කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී.

ධනාත්මක ලෙස සංකල්ප අවබෝධ කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ජාතික කේන්ද්‍රීය කණ්ඩායම සම්බන්ධීකරණය හා එහි කටයුතු පසු විපරම් කිරීම සිදු කරනු ලැබේ.

2018 ජනවාරි 16 දින පැවති විශේෂ රැස්වීමේ දී ගරු සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා සහ ජාතික කේන්ද්‍රීය කණ්ඩායමේ නායකයා ලෝක ආර්ථික සංසදයේ නව සභාපති බෝර්ග් බ්‍රෙන්ඩ් මහතා සහ අනෙකුත් නිලධාරීන් මුණ ගැසුණු අතර එහි දී යාවත්කාලීන කිරීම් හුවමාරු කර ගන්නා ලදී.

සමාලෝචිත වර්ෂය තුළ පහත කාර්යයන්වලදී අමාත්‍යාංශය ලෝක ආර්ථික සංසදය සමග සම්බන්ධ විය.

- ශ්‍රී ලංකා පරිවර්තන සැලැස්ම
- නිෂ්පාදනයේ අනාගතය හැඩගැස්වීම පද්ධති මූලාරම්භය
- තිරසර නිෂ්පාදනය වේගවත් කිරීම
- ගෝලීය නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය සඳහා වන මධ්‍යස්ථානය
- අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය පිළිබඳ ලෝක ආර්ථික සංසදය
- ලෝක ආර්ථික සංසදයේ නව ජයග්‍රාහකයන්ගේ වාර්ෂික රැස්වීම
- Multi Country Consolidation යන මැයෙන් වූ වෙළඳ පහසුකරණය පිළිබඳ ගෝලීය සන්ධාන ව්‍යාපෘතිය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තාක්ෂණික යෙදවුම් සහිතව ලෝක ආර්ථික සංසදය මගින් සකස් කරන ලද ශ්‍රී ලංකා පරිවර්තන සැලැස්ම සකස් කර අවසන් කර ඇති අතර දැන් එය මාර්ගගතව ලබා ගත හැකියි සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මෙරට සංචාරය කළ ස්වාධීන අරමුදල් ආයෝජකයන් (Sovereign Wealth Fund investor) කණ්ඩායම් දෙකක් සඳහා කලින් කී ලේඛන (ශ්‍රී ලංකාවේ ආර්ථිකය, අවධානයට ලක් වූ අංශ, අභියෝග ආදිය) සැපයීම සඳහා මෙම පරිවර්තන සැලැස්ම යොදා ගන්නා ලදී.

සැප්තැම්බර් මස මුල් භාගයේ දී සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් ලෝක ආර්ථික සංසදයේ නව ගෝලීය නවෝත්පාදන හා ව්‍යවසායකත්වය සඳහා වන මධ්‍යස්ථානයේ උපායමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානී නතායා අපෙන්ටෙං පිළිගන්නා ලද අතර ඔහු ශ්‍රී ලාංකික තාක්ෂණය හා නව පරිසර පද්ධතිවලට අදාළ අදහස් විමසීම් මාලාවකට සම්බන්ධ වූ අතර නවෝත්පාදනය හා ව්‍යවසායකත්ව උපායමාර්ගය සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරයා ද මුණ ගැසුණි. මෙම සංචාරය හරහා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පරිසර පද්ධතිය අතර සහයෝගීතාව හඳුනා ගන්නා ලද අතර ලෝක ආර්ථික සංසදයේ නව මධ්‍යස්ථානය ස්ථාපිත කළ පසු පසුවිපරම් කටයුතු කිරීමට ද නියමිතය.

2018 සැප්තැම්බර් 11 - 13 දක්වා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් වියට්නාමයේ හැනෝයිහි අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය පිළිබඳ ලෝක ආර්ථික සංසදය වෙත ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සංචාරයට කටයුතු සූදානම් කරන ලදී. මෙම සංසදය සඳහා ආරාධනා ලද අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ සාමාජිකයකු නොවන එකම නායකයා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා වියි තවද ගරු සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර අමාත්‍යවරයා විසින් වියට්නාමයේ පදිංචි ආයෝජකයන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා ඔවුන් සමග රැස්වීම් පවත්වන ලදී.

මෙම අවස්ථාව අතරතුර ගරු අමාත්‍යතුමා විසින් ආසියානු පැසිෆික් කලාපයේ වෙළඳාම හා ආයෝජන වේගවත් කිරීම (Accelerating Trade and Investment in Asia Pacifis) පිළිබඳ සැසිවාරයක දී කතාවක් පවත්වන ලද අතර ශ්‍රී ලංකාවේ දැනට සිදු කෙරෙමින් පවතින ආර්ථික ප්‍රතිසංස්කරණ, වෙළඳ හා ආයෝජන අවස්ථා පිළිබඳ සංසදයට සහභාගිවන්නන්හට අවබෝධයක් ලබා ගැනීම සඳහා වූ නායකයා හමුවන්න (Meet the Leader) යන සැසිවාරයට ද ගරු අමාත්‍යතුමා සහභාගී විය.

ඔක්තෝම්බර් මස වෙළඳ පහසුකරණය පිළිබඳ ගෝලීය සන්ධානය (ලෝක ආර්ථික සංසදය ප්‍රධාන ආයතනික හවුල්කරුවකු වන) මගින් ගරු සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වෙමින් ශ්‍රී ලංකාව තුළ "Multi Country Consolidation" ව්‍යාපෘතිය දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය ලෝක ආර්ථික සංසදයේ විශේෂ ව්‍යාපෘතියක් වන අතර එය ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය (International Chamber of Commerce), ජාත්‍යන්තර පුද්ගලික ව්‍යාපාර සඳහා වන මධ්‍යස්ථානය Centre for International Private Enterprise හා ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, කැනඩාව හා ඕස්ට්‍රේලියාව වැනි ද්වි පාර්ශවික ප්‍රදායකයන්ගේ

## 4.4 දේශීය වෙළඳ ආරක්ෂණය

### ➢ සේවා ලිහිල්කරණය සඳහා නියාමන ක්‍රියාමාර්ග

**අරමුණ**

ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියාවලට අදාළව දැනට පවතින නෛතික හා නියාමන තත්ත්වය සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හා සංශෝධන හඳුනා ගැනීම හා යෝජනා කිරීම.

**ප්‍රතිඵලය**

ශක්තිමත් දේශීය යාන්ත්‍රණ සහිත වෙළඳ පාර්ශවකරුවන් අතර සේවා වෙළඳාම සඳහා පහසුකම් සැලසීම

වෙළඳපළ ප්‍රවේශය ඉහළ නැංවීම හා ආයෝජනයට අවස්ථාවන් වැඩි කිරීම සඳහා උපායමාර්ගයක් ලෙස ද්වි පාර්ශවික, බහු පාර්ශවික හා කලාපීය මට්ටමින් උපායමාර්ගික හවුල්කරුවන් සමග විස්තෘත ආර්ථික සබඳකම් ඇති කර ගැනීම ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තියට ඇතුළත් වේ. ඒ අනුව, වඩා පුළුල් විෂය පථයක් හා නිර්මිතයක් යටතේ තෝරාගත් ආර්ථිකයන් සමග නිදහස් වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම සඳහා රජය විසින් සාකච්ඡා පවත්වන ලදී. අනිවාර්යයෙන්ම මෙම වෙළඳ සාකච්ඡා සේවා වෙළඳාමෙන් ඔබ්බට ගමන් කරන අතර ඒවාට ආයෝජනය හා විද්‍යුත් වාණිජ්‍යය ආදී ක්ෂේත්‍ර ඇතුළත් වේ. දැනට රජය චීනය, ඉන්දියාව හා තායිලන්තය සමග එවැනි නිදහස් වෙළඳ ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා කරමින් සිටින අතර සිංගප්පූරුව සමග වන නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධ කාර්යයන් සම්පූර්ණ කර ඇත.

අපනයන වෙළඳපළ වැඩි දියුණු කිරීම හා ව්‍යාප්ත කිරීම, ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, දේශීය ශ්‍රම බලකාය සඳහා රැකියා අවස්ථා ඇති කිරීම ආදී ප්‍රධාන අරමුණු සහිතව රජය දැනට සිංගප්පූරුව, ඉන්දියාව හා චීනය සමග නිදහස් වෙළඳ ගිවිසුම් ඇතිකර ගැනීම සඳහා සාකච්ඡා කරමින් සිටියි. සාකච්ඡා කරන පාර්ශවයන් අතර සේවා වෙළඳාම සඳහා පහසුකම් සැලසීම පිණිස මෙම නිදහස් වෙළඳ ගිවිසුම්හි සේවා වෙළඳාම පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් වේ.

මෙම ක්‍රියාවලිය අතරතුර පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම් සිදු කෙරුණු අතර එහි දී ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියාමනයෙහි ඌණතාවක් පවතින බවට අදහස් ඉදිරිපත් විය. දේශීය වශයෙන් නියාමන යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන් සේවා වෙළඳාම පිළිබඳ එකඟතාවකට පැමිණීමෙන් පසු දේශීය ශ්‍රම වෙළඳපළ කෙරෙහි හානිකර බලපෑම් එල්ල වනු ඇතැයි ඇතැම් පාර්ශවකරුවන්ගේ අදහස විය. එසේ ම නිශ්චිත විශේෂඥතාවයකින් යුතු සේවකයන් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීමේ මෙන්ම ඉහළ තනතුරු සඳහා මෙරට වෘත්තිකයන් යෙදවීම සඳහා ආයෝජකයන්හට පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය පවතියි.

Mode 4 ස්වාධීන වෘත්තිකයන්ගේ සංචරණයට අදාළව කිසිදු බැඳීමක් ඇති කර නොගැනීමට හෝ ඉඩ ප්‍රස්ථාවක් ලබා නොදීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් වෘත්තීය සේවාවන්ට අදාළව නියාමන ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. මේ සඳහා පත් කරන ලද විශේෂ

කණ්ඩායම විසින් ශ්‍රී ලංකාවේ වර්තමාන නියාමන යාන්ත්‍රණයන්හි පුළුල් විෂය පථයක් හා ස්ථාපිත කිරීමට අවශ්‍ය නියාමන රාමුව ආවරණය කරමින් වෘත්තීය සංගම් හා මණ්ඩලවල අදහස් විමසන ලදී. නිදහස් වෙළඳ ගිවිසුම්වල සන්දර්භයෙහි අවධානයට ලක් වූ කරුණු සඳහා පිළියම් ලබා දීමට වර්තමාන නෛතික/ නියාමන යාන්ත්‍රණය සඳහා වෘත්තීය සංගම්වල යෝජනා පිළිබඳවද මෙහිදී සලකා බැලිණි.

දේශීය නියාමන යාන්ත්‍රණය පිළිබඳ සිදු කරන ලද මූලික අධ්‍යයනයේදී පවතින තත්වය තුළ වන ඌණතාවක් අනාවරණය වූ අතර එමගින් ශ්‍රී ලංකාව වෙත පැමිණෙන විදේශිකයන්ට අදාළව සංවිධිත විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් පැවතීම සඳහා අවශ්‍යතාවක් ලෙස ආගමන හා විගමන නීති සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අවශ්‍ය බව හඳුනා ගැණිනි. මෙයට ව්‍යාපාරික අමුත්තන් මෙන්ම අභ්‍යන්තර සමාගම් පැවරුම්ලාභීන් ද ඇතුළත් වේ. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ද සමග 1948 අංක 20 දරණ ආගමන විගමන පනත සංශෝධනය කිරීම සඳහා 2018.05.30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර එය නෛතික නිෂ්කාශණය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

ජාතික මානව සම්පත් සැලසුම්කරණය පිළිබඳ කේන්ද්‍රීය ආයතනය වන ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් කවුන්සිලය (NHRCSL) ද විදේශ සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. සිදු කළ යුතු නව සංශෝධන හඳුනාගෙන අමාත්‍යාංශය විසින් ස්ථාපිත කරන ලද නියාමන ප්‍රතිසංස්කරණ කමිටුව ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් කවුන්සිල පනතට අවශ්‍ය සංශෝධන කෙටුම්පත් කිරීමේ යෙදී සිටියි. 1997 අංක 18 දරණ ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් කවුන්සිල පනත සඳහා වන සංශෝධන සකස් කර නෛතික නිෂ්කාශණය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

ශ්‍රම වෙළඳපළ තුළ, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිකයන්ට අදාළ ක්‍රියාවලිය සංවිධිත කිරීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම මෙම පැනවීම් මගින් සැකසෙනු ඇත. එමගින් මේවා බලාත්මක වූ පසුව නිදහස් වෙළඳ ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය සඳහා පහසුකම් සැලසෙනු ඇත.

# 5. අපනයන ප්‍රවර්ධන හා අලෙවිකරණ සහාය

## 5.1 අපනයන වර්ධනය සඳහා සහය දැක්වීමට ක්‍රියාත්මක ව්‍යාපෘති

### 5.1.1 බෝට්ටු නිෂ්පාදනය සඳහා වෙන් වූ කර්මාන්ත කලාප ඇති කිරීම

ප්‍රමිතිකරණය හා තත්වය සහතික කිරීම සඳහා ක්‍රමයක් හඳුන්වා දීම ඇතුලුව මෙම කර්මාන්තය සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය රෙගුලාසි හඳුන්වා දීම සහ ජලතීරයට මුහුණලා ත්‍රිකුණාමලය හා කොග්ගල ඒ සඳහා වෙන් වූ කර්මාන්ත කලාප ඇති කිරීම (105 ඡේදය) පිළිබඳ යෝජනාවක් 2018 ජාතික අයවැයට ඇතුළත් විය. 2018 අයවැය මගින් මෙය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 100ක් වෙන් කරන ලදී. ආයෝජන මණ්ඩලය, වරාය හා නාවික කටයුතු අමාත්‍යංශය සහ අදාළ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සහයෝගය සහිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙම අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලදී.

බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය මුහුණපා ඇති ප්‍රධාන ගැටළුවක් වන්නේ ප්‍රමිතිකරණ හා තත්වය සහතික කිරීමේ ක්‍රමයක් නොමැති වීමයි. ධීවර කටයුතු අමාත්‍යංශයෙහි ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ ක්‍රියාපරිපාටියක් පැවතිය ද ධීවර කටයුතු නොවෙන විනෝදස්වාදයට භාවිතා කෙරෙන බෝට්ටු වර්ග ලියාපදිංචි කිරීමේ නිසි ක්‍රමවේදයක් නොමැති

බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය තුළ නිෂ්පාදනය (විශේෂයෙන් මීටර් 20ට වැඩි දිගකින් හා මීටර් 9 හා 12.5 අතර පළලින් යුතු යාත්‍රා), සඳහා යටිතළ පහසුකම් අවම වන අතර නැංගුරම් ලෑම (නැංගුරම් පළ/ නිකේතන වරාය), දියත් කිරීම හා පරීක්ෂා කිරීම (slipways/ launching pads) සඳහා යටිතළ පහසුකම් සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා තටාක පහසුකම් අවම මට්ටමක පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස විශාල යාත්‍රා නිෂ්පාදනය සඳහා ඇණවුම් භාර ගැනීමට හැකි තත්වයක් අපනයනකරුවන්ට නොමැති අතර එමගින් විදේශ ආදායම මෙරටට අහිමි වේ.

මෙම ව්‍යාපෘතිය මගින් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

- ශ්‍රී ලංකාවේ ධීවර කටයුතු සඳහා අදාළ නොවෙන බෝට්ටු නිෂ්පාදනය කිරීමේ හා බෝට්ටු පැදවීමේ කර්මාන්තය සඳහා නියාමන රාමුවක් සකස් කිරීම
- දැනට සිටින එකී බෝට්ටු නිෂ්පාදකයන් සඳහා දියකඩනයක් ඇතුළුව යටිතළ පහසුකම් සංවර්ධනය කිරීම

මේ අතර කොග්ගල ආයෝජන කලාපයෙහි ධීවර කටයුතු සඳහා අදාළ නොවෙන බෝට්ටු නිෂ්පාදකයන් විශේෂයෙන් නිෂ්පාදනය කරන ලද කුඩා බෝට්ටු දියත් කිරීම සඳහා වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තම්බපණ්ණි දිවයින ඉදිරිපස ප්‍රදේශය යොදා ගනිමින් කටයුතු කරනු ඇති.



## 5.1.2 වෙළඳපළ ප්‍රවේශය සඳහා සහාය ලබා දීමේ වැඩසටහන

දැනට වසරකට ඇ.ඩො. 10ට අඩු අපනයන සහිත දේශීය සමාගම් සහ අපනයන වෙළඳපළ වෙත පිවිසීමේ හැකියාවැති නව ප්‍රවේශකයන්හට ගෝලීය අගය දාමය වෙත වඩා හොඳින් ප්‍රවේශ වීම සඳහා සහාය වන වෙළඳ ගැලපුම් වැඩසටහනෙහි කොටසක් ලෙස රු.මි. 800ක අයවැය ප්‍රතිපාදන සහිතව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත අපනයන වෙළඳපළ ප්‍රවේශය සඳහා සහාය ලබා දීමේ යෝජනා ක්‍රමය (90 ඡේදය යටතේ) පිළිබඳ යෝජනාවක් 2018 අයවැය කථාවට ඇතුළත් විය.

පුද්ගලික අංශ නියෝජිතයන්, ලෝක බැංකුව හා අදාළ වෙනත් පාර්ශවකාර සංවිධානවල අදහස් විමසා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහත දැක්වෙන ක්‍රමවේදයන් යටතේ මෙම උපායමාර්ගය ක්‍රියාවට නැංවීමට යෝජනා කරන ලදී.

- වෙළඳපළ ප්‍රවේශය සඳහා සහාය ලබා දීමේ වැඩසටහන - අපනයන වෙළඳපළ තුළ වඩාත් තරගකාරී වීම සඳහා සමාගම් වෙත සහාය ලබා දීම සඳහා
- ව්‍යවසාය නව්‍යකරණ වැඩසටහන - නව නිෂ්පාදන, තාක්ෂණයන් හා ක්‍රියාවලීන් සංවර්ධනය සඳහා සමාගම් වෙත සහාය ලබා දීම සඳහා
- ව්‍යවසායකත්ව මූලාරම්භයන් - ශ්‍රී ලංකාව තුළ නව ව්‍යාපාර හඳුනා ගැනීම හා සහාය ලබා දීම






2018 අගෝස්තු මාසයේ පැවැත්වූ 2000 අපනයනකරුවන්ගේ ජාතික වැඩසටහන ප්‍රවර්ධනය කිරීම

## 5.1.3 බහු ජාතික සහයෝගීතා වැඩසටහන

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ රාජ්‍ය හා රාජ්‍ය අතර (G2G) හෝ රාජ්‍ය හා ව්‍යවසායකයන් අතර (B2B) වැඩසටහන් හරහා ගෝලීය ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් බහු ජාතික සමාගම් තුනක් (3) හෝ පහක් (5) ආකර්ෂණය කර ගැනීමයි. එමගින් ගෝලීය බහු ජාතික සමාගම්හි සැපයුම් දාමයන්ට ඇතුළත් වීමට, හවුල් ව්‍යාපාර ඇති කර ගැනීමට හා ශ්‍රී ලංකාව තුළ සැලසුම් මත පදනම් වූ කාර්යයන් සිදු කරන නිෂ්පාදන කොන්ත්‍රාත් සමාගම් ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලාංකික ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් සමාගම්වලට හැකි වේ. ශ්‍රී ලාංකික විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අංශය ගෝලීය වෙළඳපළ තුළ ස්ථානගත කිරීම සඳහා රජය විසින් ගෝලීය බහු ජාතික සමාගම් වැනි ආයෝජකයන් වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කරනු ලැබේ.

වසර තුනක් තුළ (2018 - 2020 දක්වා) ගෝලීය ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් නිෂ්පාදන බහු ජාතික සමාගම් 3-5ක් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන කර්මාන්තය සඳහා බහු ජාතික සහයෝගීතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස තාක්ෂණ විධායක කමිටුවක් විසින් අදාළ අත්දැකීම් හා නිපුණතා සහිත විදේශ උපදේශකයකු පත් කර ගැනීමට ද නියමිතය.

## 5.1.4 තොරතුරු තාක්ෂණ මූලාරම්භය සිදු කිරීම

විභව්‍යතාව පිළිගනිමින් 2022 වන විට අදාළ අංශය මගින් ඇ.ඩො.මි. 5 අපනයනයන් සිදු කිරීමේ ඉලක්කය ළඟා කර ගැනීමට හා අපනයන වර්ධනය වේගවත් කිරීමේ වැඩසටහනෙහි කොටසක් ලෙස රු.මි. 300ක අයවැය ප්‍රතිපාදන සහිත තොරතුරු තාක්ෂණ මූලාරම්භය යනුවෙන් වන යෝජනාවක් (82 හා 83 ඡේද යටතේ) 2018 අයවැය කථාවට ඇතුළත් විය. 2018 - 2020 අතරතුර තුන් අවුරුදු තොරතුරු තාක්ෂණ මූලාරම්භය සඳහා රජයට රුපියල් මිලියන 1,044.5ක වියදමක් දැරීමට සිදු වනු ඇතැයි ඇස්තමේන්තුගත කර ඇති අතර රු.මි. 300ක මුළු ප්‍රතිපාදනවලින් රු.මි. 155ක් 2018 දී භාවිතා කරනු ඇත.

මෙම වැඩසටහන මගින් සමාගම්වලට ඊළඟ පියවර වෙත ගමන් කිරීම සඳහා සහාය ලබා දෙමින් ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශය සංවර්ධනය සඳහා සහාය ලබා දීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ආයතන ගෝලීය වශයෙන් දැනුවත් කිරීම සහ ඉහළ යමින් පවතින ඉල්ලුමට සරිලන ඉහළ නිපුණතාවක් සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ. මෙම වැඩසටහනට පහත සංරචකයන් ඇතුළත් වේ.

- ජයග්‍රාහකයන් නිර්මාණය කිරීමේ වැඩසටහන හරහා සංවර්ධනයට සමාගම් වෙත සහාය ලබා දීම
- ශක්තිමත් දේශීය සන්නාමකරණ (country branding) උපායමාර්ගයක් හා අලෙවිකරණ සැලැස්මක් හරහා ගෝලීය මට්ටමින් ළඟා වීම
- උසස් අධ්‍යාපන ආයතන සමග සම්බන්ධ වෙමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණයට අදාළ කුසලතා සංවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශයේ වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය
- කලාප තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශයේ ඒකීයා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම, කලාප තුළ නව තවත් තොරතුරු තාක්ෂණ සමාගම් ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය හා යටිතල පහසුකම් සැපයීම
- කලාපීය නව ව්‍යාපාර හඳුනා ගැනීම හා දේශීය වශයෙන් සංවර්ධනය වීමට සහ ගෝලීය වෙළඳපළ වෙත ළඟා වීමට සහාය ලබා දීම

## 5.1.5 වෙළඳ ප්‍රවර්ධන වේදිකාව (Trade Promotional Platform) ස්ථාපිත කිරීම

රු.මි. 25ක ප්‍රතිපාදන සහිත වෙළඳ ප්‍රවර්ධන වේදිකාවක් ස්ථාපිත කිරීම (100 ඡේදය යටතේ) පිළිබඳ යෝජනාවක් 2018 අයවැය කථාවට ඇතුළත් වේ. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මෙම වෙළඳ ප්‍රවර්ධන වේදිකාව පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත එම වගකීම පවරන ලදී.

වෙළඳ ප්‍රවර්ධන වේදිකාවේ මූලික අරමුණ වන්නේ අපනයනකරුවන් හා ගැණුම්කරුවන් අතර හමුවීම් සඳහා පහසුකම් සැලසීමයි. ජාත්‍යන්තර සම්මත භාවිතාවන්ට අනුකූලව වෙබ් අඩවියක් මගින් පරිශීලකයාහට අපනයනකරුවන් හා ගැණුම්කරුවන් සහ සෙවුම් පරාමිතීන්ට ප්‍රතිචාර වශයෙන් කැමැත්තක් දක්වන විෂයන් පිළිබඳ තොරතුරු සපයනු ලැබේ. ව්‍යාපාරික සේවාදායක පිරිසට වඩාත් ආකර්ෂණය වන පරිදි නව අංග ඇතුළත් කරමින් දැනට වෙළඳ ප්‍රවර්ධන වේදිකාවේ සංවර්ධන කටයුතු කෙරෙමින් පවතියි. ශ්‍රී ලාංකික භාණ්ඩ හා සේවාවන් මිළදී ගන්නා අනාගත හෝ වර්තමාන විදේශ සමාගම් සහ අනාගත හෝ වර්තමාන ශ්‍රී ලාංකික අපනයන සමාගම් සඳහා සේවා සැපයීමට මෙම වෙබ් අඩවිය නිර්මාණය කර ඇති එමගින් අපනයන ව්‍යාපාරයට සම්බන්ධ සේවාදායකයන්ගේ විවිධ කොටස් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදු කෙරෙන පිරිනැමීම් පිළිබඳ ප්‍රබල ලෙස සන්නිවේදනය කෙරේ වෙළඳ ප්‍රවර්ධන වේදිකාවට ඇතුළත් කර ඇති ඉලෙක්ට්‍රොනික වෙළඳපළ යනු මාර්ගගතව ශ්‍රී ලාංකික නිෂ්පාදන හා සේවාවන් විකිණීම සහ B2B ගැලපීමට පහසුකම් සැලසීම සඳහා රජය විසින් හඳුන්වා දෙන ලද වේදිකාවකි.

මෙම පෝටලය තුළ ශ්‍රී ලාංකික අපනයනකරුවන් තම හොඳම නිෂ්පාදන ප්‍රදර්ශනය කර ඇති හොඳම අපනයන සමාගම්වල සමාගම් පැතිකඩ හා කැපී පෙනෙන අපනයනකරුවන්ගේ වීඩියෝ පට ද වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර එමගින් ජාත්‍යන්තර ගැණුම්කරුවන්හට හොඳම ව්‍යාපාරික හවුල්කරුවන් හඳුනා ගැනීමට පහසුකම් සැලසේ.

## 5.2 අපනයන සංවර්ධන මණ්ඩලයේ නව ප්‍රවර්ධන උපායමාර්ගය

- ### ජාතික අපනයන උපායමාර්ගය (NES)

ජාතික අපනයන උපායමාර්ගය යනු රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය සහිතව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පෙරමුණ ගන්නා ලද විශේෂ සංවර්ධන ව්‍යාපෘතියක් වන අතර එය ක්‍රියාත්මක කරන ලද්දේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව වන අතර එය ජාතික අපනයන උපායමාර්ගයට අදාළ පාර්ශවකරුවන් සමග දියත් කරන ලදී. අපනයනය සඳහා යොමු වී ඇති වේගයෙන් සංවර්ධනය වන ආසියානු රටවල් සමග සමගාමීව ගමන් කිරීමට දැන් ශ්‍රී ලංකාවට අවස්ථාව සැලසී ඇත.

- ### නවෝත්පාදන හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය

ප්‍රධාන වශයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර උත්ශ්‍රේණිගත කිරීමේ අරමුණ ඇතිව අමාත්‍යාංශය අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව අපනයන තරඟකාරීත්වය සඳහා නවෝත්පාදන හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය පිණිස උපායමාර්ගයක් සකස් කරමින් සිටියි.

ජාතික අපනයන උපායමාර්ගය යටතේ හඳුනා ගත් එක් වෙළඳ සහාය කාර්යයක් වන්නේ නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය වන අතර රාජ්‍ය පුද්ගලික අංශ පාර්ශවකරුවන් සමග උපායමාර්ග සංවර්ධනය කරනු ලැබේ.

- ### අපනයන විවිධාංගීකරණය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිටතට නැඹුරු වූ වර්ධන උපායමාර්ගයක් හරහා නිෂ්පාදන විවිධාංගීකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇති Harvard Kennedy Schoolහි මග පෙන්වීම සහිතව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන (මුද්‍රිත පරිපථ පුවරු, පරිවෘත කම්බි, විද්‍යුත් පුවරු), රබර් පාදක නිෂ්පාදන (මෝටර් රථ උපාංග, වොල්කනයිස් කරන ලද රබර් උපකරණ), තොරතුරු හා සන්නිවේදනය, (IoT), බෝට්ටු නිෂ්පාදනය ආදී අංශ හඳුනා ගෙන ඇතී දැනට අපනයන සංවර්ධන මණ්ඩලය ආයෝජන මණ්ඩලය සමග එක්ව නිෂ්පාදන එකතුව විවිධාංගීකරණය කිරීම සඳහා Sector Experts වැඩසටහන ක්‍රියාත්මක කරයි.

Internet of Things, වොල්කනයිස් කරන ලද වෙනත් උපකරණ, බෝට්ටු නිෂ්පාදනය, ඉලෙක්ට්‍රොනික්, විද්‍යුත්, යන්ත්‍රෝපකරණ, සූර්ය පැනල, මෝටර් රථ උපාංග, ආහාර පිරිසැකසීම, නැව්, සංචාරක කර්මාන්තය හා විවේකය, ඖෂධ හා වෛද්‍ය උපකරණ, ඛණිජ නිෂ්පාදන සහ මුද්‍රිත පරිපථ පුවරු හා නිෂ්පාදන අංශ සඳහා Pitch Books සකස් කෙරේ.

- ### ජාතික තත්ව යටිතල පහසුකම්

ලෝක බැංකුව, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) හා එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ (UNIDO) සහාය ඇතිව 2016 දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික තත්ව ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික තත්ව යටිතළ පහසුකම් උපායමාර්ගය සකස් කෙරිණි.

ජාතික තත්ව ප්‍රතිපත්තියෙහි ආයතනික හා නියාමන රාමුව වැඩි දියුණු කිරීම, ඉලක්ක වෙළඳපළ වෙත අපනයන සිදු කිරීමට හැකි වන පරිදි ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීම සහ ප්‍රමුඛ අපනයන අංශයන්ගේ අවශ්‍යතා සපුරාලීමට සහාය ලබා දීම පිණිස ජාතික තත්ව ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම මෙම උපායමාර්ගයට ඇතුළත් වේ. රාජ්‍ය හා පුද්ගලික පාර්ශවකරුවන්ගෙන් සමන්විත ජාතික තත්ව යටිතළ පහසුකම් පිළිබඳ උපදේශක කමිටුව විසින් උපායමාර්ගයේ දක්වා ඇති ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.

## 5.5 අපනයන කාර්ය සාධනය (2016 - 2018)




2018 වසරේදී වෙළෙඳ කටයුතු සහ සේවාවන් වෙතින් ශ්‍රී ලංකාව ලැබූ විදේශ විනිමය ඉපයුම් 11% කින් වැඩි වී ඇති අතර එය ඇමෙරිකානු ඩොලර් බිලියන 16.2 ක කඩ ඉමක් ලකුණු කර ඇත. 2017 වසරේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 15.1 ක් වූ අතර මෙමගින් 2018 වසරේදී අපනයනවල සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කර ඇත. මෙය ඇමෙරිකානු ඩොලර් බිලියන 17.4 ක් වූ ඉලක්කයෙන් දළ වශයෙන් 93% ක සාක්ෂාත් වීමකි.

2018 වසර සඳහා වෙළෙඳ භාණ්ඩ අපනයන ඉපයුම් ඇමෙරිකානු ඩොලර් බිලියන 11.6 ක් වූ අතර එය පසුගිය වසරේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 11.4 ක් විය. ICT/BPM, ඉදිකිරීම්, මූල්‍ය සේවා, කාර්ය සම්පාදන සහ සුවතා සංචාරක ව්‍යාපාරවල සේවා අපනයනන්ගේ තක්සේරු කිරීම් මගින් එම කාලය තුළ 22% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර එකී වර්ධනය ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5 ක් වෙයි. එමෙන්ම, 2017 වසරට සමාන්තරව, 2018 වසරේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 1 කට වැඩි මාසික වෙළෙඳ භාණ්ඩ අපනයන ඉපයුමක් වාර්තා වී ඇත. මාර්තු මස ඇමෙරිකානු ඩොලර් මිලියන 1,107.7, ජූනි මස ඇමෙරිකානු ඩොලර් මිලියන 1,024.4, ජූලි හා අගෝස්තු ඇමෙරිකානු ඩොලර් මිලියන 1,055.2 නව ජාතික අපනයන උපායමාර්ගය යටතේ සමහර කේන්ද්‍රගත අංශ තුළ ප්‍රබල කාර්ය සාධනයන් දක්නට තිබිණි. විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික සහ විද්‍යුත් අපනයන 16.2% කින් ද ආහාර පාන 22.6% කින්ද වැඩි වී තිබිණී කෙසේ වෙතත්, කුළුබඩු සහ සාන්ද්‍රණ 10.8% කින් ද බෝට්ටු තැනීම 50% කින් ද අඩු වී ඇත. එයට හේතුව වන්නේ එම ඇණවුම් නිෂ්පාදන අඩියරේ පැවතීමයි.









දකුණු ආසියානු කලාපයට සිදු කරන අපනයනයන්ද සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ඇමෙරිකානු ඩොලර් මිලියන 1,097 ක් වශයෙන් 10.12% ක වැඩිවීමකි (2017 වසරේ ඇමෙරිකානු ඩොලර් මිලියන 996 ට සාපේක්ෂව). විශේෂයෙන් ඉන්දියාවට සිදු කළ අපනයනය 2017 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 689.4 ක් වූ අතර එය 11.35% කින් වැඩි වී 2018 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 767.6 ක් වී ඇත. එනමුත් විශේෂයෙන්, බ්‍රෙක්සිට් හඳුන්වාදීමත් සමග මහා බ්‍රිතාන්‍ය පවුම සහ පරිභෝජන වෙළඳපොළ අවප්‍රමාණය වීම නිසා එක්සත් ජනපදයට සිදු කළ අපනයනයන් 5.15% කින් අඩුවී ඇත.

## අපනයන කාර්ය සාධනය - 2018 සහ නිෂ්පාදන සහ සේවා අනුව අපනයන ඉලක්ක (ඇ. ඩො. මි.)

| | 2018 ඉලක්කය | 2017 ජන -දෙසැ | 2018 ජන -දෙසැ | % සාක්ෂාත් කරගැනීම | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඇඟලුම් | 5,200 | 5,015 | 5,300 | 101.92 | 5,980 | 6,877 | 7,565 | 8,321 | 9,153 | 10,069 | 11,075 |
| තේ | 1,650 | 1,512 | 1,408 | 85.33 | 1,898 | 2,182 | 2,400 | 2,640 | 2,904 | 3,195 | 3,514 |
| රබර් පදනම් | 1,000 | 874 | 907 | 90.70 | 1,150 | 1,323 | 1,455 | 1,600 | 1,760 | 1,936 | 2,130 |
| දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ | 200 | 266 | 277 | 138.50 | 230 | 265 | 291 | 320 | 352 | 387 | 426 |
| පොල් පදනම් නිෂ්පාදන | 647 | 588 | 588 | 90.88 | 745 | 856 | 942 | 1,036 | 1,140 | 1,254 | 1,379 |
| කුළුබඩු සහ අත්‍යවශ්‍ය තෙල් | 550 | 399 | 356 | 64.73 | 633 | 727 | 800 | 880 | 968 | 1,065 | 1,171 |
| බෝට්ටු තැනීම | 115 | 97 | 26 | 22.61 | 132 | 152 | 167 | 184 | 202 | 223 | 245 |
| ඉලෙක්ට්‍රොනික සහ යන්ත්‍ර සූත්‍ර | 427 | 353 | 410 | 96.02 | 491 | 564 | 649 | 746 | 858 | 987 | 1,135 |
| මුහුදු ආහාර | 375 | 241 | 266 | 70.93 | 431 | 496 | 546 | 600 | 660 | 726 | 799 |
| විසිතුරු මසුන් | 17 | 15 | 16 | 94.12 | 20 | 22 | 25 | 27 | 30 | 33 | 36 |
| එළවළු | 33 | 28 | 29 | 87.88 | 38 | 44 | 48 | 53 | 58 | 64 | 70 |
| පළතුරු | 49 | 42 | 40 | 81.63 | 56 | 65 | 71 | 78 | 86 | 95 | 104 |
| වෙනත් අපනයන බෝග | 144 | 87 | 56 | 38.89 | 165 | 190 | 219 | 251 | 289 | 333 | 382 |
| මල් සහ කොළ | 19 | 16 | 16 | 84.21 | 22 | 25 | 28 | 30 | 33 | 37 | 40 |
| ආහාර පාන | 449 | 294 | 357 | 79.51 | 516 | 593 | 682 | 784 | 902 | 1,037 | 1,193 |
| පෙට්‍රෝලියම් නිෂ්පාදන | 500 | 292 | 374 | 74.80 | 575 | 662 | 728 | 801 | 881 | 969 | 1,065 |
| වෙනත් | 1,745 | 1,132 | 1,085 | 62.18 | 2,006 | 2,308 | 2,469 | 2,644 | 2,818 | 2,994 | 3,180 |
| **මුළු වෙළෙඳ භාණ්ඩ අපනයනය** | 13,120 | 11,360 | 11,641 | 88.73 | 15,088 | 17,351 | 19,085 | 20,995 | 23,094 | 25,404 | 27,944 |
| තොරතුරු තාක්ෂණය/BPM | 1,312 | 970 | 1,312 | 100.00 | 1,660 | 2,007 | 2,097 | 2,181 | 2,258 | 2,324 | 2,376 |
| ඉදිකිරීම් | 85 | 69 | 85 | 100.00 | 94 | 105 | 119 | 134 | 152 | 171 | 194 |
| මූල්‍ය සේවා | 367 | 263 | 367 | 100.00 | 404 | 452 | 511 | 578 | 653 | 738 | 833 |
| ප්‍රවාහන | 2,544 | 2,376 | 2,544 | 100.00 | 2,799 | 3,135 | 3,542 | 4,003 | 4,523 | 5,111 | 5,776 |
| සුවතා සංචාරක කර්මාන්තය | 2 | අ/නො | 193 | 9,650 | 2 | 3 | 3 | 3 | 4 | 4 | 5 |
| **මුළු සේවාවන්** | 4,310 | 3,678 | 4,501 | 104.43 | 4,959 | 5,702 | 6,272 | 6,899 | 7,590 | 8,348 | 9,184 |
| **මුළු වෙළෙඳ භාණ්ඩ සහ සේවාවන්** | 17,430 | 15,038 | 16,142 | 92.61 | 20,047 | 23,053 | 25,357 | 27,894 | 30,684 | 33,752 | 37,128 |

වෙළෙඳපොළ අනුව වෙළෙඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය 2018 ජනවාරි - දෙසැම්බර් (ඇ. ඩො. මි.)

| විස්තරය | 2017 ජන-දෙසැ | 2018 ජන-දෙසැ | % වර්ධනය |
|---|---|---|---|
| එක්සත් ජනපදය | 2,911.46 | 3,075.82 | 5.65 |
| එක්සත් රාජධානිය | 1,035.17 | 981.84 | -5.15 |
| ඉන්දියාව | 689.36 | 767.57 | 11.35 |
| ජර්මනිය | 538.42 | 612.35 | 13.73 |
| ඉතාලිය | 529.37 | 576.92 | 8.98 |
| බෙල්ජියම | 346.63 | 359.21 | 3.63 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 274.14 | 289.63 | 5.65 |
| නෙදර්ලන්තය | 220.39 | 257.16 | 16.68 |
| චීනය | 414.67 | 230.59 | -44.39 |
| ජපානය | 206.96 | 225.22 | 8.82 |
| තුර්කිය | 232.68 | 218.58 | -6.06 |
| කැනඩාව | 208.92 | 209.9 | 0.47 |
| ප්‍රංශය | 190.11 | 197.23 | 3.75 |
| රුසියානු ෆෙඩරේෂණය | 188.40 | 192.14 | 1.99 |
| ඕස්ට්‍රේලියාව | 209.75 | 185.99 | -11.33 |
| වෙනත් | 3,163.58 | 3,260.57 | 3.07 |
| **එකතුව** | 11,360.01 | 11,640.73 | 2.47 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය

# 6 සාමාන්‍ය පරිපාලනය

## 6.1 අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

**සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය (2018.12.31 දිනට)**

| අනු අංකය | තනතුර | සේවය හා ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නිරත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 3 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ක්‍ර.සේ.(විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. (I ශ්‍රේණිය) | 01 | 01 | - |
| 5 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. (Iශ්‍රේණිය) | 01 | 01 | - |
| 6 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. (I ශ්‍රේණිය) | 01 | 01 | - |
| 7 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. (I ශ්‍රේණිය) | 01 | 01 | - |
| 8 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. (I ශ්‍රේණිය) | 01 | 01 | - |
| 9 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී .ලං.ප.සේ. (II /III ශ්‍රේණිය) | 05 | 04 | 01 |
| 11 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. (II /III ශ්‍රේණිය) | 06 | 05 | 01 |
| 12 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. (II /III ශ්‍රේණිය) | 03 | 01 | 02 |
| 13 | සහකාර ලේකම්(මාධ්‍ය) | තාවකාලික | 01 | - | 01 |
| 14 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ.(II /III ශ්‍රේණිය) | 01 | - | 01 |
| 15 | අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ.(II /III ශ්‍රේණිය) | 01 | - | 01 |
| 16 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 01 | 01 | - |
| 17 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. (අධි ශ්‍රේණිය) | 01 | - | 01 |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී.ලං.තො.තා.සේ II පන්තිය | 01 | - | 01 |
| 19 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය (II /III ශ්‍රේණිය) | 01 | - | 01 |
| 20 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ. (I/II/III ශ්‍රේණිය) | 225 | 166 | 59 |
| 21 | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | 01 | 01 | - |
| 22 | වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | 01 | 01 | - |
| 23 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ (I/II/III ශ්‍රේණිය) | 21 | 15 | 06 |
| 24 | රියදුරු | ඒ.රි.සේ (I/II/III/ විශේෂ ශ්‍රේණිය) | 09 | 07 | 02 |
| 25 | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ (I/II/III/ විශේෂ ශ්‍රේණිය) | 08 | 08 | - |
| 26 | කැමරා ක්‍රියාකරු සහායක | තාවකාලික | 01 | 01 | - |
| | **එකතුව** | | 296 | 219 | 77 |

# 6.2 සංවිධාන ව්‍යුහය


ඇමතිතුමා
නියෝජ්‍ය ඇමතිතුමා
ලේකම්
අතිරේක ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම් සහ අධීක්ෂණ)
අධ්‍යක්ෂ (වෙළෙඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම)
සහකාර ලේකම්/සහකාර අධ්‍යක්ෂ/ සහකාර
ලේකම්තුමාගේ සම්. ලේ.
නීති නිලධාරි
අතිරේක ලේකම් (පරිපාලන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සහකාර ලේකම්/සහකාර අධ්‍යක්ෂ
පරිපාලන නිලධාරි
ප්‍රධාන ලිපිකරු
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී

## අභ්‍යන්තර විගණන අංශය

කාර්යාලයේ පවතින සෑම අංශයක්ම රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කරන්නේද යන්න පිළිබඳව අභ්‍යන්තර විගණන අංශය මගින් නිරීක්ෂණය කරනු ලබයි. අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය රැකෙන පරිදි මෙම අංශයේ කටයුතු ලේකම්වරයාගේ ඍජු අධීක්ෂණය යටතට පත්කර ඇත.

### ➢ අභ්‍යන්තර විගණනයේ අරමුණු

- සෑම වර්ෂයක් ආරම්භයේම අභ්‍යන්තර විගණන සැළැස්මක් සකස්කර ඒ අනුව අනුකූලතා විගණනය, කාර්ය සාධන විගණනය, මූල්‍ය විගණනය යනාදී විගණනයන් සිදුකිරීම
- පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගේ ශක්තිමත් බව පිළිබඳව ඇගයීම
- විගණන නිරීක්ෂණ හා යෝජනා වාර්තා කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රගති සමාලෝචනය
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගී වීම
- අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන පැවැත්වීම.

චක්‍රලේක අංක DMA/2009/(1) පරිදි විගණන හා කළමනාකරණ රැස්වීම් තුනක් මේ වන විට පවත්වා ඇති අතර ඒ සෑම රැස්වීමක් සඳහාම අමාත්‍යාංශය යටතේ පවතින අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිළධාරීන්, විගණන නිළධාරීන් මෙන්ම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු නියෝජිතයාවද සම්බන්ධ කරගන්නා ලදී.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේක අංක DMA/2009/(1) පරිදි වර්ෂය ආරම්භයේදී ප්‍රාරම්භක වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලද අතර සෑම කාර්තුවක් අවසානයේදීම අභ්‍යන්තර විගණන වාර්තා එක බැගින් වාර්තා 3 ක් 2018 වර්ෂය සඳහා නිකුත් කර ඇත. ඒ සෑම විගණනයකදීම වර්ෂය ආරම්භයේදී සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැළැස්ම අනුව, අමාත්‍යාංශයේ විවිධ අංශ විසින් රාජකාරී කටයුතු ඉටු කිරීමේදී රජයේ ප්‍රතිපත්ති චක්‍රලේඛ උපදෙස් වලට අනුගත වෙමින් කටයුතු කර ඇතිද යන්න පිළිබඳව, කාර්ය සාධනය ලඟාකරගැනීමේ ප්‍රගතිය පිළිබඳව මෙන්ම මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව පරීක්ෂා කරන ලදී. නිරීක්ෂණය වූ දුර්වලතා පිළිබඳව ආයතන ප්‍රධානියා දැනුවත් කිරීම හා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පසුගිය කාර්තු විගණනයන් සිදු කරන ලදී.

ඇමුණුම 1

| වාර්තාව | ආවරණය කරන ලද විගණන ක්ෂේත්‍ර |
|---|---|
| ප්‍රාරම්භක | • වර්ශය ආරම්භයේදී පිළියෙල කල යුතු වාර්තා සැකසීමේ ප්‍රගතිය<br>• වැටුප් ගෙවීම පිළිබඳව සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම<br>• පසුගිය වසරේ වියදම් පිළිබඳ විග්‍රහය<br>• පුද්ගලික ලිපි ගොනු<br>• බැංකුවෙන් ගෙවන දේපල ණය පිළිබඳ තොරතුරු<br>• පැමිණීම පිටවීම හා නිවාඩු පිළිබඳව අනුගමනය කරන ක්‍රියා පටිපාටිය |
| පළමුවන කාර්තුව | • පරිගණකය මඟින් වැටුප් සකස් කිරීම හා ගෙවීම<br>• පොදු තැන්පත් ගිණුම<br>• බැංකු සැසඳුම්<br>• 2017 වසරේ ගිණුම් පියවීමේ කටයුතු<br>• තැපැල බෙදාහැරීමේ ක්‍රමවේදය<br>• රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම<br>• කාර්යාල ඉඩකඩ පාවිච්චිය හා කාර්යාලයේ කුලී ගිවිසුම<br>• 2017 අවසන් ගිණුම් සැකසීම<br>• විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම<br>• ප්‍රසම්පාදන කටයුතු |
| දෙවන කාර්තුව | • සන්නිරීක්ෂණය<br>• ස්ථාවර වත්කම් හා බඩු වට්ටෝරු ලේඛනය<br>• අග්‍රිම ගිණුම<br>• වාහන නඩත්තුව<br>• වෙළඳ පහසුකම් සැපයීම |
| තුන්වන කාර්තුව | • වැටුප් ලෙජර<br>• වැය ලෙජර<br>• බැංකු සැසඳුම්<br>• වාහන අලූත්වැඩියා කිරීම්<br>• සංවර්ධන කටයුතු<br>• උපදේශක මට්ටමේ නිළධාරීන්ගේ විදේශ ගමන් වියදම් |
| සිවුවන කාර්තුව | • රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම<br>• පොදු තැම්පත් ගිණුම<br>• අක් මුදල් ගිණුම<br>• අත්තිකාරම් ලේඛණය<br>• මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම<br>• ගිවිසුම් විමශර්නය<br>• ගබඩා පරීක්ෂාව<br>• ප්‍රසම්පාදනය |

මෙම කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරියක්, කළමණාකරණ සහකාරවරයන් දෙදෙනෙක් හා සංවර්ධන නිළධාරිනියක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර ඇත. මීට අමතරව අංශයේ කටයුතු තව දුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් තවත් කළමනාකරණ සහකාර තනතුරක් ඇති කිරීමටත් පවතින අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිළධාරියෙක් බඳවා ගැනීමටත් කටයුතු සිදුකරමින් පවතී.

2018.01.01 සිට 2018.12.31 දක්වා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ/ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා

| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංකය | දිනය | විෂය |
|---|---|---|
| MoDSIT/3/CAB/18/03 | 10/01/2018 | ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් |
| MoDSIT/3/CAB/18/04 | 10/01/2018 | ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමට අත්සන් තැබීම - සම්පූර්ණ කරන ලද ලේඛනය |
| MoDSIT/3/CAB/18/05 | 08/02/2018 | අපනයන සංවර්ධන මණ්ඩලයේ අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා පරිපාලන) පී.කේ. සුමිත්ආරච්චි මහත්මියගේ සේවාවන් වයස අවුරුදු 60න් ඔබ්බට දීර්ඝ කිරීම සඳහා අනුමැතිය |
| MoDSIT/3/CAB/18/06 | 14/02/2018 | ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය<br>කොළඹ වරායේ ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු පර්යන්තය (LNG) සහ පාවෙන ස්වාභාවික වායු පර්යන්තය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා, ඉන්දියා හා ජපාන අස්ථිත්වයන් අතර ත්‍රෛපාර්ශවික අවබෝධතා ගිවිසුම |
| MoDSIT/3/CAB/18/06 | 23/04/2018 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආනයන හා අපනයන පාලක ලෙස ටී.වී. දමයන්ති එස්. කරුණාරත්න මහත්මිය පත් කිරීම |
| MoDSIT/3/CAB/18/08 | 29/03/2018 | ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය<br>ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණයේ ඒකාබද්ධ සංවර්ධනය |
| MoDSIT/3/CAB/18/09 | 28/02/2018 | ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු පර්යන්තයට අදාළ අවබෝධතා ගිවිසුම පිළිබඳ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් |
| MoDSIT/3/CAB/18/10 | 28/02/2018 | කොළඹ බාලදක්ෂ මාවතෙහි (බේරේ වැව හා කොළඹ ශැංග්‍රිලා හෝටලය අතර) පිහිටා ඇති රජය සතු ඉඩමක ක්‍රියාත්මක කිරීම සඳහා M/S Perennial Real Estate Holdings Ltd විසින් ඉදිරිපත් කරන ලද මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති යෝජනාව සංශෝධනය කිරීම |
| MoDSIT/3/CAB/18/11 | 28/02/2018 | බිංගිරිය යෝජිත කාර්මික කලාපය |
| MoDSIT/3/CAB/18/12 | 30/05/2018 | ශ්‍රී ලංකාව සඳහා ජාතික අපනයන උපායමාර්ගය යොදා ගැනීම ( 2018 – 2022) |
| MoDSIT/3/CAB/18/13 | 04/04/2018 | අමාත්‍ය මණ්ඩල සංදේශය<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2016 |
| MoDSIT/3/CAB/18/14 | 22/03/2018 | අතිරේක අයවැය ප්‍රතිපාදන - 2018<br>ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වීසා දීර්ඝ කිරීමේ බාණ්ඩ හා වීසා ක්‍රමයේ අදාළ ගාස්තු සඳහා සංශෝධන හඳුන්වා දීමට නියමිතය. |
| MoDSIT/3/CAB/18/15 | 29/03/2018 | අපනයනය සඳහා සෘජු විදේශ ආයෝජන සහිතව හම්බන්තොට ඛණිජ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම. |

| | | |
|---|---|---|
| MoDSIT/3/CAB/18/16 | 03/04/2018 | ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ඉන්දියාව සමග) පිළිබඳ සාකච්ඡාවල වර්තමාන තත්වය |
| MoDSIT/3/CAB/18/17 | 11/04/2018 | ශ්‍රී ලංකාව තුළ ආයෝජන සේවා සඳහා තනි කවුළු ආයෝජන පහසුකරණ කාර්යා සාධක බලකාය ස්ථාපිත කිරීම. |
| MoDSIT/3/CAB/18/19 | 16/05/2018<br><br>14/05/2018 | ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය<br><br>1948 අංක 20 දරණ ආගමන විගමන පනත යටතේ රැකියා වීසා සඳහා විස්තීර්ණ රෙගුලාසි හඳුන්වා දීම<br><br>1981 අංක 66 දරණ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත් භාර අරමුදල පනතෙහි 3 (2) වගන්තිය සංශෝධනය කිරීම |
| MoDSIT/3/CAB/18/20 | 17/05/2018 | අපනයන වෙළඳපළ ප්‍රවේශ සහාය පිළිබඳ ජාතික අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම. |
| MoDSIT/3/CAB/18/21 | 30/05/2018 | ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම - 2016 |
| MoDSIT/3/CAB/18/22 | 18/06/2018 | ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම පිළිබඳ සාකච්ඡාවල වර්තමාන තත්වය, ඉන්දියාව |
| MoDSIT/3/CAB/18/23 | 18/06/2018 | තායිලන්තය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමෙහි විෂය පථය |
| MoDSIT/3/CAB/18/24 | 20/06/2018 | තායිලන්තය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර උපායමාර්ගික ආර්ථික හවුල්කාරීත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම |
| MoDSIT/3/CAB/18/25 | 29/06/2018 | පරිපාලන සීමාවන් හේතුවෙන් ප්‍රමාද වී ඇති මහා පරිමාණ සෘජු විදේශ ආයෝජන වේගවත් කිරීම |
| MoDSIT/3/CAB/18/26 | 17/08/2018 | ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන කෑම මේස උපකරණ/ මුළුතැන්ගෙයි උපකරණ සෙරමික් ව්‍යාපෘති සඳහා දේශීය අලෙවිය 20% සිට 30%ත් ඉහළ නැංවීම සඳහා වන ඉල්ලීම |
| MoDSIT/3/CAB/18/28 | 08/08/2018 | විශේෂ ප්‍රවේශ සහාය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසාය නව්‍යකරණ වැඩසටහන සඳහා ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම |
| MoDSIT/3/CAB/18/29 | 19/07/2018 | උපායමාර්ග සංවර්ධන ව්‍යාපෘතිහි 3(4) උප වගන්තියට අනුව ගැසට් නිවේදනය සංශෝධනය කිරීම<br><br>2008 අංක 14 දරණ M/S water front properties (privet) Limited පනත |
| MoDSIT/3/CAB/18/30 | 20/07/2018 | අමාත්‍ය මණ්ඩල සංදේශය<br><br>මූලික අයිතිවාසිකම් අයදුම්පත්වලට අදාළ වග උත්තරකරුවන් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් පුද්ගලික නීතිඥ මඩුල්ලේ නීතිඥයකුගේ සේවය ලබා ගැනීම<br><br>SC FR 155/2018, SC FR 155/2018, SC FR 158/2018, SC FR 159/2018 හා SC FR 160/2018 හා SC FR 161/2018 |
| MoDSIT/3/CAB/18/31 | 24/07/2018 | ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව |

| | | |
|---|---|---|
| MoDSIT/3/CAB/18/32 | | ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය<br><br>උසස් අධ්‍යාපනය සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා කැගල්ලෙහි ආයෝජන මණ්ඩලය සතු ඉඩම බදු දීම |
| MoDSIT/3/CAB/18/33 | | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා සඳහා උපදේශකවරයකු පත් කිරීම<br><br>අජිත් ඩේමන් ගුණවර්ධන |
| MoDSIT/3/CAB/18/34 | 30/07/2018 | අවලංගු කරන ලද විදේශ විනිමය පාලන පනත (423 පරිච්ඡේදය) වෙනුවට 2017 අංක 12 දරණ විදේශ විනිමය පාලන පනත 1978 අංක 4 ආයෝජන මණ්ඩල නීතියෙහි ආ පරිශිෂ්ඨයට ඇතුළත් කිරීම සඳහා එම නීතිය සංශෝධනය කිරීම |
| MoDSIT/3/CAB/18/35 | 16/08/2018 | ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා වෙළඳ ගැලපුම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම |
| MoDSIT/3/CAB/18/36 | 16/08/2018 | ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ විවිධ පාර්ශව විසින් එල්ල කරන ලද චෝදනා හා ඊට සම්බන්ධ කරුණු පිළිබඳ අමාත්‍ය මණ්ඩල සටහන් මගින් සිදු කරන ලද පැහැදිලි කිරීම |
| MoDSIT/3/CAB/18/37 | 03/09/2018 | ජාතික IT /BPM අපනයන වර්ධන මූලාරම්භය ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භයක් සඳහා වන ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම |
| MoDSIT/3/CAB/18/38 | 15/10/2018 | ගෝලීය ඉලෙක්ට්‍රොනික සහ විද්‍යුත් යන්ත්‍රසූත්‍ර (EEM) අලෙවිකරුවන් ආකර්ෂණය කරගැනීම සඳහා බහු ජාතික සහයෝගිතා පිවිසුම් වැඩසටහන |
| MoDSIT/3/CAB/18/39 | 27/08/2018 | බෝට්ටු තැනීමේ කර්මාන්තය සඳහා නියාමන රාමුවක් සංවර්ධනය කිරීම සහ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. |
| MoDSIT/3/CAB/18/40 | 23/08/2018 | ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ දේපළ ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සඳහා අනුකලිත ඉ-ඉඩම් ලියාපදිංචි (eLR) කිරීමේ ව්‍යාපෘතිය |
| MoDSIT/3/CAB/18/41 | 23/08/2018 | ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුම් (ETCA) සාකච්ඡාවල වර්තමාන තත්වය |
| MoDSIT/3/CAB/18/42 | 03/09/2018 | නොමිලේ කරන ප්‍රදානයක් ලෙස කොළඹ 2, වෝක්ෂෝල් වීදියේ පර්චස් 136 ක රජයේ ඉඩම ආයෝජන මණ්ඩලයට පැවරීම සහ එම ඉඩමම බද්ධ නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා බදු දීම |
| MDSIT/DEV/Miscellaneous | 03/09/2018 | "රජරට අවදි කරමු" ජනාධිපති වැඩසටහන යටතේ දඹුල්ල හරහා කුරුණෑගල සිට හබරණ දක්වා නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීම සම්බන්ධ නිරීක්ෂණ - "පොළොන්නරුව අවදි කරමු" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2016-2020 - ව්‍යාපෘති යෝජක China State Constructions Engineering Corporation Limited (CSCEC) සමග අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ සාකච්ඡා කමිටුවේ සාකච්ඡා |
| MoDSIT/3/CAB/18/43 | 04/09/2018 | කළුතර, මිල්ලනිය -බණ්ඩාරගම අපනයන සැකසුම් කලාපයක් ස්ථාපිත කිරීම |
| MDSIT/DEV/AD6/DO1/Cabo b | 17/09/2018 | කළුතර රයිගම තාක්ෂණික සංවර්ධන සුපිරි කලාපය ස්ථාපිත කිරීම |
| MDSIT/CAB-0/18/10 | 17/09/2018 | මාලබේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIT) කටයුතු ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ නිරීක්ෂණ |
| MoDSIT/3/CAB/18/44 | 03/10/2018 | බිංගිරිය අපනයන සැකසුම් කලාපයක් ස්ථාපිත කිරීම |
| MoDSIT/3/CAB/18/45 | 21/09/2018 | යාපනයේ ව්‍යාපාර තිඹිරි ගෙය/ප්‍රවර්ධක මධ්‍යස්ථාන සැකසීම් සහ මෙහෙයවීම |
| MDSIT/DEV/AD6/DO1/Cabo b | 01/10/2018 | මීලව නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය |

| | | |
|---|---|---|
| MoDSIT/3/CAB/18/46 | 02/10/2018 | ශ්‍රී ලංකාව සඳහා ජාතික නව්‍යෝත්පාදන සහ ව්‍යවසායක උපායමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (2018-2020) |
| MDSIT/DEV/AD6/Cabob2018 | 10/10/2018 | කාර්මික නගරයක් සඳහා රුක් අත්තන පොල් සහ පශු ගොවිපොළෙන් අක්කර 400 ක් ඉල්ලා සිටීම සම්බන්ධ නිරීක්ෂණ |
| MDSIT/DEV/AD05/INDIA/MOU | 10/10/2018 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර බහාලුම් පර්යන්තය මෙහෙයුම්කරණය සහ සම්පූර්ණ සංවර්ධනය නිරීක්ෂණය |
| MODSIT/03/CAB/18/48 | 17/10/2018 | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය අහෝසි කිරීම |
| MODSIT/03/CAB/18/49 | 10/2018. | ජාතික තනි කවුළුව සඳහා ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කිරීම |
| MoDSIT/3/CAB/18/31/-ii | 25/10/2018 | ජාතික වෙළෙඳ සාකච්ඡා කමිටුවට සංශෝධන |
| MOITIP/03/CAB/18/52 | 19/11/2018 | ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සැකසීම |
| MODSIT/03/CAB/18/52 | 15/10/2018 | සනීපාරක්ෂක තුවා සඳහා ආනයන CESS බද්ද ඉවත් කිරීම |
| MODSIT/03/CAB/18/53 | 22/10/2018 | ආයෝජන මණ්ඩලයේ කාර්ය සාධනයේ විශේෂ අවස්ථා |
| MODSIT/03/CAB/18/58 | 29/11/2018 | ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන විශේෂ යෝජනා |

## ඇමුණුම 3

## ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව වෙත ඉදිරිපත් කළ සටහන්

ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු, අමාත්‍යාංශයේ ආයෝජක ගැටළු සමාලෝචන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද ආයෝජන හා ආයෝජක ගැටළු පිළිබඳ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍යාංශය විසින් කැබිනට් කමිටුව වෙත පත්‍රිකා ගණනාවක් ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | දිනය | ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුවේ සටහන් |
|---|---|---|
| 1 | 02/01/2018 | ආයෝජන වාතාවරණ ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි බුන්වත්භාවය නිරාකරණය කිරීමේ කාර්ය සාධක බලකාය සඳහා නිළ භාරකරුවකු පත් කිරීම |
| 2 | 03/01/2018 | කොළඹ වරායේ ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු පර්යන්තයක් (LNG) ස්ථාපිත කිරීම |
| 4 | 03/01/2018 | කොළඹ වරායේ ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු පර්යන්තයක් (LNG) ස්ථාපිත කිරීම |
| 3 | 08/02/2018 | කොළඹ බාලදක්ෂ මාවතෙහි (බේරේ වැව හා කොළඹ ශැංග්‍රිලා හෝටලය අතර) පිහිටා ඇති රජය සතු ඉඩමක ක්‍රියාත්මක කිරීම සඳහා M/S Perennial Real Estate Holdings Ltd විසින් ඉදිරිපත් කරන ලද මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති යෝජනාව සංශෝධනය කිරීම |
| 5 | 16/02/2018 | M/S RIGID TYRE CORPORATION (PVT) LTD සඳහා බදු සහන කාලය දීර්ඝ කිරීම |
| 6 | 16/02/2018 | වගවත්ත කාර්මික කලාපය, හොරණ Rigid Tyre Corporation (Pvt) Ltd සඳහා පහසුකම් සැලසීම |
| 7 | 16/02/2018 | අපනයනය සඳහා හම්බන්තොට 10MTPA ඛණිජ තෙල් පිරිපහදුවක් සඳහා ආයෝජන යෝජනාව |